CM 33113 (T - 03) (7th Reading)

අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

පරිසර අමාත්‍යාංශය
“සොබාදම් පියස”, 416/C/1, රොබට් ගුණවර්ධන මාවත,
බත්තරමුල්ල

2020

අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

ප්‍රකාශක : පරිසර දූෂණ පාලන හා රසායනික ද්‍රව්‍ය කළමනාකරණ අංශය
පරිසර අමාත්‍යාංශය
“සොබාදම් පියස”, රොබට් ගුණවර්ධන මාවත,
බත්තරමුල්ල

ISBN : 978-955-8395-49-3

මුද්‍රණය : රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අමාත්‍ය මණ්ඩලය විසින් 2019 ඔක්තෝබර් 01 වන දින අනුමත කරන ලදී.

(අමාත්‍ය මණ්ඩල තීරණ අංක අමප/19/2049/104/044-1 – 2019 ඔක්තෝබර් 01)

CM 33113 - 700 (2020/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

පටුන

1. හැඳින්වීම 1
2. යාවත්කාලීන කරන ලද ජාතික ප්‍රතිපත්තියක අවශ්‍යතාව සාධාරණීකරණය 2
3. දැක්ම 4
4. මෙහෙවර 4
5. ඉලක්ක 4
6. අරමුණු 4
7. මූලධර්ම 5
8. ප්‍රතිපත්ති ප්‍රකාශන 6

8.1 සියළු වර්ග වල අපද්‍රව්‍ය ආවරණය කරන්නාවූ පොදු වගන්ති 6

8.2 ඝන, ද්‍රව හා වායුමය අපද්‍රව්‍ය සම්බන්ධ විශේෂිත ප්‍රතිපත්ති ප්‍රකාශන 9

8.2.1ඝන අපද්‍රව්‍ය 9

1. නාගරික ඝන අපද්‍රව්‍ය 9
2. ඇසුරුම් අපද්‍රව්‍ය 13
3. කාර්මික අපද්‍රව්‍ය 13
4. ඉදිකිරීම් සහ කඩා ඉවත් කිරීමේ අපද්‍රව්‍ය 15
5. සෞඛ්‍ය සේවා අපද්‍රව්‍ය 16
6. විද්‍යුත් සහ ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය (e- අපද්‍රව්‍ය) 17
7. විකිරණශීලී (ඝන) අපද්‍රව්‍ය 18
8. සමුද්‍රීය අපද්‍රව්‍ය 18
9. ආහාර, කෘෂිකර්ම සහ පශු සම්පත් අපද්‍රව්‍ය 18

8.2.2 ද්‍රවමය අපද්‍රව්‍ය 19

1. පොදු (සෑම ආකාරයකම ද්‍රව අපද්‍රව්‍ය සඳහා) 19
2. පල්දෝරු 19
3. කාර්මික අපද්‍රව්‍ය, රසායනික අපද්‍රව්‍ය, ක්ෂරිත සහ සේවා මධ්‍යස්ථාන අපවාහ 20

4. පෙට්රෝලියම් අවශේෂ, සෞඛ්‍ය සේවා අපවාහ, කෘෂි රසායනික සහ අනෙකුත් දූෂණකාරක මගින් අපවිත්‍රවීම 20

5. ආහාර පරිහරණ ආයතන සහ මුළුතැන්ගෙයි අපද්‍රව්‍ය (ධූසර ජලය) 20

6. විකිරණශීලී (ද්‍රවමය) අපද්‍රව්‍ය. 21

8.2.3 වායුමය අපද්‍රව්‍ය 21

8.3 දැනුම කළමනාකරණය සහ ධාරිතා ගොඩනැංවීම ආශ්‍රිත ප්‍රතිපත්ති ප්‍රකාශන 22

8.3.1 අධ්‍යාපනය සහ දැනුවත්භාවය ඇති කිරීම 22

8.3.2 නිපුණතා සංවර්ධනය, පුහුණුව, පර්යේෂණ සහ සංවර්ධනය 23

8.3.3 තාක්ෂණය වැඩිදියුණු කිරීම, භාවිතය සහ හුවමාරුව 24

8.3.4 යටිතල පහසුකම් සංවර්ධනය 24

8.3.5 අනෙකුත් සබැඳි ප්‍රතිපත්තීන් හා ජාතික වැඩසටහන් සමග ඒකාබද්ධ වීම 26

8.4 ආයතනික යාන්ත්‍රණය, සම්බන්ධීකරණය සහ සන්නිවේදනය පිළිබඳ ප්‍රතිපත්ති ප්‍රකාශ 27

8.4.1 ජාතික, පළාත් සහ පළාත් පාලන ආයතන මට්ටම් 27

8.4.2 රාජ්‍ය හා පෞද්ගලික අංශ 28

8.4.3 ප්‍රජාව සහ අනෙකුත් රාජ්‍ය නොවන සංවිධාන 28

8.4.4 හවුල්කාරීත්වයන් ගොඩනගා ගැනීම 29

8.4.5 ආපදා අවස්ථාවන්හිදී පිරිසිදු කිරීම සහ අපද්‍රව්‍ය කළමනාකරණය 29

8.5 නියාමනය, ඇගයීම, ප්‍රතිපෝෂණය සහ වාර්තාකරණය සම්බන්ධ ප්‍රතිපත්ති ප්‍රකාශන 29

8.5.1 අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාවලිය/ ක්‍රමවේදයන්හි කාර්යසාධනය 29

8.5.2	අපද්‍රව්‍ය කළමනාකරණ ආයතන සහ අනෙකුත් සේවා සපයන්නන්ගේ කාර්යසාධනය	30
8.5.3	බලාත්මක කිරීමේ ආයතනයන්හි කාර්ය සාධනය	30
8.5.4	පුරවැසියන්ගේ, සිවිල් සංවිධාන, ප්‍රජා සංවිධාන සහ ප්‍රජා නියෝජිතයන්ගේ දායකත්වය සහ තෘප්තිය.	31
8.5.5	සමස්ත රටෙහි පිරිසිදුබව හා සුන්දරත්වය	31
8.6	නෛතික බලාත්මක කිරීමේ යාන්ත්‍රණයන්ට අදාළ ප්‍රතිපත්ති ප්‍රකාශන	32
8.7	මූල්‍ය යාන්ත්‍රණ සහ මූල්‍යමය නොවන දිරිගැන්වීම් සඳහා වන ප්‍රතිපත්ති ප්‍රකාශන	33
8.8	ජාත්‍යන්තර සම්මුතීන් හා ගිවිසුම් හා අනුකූලභාවය සඳහා වන ප්‍රතිපත්ති ප්‍රකාශන	34
8.9	ඉදිරි ක්‍රියාමාර්ග සඳහා ප්‍රතිපත්ති ප්‍රකාශන	34

ඇමුණුම 1 – අපද්‍රව්‍ය කළමනාකරණය කෙරෙහි පාර්ශවකාර ආයතනවල වගකීම් සහ සම්බන්ධතා 36

ඇමුණුම 2 – නිර්වචන 60

අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

බලාත්මක දිනය : 2019 ඔක්තෝබර් 01

1. හැඳින්වීම

වර්තමානයේ සීඝ්‍රයෙන් උග්‍ර බවට හැරෙමින් පවතින අපද්‍රව්‍ය ආශ්‍රිත ගැටලු සැලකිල්ලට ගැනීමේදී සාකල්‍ය අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රතිපත්තියක් සැකසීම අප රටෙහි දැඩි අවශ්‍යතාවක්ව පවතී. මෙම ප්‍රතිපත්ති ලේඛනය එම අවශ්‍යතාව සපුරා ගැනීම අරමුණු කර ගනිමින් සම්පාදිතය. නෛතික වශයෙන් විධිනියෝග ලත් රාජ්‍ය ආයතනවලට, අනෙකුත් සේවා සපයන්නන්ට සහ පෞද්ගලික අංශය ඇතුළු අනෙකුත් සියලුම ආයතනවලට මාර්ගෝපදේශ සපයනු පිණිස කේන්ද්‍රීය ප්‍රතිපත්ති ප්‍රකාශන සහිතව පුළුල් ප්‍රතිපත්ති රාමුවක් තුළ මගපෙන්වීම් ලබා දීම අරමුණු කර ගනිමින් මෙම ප්‍රතිපත්තිය මගින් ඝන, ද්‍රව හා වායුමය අපද්‍රව්‍ය ඇතුළු සියලුම ආකාරයේ අපද්‍රව්‍ය ආවරණය කෙරේ. අපද්‍රව්‍ය කළමනාකරණයෙහිලා ප්‍රජාවෙහි අනිවාර්ය මැදිහත්වීම, අපද්‍රව්‍ය කළමනාකරුවන් විසින් සිය කාර්යභාරය ප්‍රශස්ත මට්ටමේ වගකීමෙන් සහ වගවීමෙන් ඉටු කරනු ලැබීම සනාථ කිරීම සඳහා වූ වැදගත් දායකත්වයක් ලෙස පිළිගැණේ. ව්‍යවස්ථාමය බැඳීම් සැලකිල්ලට ගැනීමේදී, "ස්වභාව ධර්මය සහ ස්වාභාවික සම්පත් රැකගැනීම ශ්‍රී ලංකාවාසී සෑම තැනැත්තකුගේ ම යුතුකම වන්නේ ය".

මෙම සන්දර්භය තුළ, අවශ්‍ය සමාජ පරිවර්තනය ඔස්සේ සමස්ත රටෙහි තිරසර අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වූ ප්‍රශස්ත මට්ටමේ සහයෝගිතාව සහ වගවීම තහවුරු කරනු පිණිස පොදු නමුදු වෙන් කොට හඳුනා ගැනෙන වගකීම නම් වූ මූලධර්මයට අනුගතවීම මෙම ප්‍රතිපත්තිය තුළ දැඩි ලෙස අවධාරණය කෙරේ. එමෙන්ම නිෂ්පාදකයා/ ආනයනකරුවා/ වෙළෙන්දා සහ පාරිභෝගිකයා ඇතුළුව සියලු මට්ටම්වලදී වගකීම් සහගත අපද්‍රව්‍ය කළමනාකරණය තහවුරු කිරීම සඳහා නිෂ්පාදකයාගේ විස්තීර්ණ වූ වගකීම නම් වූ මූලධර්මය ප්‍රායෝගික ලෙස යෙදවීමේ වැදගත්කම ද මෙම ප්‍රතිපත්තියෙන් ඉස්මතු කෙරේ.

ඵලදායී අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වන ජාතික මට්ටමේ කැපවීම එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීම සමග සමීපව බැඳී පවතී. ඒවා නම්, 3වන අරමුණ (නීරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුබසාධනය ප්‍රවර්ධනය කිරීම), 6 වන අරමුණ (සැමට ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබා ගැනීම සහ ඒවායේ තිරසර කළමනාකරණය සහතික කිරීම), 11 වන අරමුණ (නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ

තිරසර ලෙස සකස් කිරීම), 12 වන අරමුණ (තිරසර පරිභෝජන සහ නිෂ්පාදන රටාවන් සහතික කිරීම), 14 වන අරමුණ (තිරසර සංවර්ධනය සඳහා සාගර, මුහුදු සහ සාගර සම්පත් සංරක්ෂණය සහ පිරිමැසුම්දායී භාවිතය), 15 වන අරමුණ (භූගෝලීය පරිසර පද්ධතීන්ගේ තිරසර භාවිතය, තිරසර වනාන්තර කළමනාකරණය, කාන්තාරීකරණයට එරෙහිව ක්‍රියා කිරීම ප්‍රතිස්ථාපනය කර ආරක්ෂා කර ප්‍රවර්ධනය කිරීම, ඉඩම් හායනය නැවැත්වීම සහ පුනරුත්ථාපනය සහ ජෛව විවිධත්ව විනාශය නැවැත්වීම) සහ 8 වන අරමුණ (සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම) වේ. එමෙන්ම දේශගුණික විපර්යාස අවම කිරීම හා අනුහුරු වීම කෙරෙහි වූ ජාතිකව නිර්ණය කළ දායකත්වයන් සහ අනෙකුත් අන්තර්ජාතික පාරිසරික සම්මුතීන් ක්‍රියාවට නැංවීම සඳහා ද පහසුකම් සපයයි.

ශක්තිමත් සම්බන්ධීකරණ සහ වාර්තා කිරීමේ ක්‍රමවේද ඔස්සේ රටපුරා ඵලදායී සම්පත් සංරක්ෂණයක් සහතික කිරීමේ අදහස පෙරදැරිව, අපද්‍රව්‍ය ජනන කාරකය තහවුරුකරණය සඳහා පරිශ්‍ර වශයෙන් කවර ස්ථානයක, කිනම් ආකාරයකට, කොපමණ ප්‍රමාණයකින් අපද්‍රව්‍ය ජනනය වන්නේ ද යන්න තක්සේරු කිරීම අත්‍යවශ්‍ය වේ. මෙම ක්‍රියාවලියේදී සිහි තබාගත යුතු වැදගත් කරුණක් වන්නේ අපද්‍රව්‍ය ජනනය වැළැක්වීම වූ කල්හි සමස්තයක් ලෙස සම්පත් සංරක්ෂණය හැකිතාක් දුරට උපරිම කිරීම සඳහා, අනෙකුත් ආකාරයේ අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමෝපායයන්ට ඔබ්බෙන් මූලික පූර්වාවශ්‍යතාවක් වන බවය.

ප්‍රශස්ත මට්ටමක වගකීමෙන් හා වගවීමෙන් රටෙහි අපද්‍රව්‍ය කළමනාකරණයෙහිලා සියලු පාර්ශ්වකරුවන් විසින් ගනු ලබන තීරණවලට හා පරිවයන්ට මග පෙන්වන මනා නෛතික යාන්ත්‍රණයක් සහිත ශක්තිමත් හා පරිපූර්ණ ජාතික ප්‍රතිපත්තියක අවශ්‍යතාව මෙම සියලු සාධක මගින් පෙන්වා දෙයි.

2. යාවත්කාලීන කරන ලද ජාතික ප්‍රතිපත්තියක අවශ්‍යතාව සාධාරණීකරණය

පරිසර අමාත්‍යාංශය විසින් නාගරික අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වැඩි අවධානයක් යොමු කරමින්, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා පහසුකම් සැපයීමේ අරමුණ ඇතිව 2000 වර්ෂයේදී, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික උපාය මාර්ගය ද 2007 වර්ෂයේදී, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් ද සකස් කරන ලදි. එසේ වුවත් විවිධ නියෝජිතායතන විවිධ ආකාරයේ අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරකම් සාර්ථක සහ අසාර්ථකතා ඇතිව ක්‍රියාවට නංවයි. අසාර්ථකත්වයන් බොහෝවිට සිදු වන්නේ එකඟ වූ ඒකාබද්ධ අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියක් තුළ, ගැටුම් වලින් තොර අවසන් බැහැරලීමේ පහසුකම් සහිත ප්‍රමාණවත් හා පිළිගත හැකි යටිතල පහසුකම් නොමැති වීම හේතුවෙනි.

මෙම යාවත්කාලීන ප්‍රතිපත්තිය නිර්මාණය කර ඇත්තේ රටේ පරිපාලන හා කළමනාකරණ ව්‍යුහයන් තුළ සිරස් හා තිරස් මට්ටම් ආවරණය වන පරිදි ප්‍රතිපත්ති සම්පාදකයන් හා ක්‍රියාත්මක කරන්නන් සඳහා වඩාත් සවිස්තරාත්මක, කේන්ද්‍රීය මගපෙන්වීම් ලබා දෙමින් ඒකාබද්ධ අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියක් ස්ථාපනය කිරීම උදෙසාය. මෙය සකස් කිරීමේදී අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් අතීතයේදී මුහුණ පෑ විවිධාකාර අභියෝගයන්, වර්තමානයේ මුහුණපාන අභියෝගයන් හා අනාගතයේදී මුහුණපෑමට අපේක්ෂිත අභියෝගයන් සැලකිල්ලට ගන්නා ලදි. මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා යෝජිත කාල අන්තරය 2030 දක්වා වේ.

විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය, සෞඛ්‍ය සේවා අපද්‍රව්‍ය, ඉදිකිරීම් හා බිඳ හෙලීම් අපද්‍රව්‍ය සහ අනෙකුත් අන්තරායකාරී අපද්‍රව්‍ය යනාදී ප්‍රධාන අපද්‍රව්‍ය කාණ්ඩ කිහිපයක්ම නාගරික ඝන අපද්‍රව්‍යවලට අමතරව ප්‍රමුඛ අවධානයක් ලැබිය යුතු අපද්‍රව්‍ය ලෙස මෙම ප්‍රතිපත්තිය තුළ සලකා ඇත. මේ ආකාරයේ අපද්‍රව්‍ය පිරියම් කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට රජය විසින් මෑත අතීතයේදී නොයෙක් ක්‍රියාමාර්ග ගෙන ඇත. සෞඛ්‍ය සේවා අපද්‍රව්‍ය පිරියම් කිරීමේ පහසුකම් දීප ව්‍යාප්තව ස්ථාපනය කර ඇත. සුදුසු පොකුරුගත කිරීම සහ පිරියම් කළ ඝන, ද්‍රව අපද්‍රව්‍ය බැහැරලීමේ යන්ත්‍රණ වැඩිදියුණු කිරීම හා ස්ථාපනය කිරීම මගින් ඉහත කී පහසුකම් උපයෝජනය කිරීමේ ශක්‍යතා උපරිම කළ යුතු අතර එමගින් සෞඛ්‍ය අංශයේ අවශ්‍යතාව ඉටු කිරීමට ඉඩ ප්‍රස්ථා සැලසේ. මෙම අරමුණ සඳහා විශේෂිත හා අදාළ උප ආංශික ප්‍රතිපත්ති හා උපායමාර්ග ද අත්‍යවශ්‍ය වේ. කෙසේ වුවද අපද්‍රව්‍ය පරිසර හිතකාමී ලෙස දහනය කිරීමෙන් ජනනය වන අළු අන්තරායකාරී අපද්‍රව්‍යක් ලෙස වර්ගීකරණය කොට ඇති බැවින් අන්තරායකාරී අපද්‍රව්‍ය සඳහා වෙන්වූ අවසන් බැහැරලීමේ පහසුකම් අවශ්‍යවේ. දැනට පවතින බැහැරලීමේ පහසුකම් රට තුළ ජනනය වන සියලු අන්තරායකාරී අපද්‍රව්‍ය බැහැරලීම සඳහා ප්‍රමාණවත් නොවේ.

මෙම ප්‍රතිපත්තිය තුළ ආමන්ත්‍රණය කළ යුතු ප්‍රධාන අභියෝගයක් වන්නේ ප්‍රශස්ත මට්ටමක වගකීමෙන් සහ වගවීමෙන් යුතුව අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරකම් අන්තර්ග්‍රහණය, ඒකාබද්ධ කිරීම සහ අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා සමස්තයක් ලෙස පද්ධති දුර්වලතා මැඩ පැවැත්වීමයි. අතීතයේදී සපයන ලද ආකර්ෂණීය බහුවිධ ආධාරක යෙදවුම් බොහෝවිට බණ්ඩිතව, අපේක්ෂිත අයුරින් තිරසරව නොපැවති අතර අරමුදල් නතර වූ විට සහ/හෝ නායකත්වය වෙනස් වූ විට පද්ධතිය කඩා වැටුණි. එයට ප්‍රධාන හේතුව වන්නේ ප්‍රතිපෝෂණය සහිතව තිරසර අධීක්ෂණ, ඇගයීම්, ලේඛනගත කිරීම් හා වාර්තාකරණ පද්ධති නොමැති වීමයි. අපද්‍රව්‍ය කළමනාකරණයෙහිලා විචක්ෂණශීලී තීරණ ගැනීම සඳහා විශ්වසනීය දත්ත සහ නිරතුරුව යාවත්කාලීන වන තොරතුරු නොමැති වීම මෙම පද්ධති දුර්වලතා හේතුවෙන් මුහුණ පෑමට සිදුව ඇති ප්‍රධාන අභියෝගයකි.

එහෙයින් එක් සම්බන්ධීකරණ ආයතනයක් යටතේ විවිධ මට්ටම්වලදී විවිධ පාර්ශ්වකරුවන් සහභාගි වන ප්‍රබල, ස්ථාවර හා තිරසර ජාතික පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා ඝන, ද්‍රව සහ වායුමය අපද්‍රව්‍ය වර්ග ඇතුළත්ව සියලුම ආකාරයේ අපද්‍රව්‍ය ආවරණය වන සුවිශේෂී ජාතික ප්‍රතිපත්ති මාලාවක් මෙම ප්‍රතිපත්තියට ඇතුළත් කරන ලදි. බහුවිධ පාර්ශ්වකරුවන්ගෙ මනා අවබෝධයක් ලැබෙන පරිදි පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා, අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් වන ප්‍රධාන උපායමාර්ග කිහිපයක් සවිස්තරාත්මක ප්‍රතිපත්තියක් ලෙස විශාලිත කරන ලදි. මෙම විශේෂිත ප්‍රතිපත්ති විවිධ මට්ටම්වලදී ඵලදායීව ක්‍රියාවට නැංවීමට පහසුකම් සැපයීම සඳහා ප්‍රධාන ආංශික ආයතන (ඇමුණුම 1) විසින් අවශ්‍ය පරිදි විශේෂිත ආංශික ප්‍රතිපත්ති සහ උපායමාර්ග සකසනු ලැබිය හැකිය. මෙහි අරමුණ වනුයේ පද්ධතිය/පද්ධති පළමු අවස්ථාවේදීම නිවැරදි දිශානතියක පිහිටුවීමත් තිරසර විසඳුම්වලින් බැහැර නොයමින් පද්ධති දුර්වලතා මැඩපැවැත්වීමත්ය.

3. දැක්ම

සියලු දෙනාටම සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් සහ පිවිතුරු පරිසරයක් ලබාදීම උදෙසා තිරසර අපද්‍රව්‍ය කළමනාකරණය.

4. මෙහෙවර

සම්පත් සංරක්ෂණය සහ සංසරණය ප්‍රවර්ධනය මගින් පරිසර හිතකාමී ජාතියක් ගොඩනැගීම.

5. ඉලක්කය

පවරන ලද වගවීමක් සහිතව 2030 දක්වා මධ්‍ය කාලීන හා දීර්ඝ කාලීන තිරසර විසඳුම්වලට අනුකූලව උග්‍ර කෙටි කාලීන අභියෝගවලට පිළියම් යෙදීම සඳහා සියලු ආකාරයේ අපද්‍රව්‍ය ආවරණය වන පරිදි, රටෙහි අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා තර්කානුකූල හා පැහැදිලි, සවිස්තරාත්මක මග පෙන්වීම් ලබා දීම.

6. අරමුණු

6.1 අපද්‍රව්‍ය ජනනය කරන්නන් වශයෙන් ඊට ඔවුන්ගේ ඇති සම්බන්ධයෙහි ප්‍රමාණය මත, අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරකම්වල නිරත වීම සඳහා සියලුම පුරවැසියන් හා ආයතන නෛතිකව වගකිව යුතු බවට පත් කිරීම.

6.2 අනුගතවීමෙන් ඔබ්බට ගොස් අපද්‍රව්‍ය ජනනය වීම වළක්වාලමින් සහ අවම කරමින් තනි තනිව සහ සාමූහිකව අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සඳහා

වගවීමෙහි සහ වගකීමෙහි අවශ්‍යතාව පිළිබඳව පුරවැසියන්, ආයතන, අපද්‍රව්‍ය කළමනාකරුවන් සහ සේවා සපයන්නන් සංවේදී කිරීම.

6.3 වගකීම් සහගත, වගවීමෙන් යුතු සහ තිරසර මෙහෙයුමක් හා නඩත්තුවක් සහතික කරමින් පරිසර හිතකාමී ආකාරයට අපද්‍රව්‍ය පිරියම් කිරීම සහ අවසන් බැහැරලීම සඳහා පහසුකම් සහ යටිතල පහසුකම් පවතින බවට සහතික වීම.

6.4 ජීවන චක්‍රය පුරා ඒවායෙහි සම්පත් උපයෝජන වටිනාකම රඳවා ගනිමින් අපද්‍රව්‍ය අවසන් බැහැරලීම අවම කිරීම සඳහා හැකි සෑම ප්‍රයත්නයක්ම දැරීම.

6.5 පවත්නා අපද්‍රව්‍ය කළමණාකරණ ක්‍රමවේදයන්හි/පරිචයන්හි ඵලදායිතාව හා කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සහ සුදුසු තාක්ෂණය හා පරිචයන් යොදා ගනිමින් අපද්‍රව්‍ය වැළකීම, වැළැක්වීම සහ/හෝ අවම කිරීම සඳහා නව ක්‍රමවේද ප්‍රවර්ධනය කිරීම.

6.6 දැනට පවත්නා උචිත වෙළෙඳපොළවල ඵලදායිතාව හා කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම, උචිත නව්‍ය තාක්ෂණයෙන් සහ සහයෝගිතාවන්ගෙන් සමන්විත නව වෙළෙඳපොළ ප්‍රවර්ධනය කිරීම සහ සාකල්‍ය ඒකාබද්ධ අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමවේද/පරිචයන් සඳහා පහසුකම් සැලසීම.

6.7 මහජන සෞඛ්‍යයට, පරිසරයට හා පරිසර පද්ධතිවලට ඇති අවදානම අඩු කිරීම සහ අපද්‍රව්‍ය කළමනාකරුවන්ගේ වෘත්තීය සෞඛ්‍යය හා සුරක්ෂිතතාව වැඩිදියුණු කිරීම.

6.8 අනුගතවීමෙන් ඔබ්බට ගොස්, අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් වන ජාත්‍යන්තර බැඳීම් ඉටු කිරීම පිණිස ඵලදායී සහයෝගිතා වර්ධනය කිරීම.

7. මූලධර්ම

7.1 සියලු ආකාරයේ අපද්‍රව්‍ය කළමනාකරණයෙහි සහභාගිවීම සඳහා රටෙහි සෑම ආයතනයක්ම සහ පුද්ගලයෙකුම විසින් තමා සතු පොදු නමුදු වෙන් කොට හඳුනාගනු ලබන වගකීමට අනුගතවීම, සියලු දෙනාටම සෞඛ්‍යසම්පන්න ජීවිතයක් සඳහා අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමෙහිලා මූලික පූර්වාවශ්‍යතාවකි.

7.2 සම්පත් උපයෝජ්‍යතාවෙහි සහ අපද්‍රව්‍ය කළමනාකරණයෙහිලා හටගන්නා අවශ්‍යතාව නිසා, විචක්ෂණශීලී වර්යාවකට පහසුකම් සැලසීම සහ එය

බලගැන්වීම සඳහා හරයන් අනුක්‍රමයෙන් සමාජ ක්‍රමයන්ට ඒකරාශී කරන්නා වූ නෛතික ප්‍රතිපාදන අත්‍යවශ්‍ය වේ.

7.3 අපද්‍රව්‍ය කළමනාකරණ ගැටලුවලට පිළියම් යෙදීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග පරිසර හිතකාමී, ජාතික වශයෙන් යෝග්‍ය, සමාජීය වශයෙන් පිළිගැණෙන සහ ආර්ථික වශයෙන් ස්වශක්ත විය යුතුය.

7.4 අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමවේද හැකිතාක් දුරට උචිත තාක්ෂණය සමගින් භාණ්ඩවල සහ ක්‍රියාවලීන්හි ජීවන චක්‍ර කළමනාකරණයට සබැඳෙමින් ශූන්‍ය කසල සංකල්පයට දිශානත විය යුතුය.

7.5 3-R මූලධර්මය සහ එහි දිගුවන් යනාදී දැනට පවතින අන්තර්ජාතික හා ජාතික වශයෙන් පිළිගැනීමට ලක්ව ඇති උචිත අපද්‍රව්‍ය කළමනාකරණ සංකල්ප, සාධනීය හා වගවීමෙන් යුතු සමාජ පරිවර්තනය සඳහා මූලික පූර්වාවශ්‍යතාවක් ලෙස “නැවත සිතීම” අවශ්‍ය වන්නාවූ අපද්‍රව්‍ය වැළකීමේ/වැළැක්වීමේ ප්‍රවේශයන් මත වැඩි අවධාරණයක් සහිතව ක්‍රියාවෙහි යෙදවිය යුතුය.

7.6 තිරසර පරිභෝජනය සහ නිෂ්පාදනය මගින් වත්මන් සහ අනාගත අපද්‍රව්‍ය කළමනාකරණ අභියෝගවලට සාර්ථකව පිළියම් යෙදීමට හැකි වනු ඇත.

7.7 භාණ්ඩ, නිෂ්පාදන ජීවන චක්‍රය පුරා සහ සේවාවන් සැපයීමේදී, “දූෂකයා විසින් ගෙවනු ලැබීමේ මූලධර්මය” සහ “නිෂ්පාදකයාගේ විස්තීර්ණ වූ වගකීම” ඇතුළු වෙළෙඳපොළ පාදක මෙවලම් යොදා ගැනීම සම්පත් සහ ආර්ථික ක්ෂමතාව උපරිම කරන්නා වූ ඵලදායී අපද්‍රව්‍ය කළමනාකරණ මෙවලම් ලෙස පිළිගැනෙනු ඇත.

7.8 අපද්‍රව්‍ය නොමනා කළමනාකරණයෙන් වැළකීම සියල්ලන්ටම ප්‍රීතිමත් ජීවිතයක් උදාකරන්නාවූ පිවිතුරු හා හිතකර පරිසරයකට මග පෙන්වයි.

8. ප්‍රතිපත්ති ප්‍රකාශන

8.1 සියලුම ආකාරයේ අපද්‍රව්‍ය එක්ව ආවරණය කරන්නාවූ පොදු ප්‍රතිපත්ති ප්‍රකාශන

8.1.1 මෙම ප්‍රතිපත්තියෙහි **අපද්‍රව්‍ය** යනුවෙන් හඳුන්වන්නේ තව දුරටත් අවශ්‍ය නොවේයැයි සලකමින් යම්කිසි වේලාවකදී හෝ යම්කිසි ස්ථානයකින් ඉවත්කරනා හෝ ඉවතලන, එහෙයින් සම්පතක් ලෙස භාවිත කළ හැකි

නැතහොත් උපයෝජන වටිනාකමක් නොමැත්තේ නම් පිරියම් කිරීමෙන් පරිසර හිතකාමී ලෙස බැහැර කළ හැකි කිසියම් ද්‍රව්‍යයක් හෝ අතුරුඵලයක් වේ.

8.1.2 රට පුරා අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමවේද වැඩිදියුණු කිරීම සඳහා යෝග්‍ය පරිදි විධාන සහ පාලන තන්ත්‍රය, ආර්ථික මෙවලම් සහ ස්වේච්ඡා දායකත්වය යනාදී බහුවිධ ක්‍රමෝපායයන් යොදා ගත යුතුය.

8.1.3 සම්පත් උපයෝජ්‍යතාව කෙරෙහි ජීවන චක්‍ර චින්තනයකින් යුතු ස්ථීර හා ස්වයං වගකීම් සහිත සමාජයක් ස්ථාපනය කිරීම අරමුණු කර ගනිමින්, අපද්‍රව්‍ය උත්පාදන කාරකය තහවුරුකරණය සඳහා පරිශ්‍ර වශයෙන් කවර ස්ථානයක, කිනම් ආකාරයකට, කොපමණ ප්‍රමාණයකින් අපද්‍රව්‍ය උත්පාදනය වන්නේ ද යන්න දැන ගැනීමට සෙවුම් ක්‍රමයක් සහිත ක්‍රමානුකූල යාන්ත්‍රණ සකස් කළ යුතුය.

8.1.4 අපද්‍රව්‍ය සංයුතිය සහ ප්‍රභවය සහිතව, ජනනය වන අපද්‍රව්‍ය ප්‍රමාණ හඳුනා ගැනීම, තක්සේරු කිරීම සහ වාර්තා කිරීම සඳහා ප්‍රමුඛ ආයතන සහ නියෝජිතායතන විසින් යාන්ත්‍රණ සකස් කළ යුතුය.

8.1.5 අපද්‍රව්‍ය ජනනය වන ස්ථානයේදීම නිසි වේලාවට ඉවත් කිරීම, බැහැරලීම සඳහා යෝග්‍ය යටිතල පහසුකම් ලබාදීම මගින් විවෘත බැහැරලීම් පරිවයන් වැළැක්වීම සඳහා තිරසර යාන්ත්‍රණ සකස් කළ යුතුය.

8.1.6 ක්‍රියාකාරිත්වය සඳහා අවම වශයෙන් අපද්‍රව්‍ය අබණ්ඩ සැපයුමක් අවශ්‍ය වන්නාවූ යටිතල පහසුකම් සැලසුම් කිරීමේදී, දැනට පැවතිය හැකි අවම ජනනය වීම සැලකිල්ලට ගනිමින්, අපද්‍රව්‍ය වැළැක්වීමේ උපායමාර්ගයන්ට බාධාවක් නොවෙමින්, අපද්‍රව්‍ය විධිමත් කළමනාකරණය හේතුකොටගෙන ඇති විය හැකි අපද්‍රව්‍ය ජනනය වීමේ පහළ යෑමේ නැඹුරුතාවන් මෙන්ම ආර්ථික සංවර්ධනය පුළුල්වීම් හේතුකොටගෙන සිදු වන්නා වූ නොවැළැක්විය හැකි ඉහළ යෑමේ නැඹුරුතාවන් උපනති සමබර කරමින්, ප්‍රවේසම්කාරීව එලෙස කටයුතු කළ යුතුය.

8.1.7 අවසාන බැහැර කිරීමට ඇති අපද්‍රව්‍ය ප්‍රමාණය අවම කිරීම සඳහා ජීවන චක්‍රය පුරා සුදුසු අපද්‍රව්‍ය කළමනාකරණ ධුරාවලිය යොදා ගනිමින්, වගකිවයුතු ප්‍රමුඛ ආයතන සහ නියෝජිතායතන විසින් කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දිගු කාලීන උපායමාර්ග හා ක්‍රියාකාරී සැලසුම් සකස් කළ යුතුය.

8.1.8 භාවිතයෙන් ඉවතලන සියලුම ආකාරයේ අපද්‍රව්‍ය මෙරටට ආනයනය කිරීම සපුරා තහනම් වනු ඇත.

8.1.9 අන්තරායකාරී අපද්‍රව්‍ය ජනනය කරන්නන් ඒ පිළිබඳ නිසි සෙවුම්, සටහන් කිරීමේ සහ වාර්තා කිරීමේ ක්‍රම යොදා ගනිමින්, විධිමත්ව අපද්‍රව්‍ය එක්රැස් කිරීම, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම, පිරියම් කිරීම සහ අවසාන බැහැර කිරීම සහතික කිරීමෙහිලා වගකිව යුතුය.

8.1.10 අන්තරායකාරී අන්තර්ගතයන් අවම කිරීමටත් සියලු මට්ටම්වලදී සම්පත් ක්ෂමතාව වැඩිදියුණු කිරීමටත් පිවිතුරු නිෂ්පාදන ශිල්පක්‍රම යොදා ගැනීම ප්‍රවර්ධනය කළ යුතුය.

8.1.11 ප්‍රමුඛ අමාත්‍යාංශ සහ නියෝජිතායතන විසින් ජාතික, පළාත් හා පළාත් පාලන මට්ටමින් භාවිතය සඳහා, සියලුම වර්ගවල අපද්‍රව්‍ය ප්‍රවාහ ආවරණය වන පරිදි සියලුම අපද්‍රව්‍ය අංශයන් සඳහා අවශ්‍ය අවස්ථාවලදී, දැනට පවත්නා මාර්ගෝපදේශ යාවත්කාලීන කිරීම හෝ නව මාර්ගෝපදේශ හඳුන්වාදීම කළ යුතුය.

8.1.12 තැන් තැන්වල කසළ දැමීම, සුපිරිසිදු හා ප්‍රසන්න පරිසරයක් පවත්වා ගනු පිණිස විධිමත් බලාත්මක කිරීමේ යාන්ත්‍රණයක් සහිතව මධ්‍යම පරිසර අධිකාරිය විසින් රට තුළ නෛතිකව තහනම් කළ යුතුය.

8.1.13 සියලු අපද්‍රව්‍ය කළමනාකරණ සේවකයන් සම්බන්ධයෙන් වෘත්තීය සෞඛ්‍ය හා සුරක්ෂිතතා ක්‍රම සකස් කර ක්‍රියාවට නැංවීම සියලුම කර්මාන්ත, අපද්‍රව්‍ය කළමනාකරණ ආයතන, සේවා සපයන්නන් සහ අනෙකුත් ආයතන සඳහා අනිවාර්ය කළ යුතුය.

8.1.14 සියලුම ආකාරයේ කාර්මික අපද්‍රව්‍ය සම්බන්ධයෙන් ජනනය කරන්නන් හට අවදානම් තක්සේරු සැලසුම් හා ආරක්ෂණ පද්ධති ස්ථාපනය කිරීම අනිවාර්ය කළ යුතුය.

8.1.15 කර්මාන්ත හිමිකරුවන්, අපද්‍රව්‍ය කළමනාකරණ ආයතන හා සේවා සපයන්නන් විසින් යෝග්‍ය වගකීම් හා හානි පූර්ණ ක්‍රම ඇතිකිරීම මගින් මහජන ආරක්ෂාව තහවුරු කළ යුතුය.

8.1.16 දිවයින පුරා කාර්යක්ෂම අපද්‍රව්‍ය කළමනාකරණය තහවුරු කිරීම සඳහා ඵලදායී හා තිරසර සම්පත් සවලීකරණ උපායමාර්ග සකස් කළ යුතුය.

8.1.17 සියලු ප්‍රමුඛ පාර්ශ්වකරුවන් විසින් ජාතික ප්‍රතිපත්තියට සමගාමීව උප ආංශික ප්‍රතිපත්ති සකස් කර ක්‍රියාත්මක කිරීම අනිවාර්ය කළ යුතුය.

8.1.18 සියලුම ආකාරයේ අපද්‍රව්‍ය එක්ව ආවරණය කරන්නාවූ මෙම ප්‍රතිපත්ති ප්‍රකාශන, අර්ධ ඝන යන ගති ලක්ෂණ පෙන්නුම් කරන සහ අධි දුස්ස්‍රාවිතාවයෙන් යුතු අර්ධ ඝන අපද්‍රව්‍ය කෙරෙහිද, පරිසර අධිකාරිය විසින් නියම කර ඇති මාර්ගෝපදේශයන්ට අනුකූලව යෝග්‍ය පරිදි අදාළ වේ.

8.1.19 ජාතික ප්‍රතිපත්තියට සමගාමීව අභියෝග හඳුනාගැනීම, උපායමාර්ග හා ක්‍රියාකාරම් සකස්කිරීම මගින් ඇමුණුම 1හි සඳහන් සියලුම නියෝජිතායතන විසින් උපායමාර්ගික ක්‍රියාකාරී සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීම අනිවාර්ය වනු ඇත.

8.2 ඝන, ද්‍රව හා වායුමය අපද්‍රව්‍ය සම්බන්ධ විශේෂිත ප්‍රතිපත්ති ප්‍රකාශ

8.2.1 ඝන අපද්‍රව්‍ය

1. නාගරික ඝන අපද්‍රව්‍ය

(අ) ප්‍රතිපෝෂණ යාන්ත්‍රණ සහිතව ඵලදායීව හා කාර්යක්ෂමව නාගරික ඝන අපද්‍රව්‍ය විධිමත්ව එක්රැස් කිරීම සඳහා පළාත් පාලන ආයතන විසින් නිවාස, ආයතන සහ අනෙකුත් වාණිජ අස්තිත්වයන්ගේ සක්‍රීය සහභාගිත්වය ලබා ගත යුතුය.

(ආ) පළාත් පාලන ආයතන විසින් ප්‍රජා සහභාගිත්වය සහිතව අපද්‍රව්‍ය එකතු කිරීමේ කාල සටහන් සකස් කළ යුතු අතර යම් හෙයකින් කාලයෙහි වෙනසක් හෝ ප්‍රමාදයක් සිදු වන්නේ නම් අපද්‍රව්‍ය තැනින් තැන දැමීම හෝ අවිධිමත්ව බැහැර කිරීම වැළැක්වීම පිණිස ඩිජිටල් තාක්ෂණය හෝ වෙනත් භාවිතයට පහසු ක්‍රමවේදයක් භාවිතා කරමින් ඒ බැව් කල් ඇතිව ප්‍රජාවට දැනුම් දිය යුතුය.

(ඇ) පළාත් පාලන ආයතන විසින් අපද්‍රව්‍ය ජනනය වීම වැළැක්වීම සඳහාත්, හැකිතාක් දුරට ගෘහස්ථ කසළවල උපයෝජ්‍යතා වටිනාකම ඉහළ නැංවීමෙහිලා පහසුකම් සපයනු වස් සුදුසු පරිදි ප්‍රභවයේදී වෙන් කිරීම හා

තවදුරටත් වෙන් කිරීම මගින් ප්‍රභවයේදී අපද්‍රව්‍ය අඩු කිරීම සඳහාත් උපායමාර්ග සකස් කළ යුතුය.

(ඇ) පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය සහ පරිසර අමාත්‍යාංශය විසින් කෘෂිකර්ම අමාත්‍යාංශයෙහි සහ අනෙකුත් පාර්ශවකරුවන්ගේ සහයෝගිත්වය ඇතිව, නාගරික සන අපද්‍රව්‍යවලින් නිපදවන කොම්පෝස්ට් භාවිතය ප්‍රවර්ධනය කිරීම සඳහා විධිමත් තත්ත්ව පාලන ක්‍රම සහ මාර්ගෝපදේශ සහිත වෙළඳපොළ යාන්ත්‍රණයක් සකස් කළ යුතුය.

(ඉ) උත්සව සහ අනෙකුත් විශේෂ අවස්ථා හේතුකොටගෙන හටගන්නා කසළ, පළාත් පාලන ආයතනවල සහයෝගිත්වය ඇතිව කළමනාකරණය කිරීම සඳහා එම උත්සව අවස්ථා සංවිධායකයන් වගකිව යුතු වන අතර අතිරේක මූල්‍ය වියදම් දැරීමේ විධිවිධාන සහිතව උත්සව අවස්ථාවට පෙරාතුව පළාත් පාලන ආයතන සමග උචිත පරිදි ගිවිසුම්වලට එළඹිය යුතුය.

(ඊ) කසළ රඳවන සඳහා යොදා ගන්නා කසළ, ප්‍රතිචක්‍රීයකරණය කළ නොහැකි, කොම්පෝස්ට් බවට පත් කළ නොහැකි සහ අපද්‍රව්‍ය පිරියම් ක්‍රියාවලි මගින් ජනනය වන නිෂ්ක්‍රීය අපද්‍රව්‍යවලට පමණක් සීමා විය යුතුය.

(උ) (1) පළාත් පාලන ආයතන විසින් එක්රැස් කරනු ලබන කසල ප්‍රමාණ හා එහි සංයුතිය සහ ආවරණය කරනු ලබන නිවාස ප්‍රමාණය (2) වාරිකව අපද්‍රව්‍ය අඩු කිරීම, සහ (3) කසළ රඳවන භූමි වෙත බැහැර කිරීමට නියමිත අපද්‍රව්‍ය ප්‍රමාණය යන තොරතුරුවලින් සමන්විත දත්ත සමුදායන් සකස් කර පවත්වා ගෙන යාම සියලු පළාත් පාලන ආයතන සඳහා අනිවාර්ය කළ යුතුය.

(ඌ) කසළ, මල හෝ වෙනත් ද්‍රව්‍ය පරිසර දූෂණය සහ පීඩාවක් ඇති වන ආකාරයට බැහැර නොකරන බවට වග බලා ගැනීම පිණිස, ගබඩා කිරීමේ සහ පිරියම් කිරීමේ පහසුකම් සඳහා පහසු ස්ථාන කලින් කලට ලබා දීම, ඒවායේ වාහන ඇණිය නඩත්තු කිරීම සහ අනෙකුක් සියලු ක්‍රියාමාර්ග සහ පූර්වාරක්ෂක පියවර ගැනීම සඳහා පළාත් පාලන ආයතන වගකිව යුතුය.

එ) පළාත් සභා විසින් පළාත් පාලන ආයතන පොකුරු ගත කිරීම මගින්, කසළ බැහැර කිරීම සඳහා පළාත් පාලන ආයතනවලට සහාය වීම පිණිස ඊට සුදුසු ස්ථාන හඳුනාගෙන සපයා දිය යුතු අතර පරිසර හිතකාමී අන්දමින් අපද්‍රව්‍ය බැහැර කිරීම සහතික කළ යුතුය.

ඒ) අපද්‍රව්‍ය පිරියම් කිරීම සහ පරිසර හිතකාමී අන්දමින් බැහැර කිරීම සඳහා යටිතල පහසුකම් පවතින බව සහතික කිරීම පිණිස ජාතික මට්ටමේදී පළාත්

පාලන ආයතනවලට සහ පළාත් සභාවලට මග පෙන්වීම, සහාය වීම් සහ පහසුකම් සැලසීම සිදු කළ යුතුය.

(ඔ) සම්පත් ප්‍රතිසාධනය උපරිම කිරීම සහ අපද්‍රව්‍ය තැනින් තැන දැමීම සහ අවිධිමත් අන්දමින් බැහැර කිරීම වළක්වාලීම පිණිස, දූෂකයා විසින් ගෙවනු ලැබීමේ මූලධර්මය සහ නිෂ්පාදකයාගේ විස්තීර්ණය වූ වගකීම යන මූලධර්මය අදාළ කර ගැනීම සඳහා උචිත මෙවලම් සහ උපායමාර්ග යොදාගත යුතුය.

(ඕ) ඝාතකාගාර (සත්ත්ව) අපද්‍රව්‍ය සාමාන්‍ය නාගරික අපද්‍රව්‍ය සමග මිශ්‍ර නොකළ යුතු අතර අදාළ පළාත් පාලන ආයතනවල අදහස් විමසා සෞඛ්‍ය සහ පාරිසරික ගැටලු ඇති නොවන ආකාරයෙන් අපද්‍රව්‍ය නිසි පරිදි කළමනාකරණය කිරීම සහ බැහැර කිරීම සඳහා ජනනය කරන්නන් වගකිව යුතුය.

(ක) පළාත් පාලන ආයතන විසින් පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය සහ සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි සහයෝගිත්වය ඇතිව, ගෘහාශ්‍රිත සනීපාරක්ෂක අපද්‍රව්‍ය ආරක්ෂිතව බැහැර කිරීම සඳහා යාන්ත්‍රණයක් සකස් කළ යුතුය.

(ග) නිවාසවල ඉල්ලුම මත ප්‍රමාණයෙන් විශාල අපද්‍රව්‍ය එක්රැස් කිරීම සහ මධ්‍යම පරිසර අධිකාරිය විසින් නියම කර ඇති මාර්ගෝපදේශ අනුව පරිසර හිතකාමී අන්දමින් ආරක්ෂිතව බැහැර කිරීම සඳහා පළාත් පාලන ආයතන විසින් යාන්ත්‍රණ සකස් කළ යුතුය.

(ව) නිවාස, ආයතන, වාණිජ අස්ථිත්ව විසින් මෙන්ම අපද්‍රව්‍ය කළමනාකරණ ආයතන සහ සේවා සපයන්නන් විසින් කිසිම අපද්‍රව්‍යයක් අවිධිමත් ආකාරයෙන් බැහැර නොකරනු ලබන බවට වග බලා ගැනීම පිණිස අපද්‍රව්‍ය සෙවුම් ක්‍රමයක් සකස් කළ යුතුය.

(ශ) පළාත් පාලන ආයතන විසින් තමන් විසින් සපයනු ලබන සේවාවන් පිළිබඳව නිවාස, ආයතන, වාණිජ අස්ථිත්ව, අනෙකුත් අපද්‍රව්‍ය කළමනාකරුවන් සහ සේවා සපයන්නන්ගෙන් ප්‍රතිචාර ලබා ගැනීම පිණිස පරිශීලකමිත්‍ර සන්නිවේදන ආකෘති සකස් කළ යුතු අතර අන්‍යොන්‍ය සහයෝගයෙන් අභියෝගයන්ට පිළියම් යොදන අතරතුර මනා පරිචයන් දිරි ගැන්වීමට ක්‍රියාමාර්ග ගත යුතුය.

(ට) පළාත් පාලන ආයතන විසින් ජාතික ප්‍රතිපත්තියට සමගාමීව පළාත් සභා සමග සහයෝගිත්වයෙන් යුතුව කාර්යසාධන දර්ශක සහිත කාල නිශ්චිත (කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දිගු කාලීන) ක්‍රියාකාරී සැලසුම් සකස් කළ යුතු අතර එම සැලසුම් පළාත් සභාවන්ට සහ පළාත් සභා හා පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශයට යොමු කළ යුතුය.

(ඩ) ප්‍රාදේශීය මට්ටමේ අවශ්‍යතා පදනම් කරගනිමින් අදාළ පළාත් පාලන ආයතනයන් හා සහයෝගිත්වයෙන් යුතුව පළාත් සභාවන් විසින් මෙම ප්‍රතිපත්තියට සමගාමීව ප්‍රධාන සැලසුම් සකස් කළ යුතු අතර අවසාන ප්‍රතිඵල ලබාගැනීම සඳහා මෙම ප්‍රධාන සැලසුම් නිරසාරව ක්‍රියාත්මක කිරීම සඳහා ශක්තිමත් ක්‍රමවේදයක් ස්ථාපනය කළ යුතුය.

(ඛ) පළාත් පාලන ආයතන විසින් සිය කාර්ය සාධනය වාර්ෂිකව පළාත් සභා සහ පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශයට වාර්තා කළ යුතු අතර එම අමාත්‍යාංශය එකී කාර්යසාධනය ඇගයීමට ලක් කර සියලු මට්ටම්වල වගවීම පිළිබිඹු කරන්නාවූ කාර්යසාධනය මත පදනම්ව එම පළාත් පාලන ආයතන ශ්‍රේණිගතකොට රටේ නාගරික අපද්‍රව්‍ය කළමනාකරණයේ තත්ත්වය පිළිබඳව සියලු පුරවැසින් සහ අනෙකුත් පාර්ශවකරුවන් දැනුවත් කිරීම සඳහා එම තොරතුරු ප්‍රසිද්ධියට පත් කළ යුතුය.

(ද) මනා පරිවයන් ආකර්ශනීය දිරි දීමනා සහිතව ප්‍රවර්ධනය කිරීම සඳහා පිළිගැනීමට ලක් කිරීමේ සහ ත්‍යාග ලබාදීමේ ක්‍රමවේද යොදාගත යුතුය.

(න) බාධාවන්ගෙන් තොරව ජනතාවට ඵලදායී හා කාර්යක්ෂම සේවාවක් සැපයීම සහතික කිරීම සඳහා පළාත් පාලන ආයතන විසින් වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂණ පරිවයන්ට අනුගත වෙමින් මනා ශ්‍රම බලකායක් පවත්වාගත යුතුය.

(ය) පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය සහ පළාත් සභා විසින් ශ්‍රම බලකාය ඇතුළුව සියලු අපද්‍රව්‍ය කළමනාකරුවන් සහ සේවා සම්පාදකයන් සඳහා වාරිකව නිපුණතා සංවර්ධනය සහ පුහුණුව අනිවාර්ය කළ යුතුය.

(ර) පුරවැසි සහභාගිත්වය තුළින් ජාතික, පළාත් සභ සහ පළාත් පාලන මට්ටම්වලදී නාගරික අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ සමස්ත ස්වාධීන වාර්ෂික සමාලෝචන සංවිධානය කළ යුතුය.

(ල) පළාත් පාලන ආයතන විසින් මධ්‍යම පරිසර අධිකාරියේ මාර්ගෝපදේශනය සහ තාක්ෂණික සහයෝගය යටතේ කාල ඉලක්ක සහිතව, පවතින කළමනාකරණය නොකරනු ලබන කසල බැහැර කරන බිම් සඳහා යෝග්‍ය පරිදි පුනරුත්ථාපන සහ ප්‍රතිසංස්කරණ සැලසුම් සකස් කළ යුතුය.

2. ඇසුරුම් අපද්‍රව්‍ය

(අ) ඇසුරුම් පිළිබඳ ප්‍රමිති හා ඒ ආශ්‍රිතව ඇති විය හැකි පාරිසරික හා සෞඛ්‍ය අවදානම් පිළිබඳව වඩා පුළුල් ප්‍රචාරණයක් ලබා දෙමින්, අසුරා ඇති නිෂ්පාදනයේ සුරක්ෂිතභාවය, ස්වස්ථතාව සහ පිළිගැනීම සම්බන්ධයෙන් අනිවාර්ය අවශ්‍යතා සඳහා පමණක් ඒවායේ භාවිතය සීමා කරමින් ඇසුරුම් අපද්‍රව්‍ය ජනනය වීම අඩු කිරීම පිණිස ක්‍රියාමාර්ග දිරිමත් කළ යුතුය.

(ආ) පිරියම් කිරීම සහ භාවිතයෙන් පසු අවසන් බැහැර කිරීම අතරතුර දී ඇසුරුම් ද්‍රව්‍යවල පාරිසරික බලපෑම අවම කිරීම පිණිස ඒවා නැවත භාවිතය, ප්‍රතිසාධනය සහ ප්‍රතිචක්‍රීකරණය සඳහා ඉඩ සැලසෙන පරිදි ඇසුරුම් ද්‍රව්‍ය සැලසුම් කිරීම, නිෂ්පාදනය සහ වෙළෙඳාම් කිරීම සිදු කළ යුතුය.

(ඇ) ජීවන චක්‍රය ආවරණය වන පරිදි බලධාරීන් හා කර්මාන්ත විසින් එකඟ වූ ඉලක්ක සහිතව නැවත භාවිතයට සහ/හෝ ප්‍රතිසාධනයට ඵලදායීව පහසුකම් සපයනු පිණිස, භාවිතයට ගත් ඇසුරුම් ආපසු ගැනීම හෝ එකතු කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා "නිෂ්පාදකයාගේ විස්තීර්ණ වූ වගකීම" යටතේ ක්‍රමවේද ස්ථාපනය කළ යුතුය.

(ඈ) ආහාර ඇසුරුම්කරණය සඳහා ප්‍රමිතීන් අනුගමනය අනිවාර්ය කළ යුතුය.

(ඉ) නිමවූ කොම්පෝස්ට් බොහොමයක් අවසානයේදී කාබන් ඩයිඔක්සයිඩ්, ජෛව ස්කන්ධ හා ජලය ලෙස වියෝජනය වනු පිණිස ජෛවහායනීය ඇසුරුම් අපද්‍රව්‍ය භෞතික, රසායනික, තාපජ හෝ ජෛවවිද්‍යාත්මක වියෝජනයට ලක්විය හැකි ස්වභාවයේ අපද්‍රව්‍ය විය යුතුය.

(ඊ) ප්ලාස්ටික් සහ අනෙකුත් දිරාපත් නොවන ඇසුරුම් වෙනුවට හැකි සෑම අවස්ථාවකදී ම පරිසර හිතකාමී ඇසුරුම්කරණය දිරිමත් කළ යුතුය.

(උ) ඇසුරුම් කර්මාන්තයට මග පෙන්වීම සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් ජාතික වශයෙන් උචිත ප්‍රමිති සකස් කළ යුතුය.

3. කාර්මික අපද්‍රව්‍ය

(අ) පරිසර හිතකාමී අන්දමින් ඵලදායී ලෙස ද්‍රව්‍ය, බලශක්තිය, ජලය සහ/හෝ අතුරු නිෂ්පාදන භෞතිකව හුවමාරු කර ගැනීම සම්බන්ධයෙන් තරඟකාරී වාසි සලසා ගැනීම සඳහා සාමූහික ප්‍රවේශයක (කාර්මික සහජීවනය) නිරත වීම පිණිස, සාම්ප්‍රදායිකව වෙන් වූ කර්මාන්ත සඳහා පහසුකම් සැලසිය යුතුය.

(ආ) ශක්තිමත් කාර්යසාධන අධීක්ෂණයක් සහිතව හැකි සෑම අවස්ථාවකදීම, පිරියම් කිරීමේ පොදු පහසුකම් සහිතව කර්මාන්තපුරයන්හි කර්මාන්ත ඒකක පොකුරු ගත කිරීම ප්‍රවර්ධනය කළ යුතුය.

(ඇ) කර්මාන්ත අපද්‍රව්‍ය ගෘහාශ්‍රිත අනෙකුත් අපද්‍රව්‍යවලින් වෙන් කොට එක්රැස් කළ යුතු අතර උපද්‍රවකාරී අපද්‍රව්‍ය රෙගුලාසිවලට අනුකූලව උපද්‍රවකාරී අපද්‍රව්‍ය සඳහා විශේෂ පූර්වාරක්ෂක ක්‍රියාමාර්ග ගත යුතුය.

(ඈ) අපද්‍රව්‍ය පිරියම් කිරීම සහ බැහැර කිරීම සඳහා අධීක්ෂණ හා අපද්‍රව්‍ය සෙවුම් ක්‍රමයක් ඇතුළුව සමස්ත අපද්‍රව්‍ය හැසිරවීම් හා පිරිසැකසුම් තොරතුරු වාර්ෂිකව මධ්‍යම පරිසර අධිකාරිය වෙත ප්‍රකාශයට පත්කිරීම සියලු කර්මාන්ත සඳහා අනිවාර්ය කළ යුතුය.

(ඉ) කර්මාන්ත සඳහා ඵලදායී දත්ත කළමනාකරණ සහ වාර්තාකරණ පද්ධති සහිතව ඵලදායීව අපද්‍රව්‍ය හුවමාරු වැඩසටහන් ප්‍රකාශයට පත් කිරීමට හා ඒ හා සම්බන්ධවීමට පරිශීලක මිත්‍ර පද්ධතියක්/පද්ධති සකස් කළ යුතුය.

(ඊ) කාර්මික ක්‍රියාවලි තුළ අන්තරායකාරී අන්තර්ගතයන් අවම කිරීමට සහ ක්‍රමානුකූල සටහන් කිරීම් හා වාර්තා කිරීම් පද්ධති සහිතව පාරිසරිකව හිතකර අන්දමින් විධිමත්ව අපද්‍රව්‍ය පිරියම් කිරීම සහ බැහැර කිරීම සහතික කිරීම පිණිස විශේෂ පූර්වාරක්ෂක පියවර ගත යුතුය.

(උ) පිරියම් යන්ත්‍රාගාරවල රොන්බොර අන්තරායකාරී අපද්‍රව්‍යයක් ලෙස සැලකිය යුතු අතර අන්තරායකාරී අපද්‍රව්‍ය බැහැර කිරීමේ ස්ථානයකට බැහැර කළ යුතුය.

(ඌ) අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ, ගබඩා කිරීමේ, පිරියම් කිරීමේ සහ අනෙකුත් සුදුසු කළමනාකරණ පහසුකම් සඳහා අවශ්‍ය ඉඩකඩ උචිත පරිදි සැපයීම සඳහාත්, ඔවුන් විසින්ම හෝ අනෙකුත් සේවා සම්පාදකයන් සමග එක්ව සුරක්ෂිතව අපද්‍රව්‍ය බැහැර කරනු ලබන බවට සහතික වීම සඳහාත් කර්මාන්තපුර හිමිකරුවන් වගකිව යුතුය.

(එ) මධ්‍යම පරිසර අධිකාරිය හා සහයෝගිත්වයෙන් යුතුව, කාර්මික අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් කාර්යසාධනය අධීක්ෂණය කිරීම සඳහා කර්මාන්ත විෂය භාර අමාත්‍යාංශය වගකිව යුතු අතර සියලුම පාර්ශ්වකරුවන් පරිසර හිතකාමී අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අභියෝග හඳුනා ගැනීමටත් ඒ සඳහා පහසුකම් සැපයීමටත් වගකිව යුතුය.

(ඒ) කර්මාන්ත විෂය භාර අමාත්‍යාංශය විසින් කාර්මික අපද්‍රව්‍ය කළමනාකරණයේ කාර්යසාධනය පිළිබඳව වාර්තා කළ යුතු අතර ප්‍රතිපෝෂණ යන්ත්‍රණයන්ට ප්‍රවේශය සහිතව වාර්ෂිකව එය ප්‍රකාශයට පත් කළ යුතුය.

(ඔ) කර්මාන්ත විෂය භාර අමාත්‍යාංශය විසින් කාර්මික අපද්‍රව්‍ය පිළිබඳ දත්ත සමුදායන් සකස් කර පවත්වාගෙන යා යුතු අතර වාර්ෂිකව ප්‍රකාශයට පත් කළ යුතුය.

4. ඉදිකිරීම් සහ බිඳ හෙළීම් අපද්‍රව්‍ය

(අ) කිසිදු තැනැත්තකු විසින් රථ වාහන ගමනාගමනයට හෝ මහ ජනතාවට හෝ කාණූ අවහිර වන ආකාරයෙන් ඉදිකිරීම් හා බිඳ හෙළීම් අපද්‍රව්‍ය තැනින් තැන දැමීම හෝ බැහැර කිරීම සිදු නො කළ යුතුය.

(ආ) ඉදිකිරීම් සහ බිඳ හෙළීම් අපද්‍රව්‍ය අනෙකුත් අපද්‍රව්‍යවලින් වෙන් කොට එක්රැස් කළ යුතුය.

(ඇ) භාවිතා කරනු ලැබූ ද්‍රව්‍ය නැවත භාවිතය උපරිම කිරීම පිණිස පරිසර හිතකාමී අන්දමින් ගබඩා කිරීමේ, පිරිසැකසුම් කිරීමේ, නැවත භාවිත කිරීමේ සහ ප්‍රතිචක්‍රීයකරණය කිරීමේ පහසුකම් සඳහා යෝග්‍ය පරිදි රාජ්‍ය, පුද්ගලික, රාජ්‍ය -පුද්ගලික හවුල්කාරිත්ව සහිත යටිතල පහසුකම් ස්ථාපනය කිරීම පිණිස රජය පහසුකම් සලසනු ඇත.

(ඈ) ඉදි කිරීම්, බිඳ හෙළීම් හෝ නැවත සකස් කිරීමේ වැඩ සඳහා අනුමැතිය ලබා ගැනීමට පෙර, අපද්‍රව්‍ය ජනනය කරන්නන් ස්වකීය අපද්‍රව්‍ය කළමනාකරණ සැලසුම් පළාත් පාලන ආයතන වෙත ඉදිරිපත් කළ යුතුය.

(ඉ) සියලු මෙහෙයුම් කටයුතුවලදී ඇති විය හැකි පාරිසරික හා සුරක්ෂිතතා ගැටලුවලට පිළියම් යෙදීමේ සැලසුම් අපද්‍රව්‍ය ජනනය කරන්නන් සහ සේවා සම්පාදකයන් විසින් සකස් කර ක්‍රියාවට නැංවිය යුතුය.

(ඊ) අපද්‍රව්‍ය ජනනය කරන්නන් සහ සේවා සම්පාදකයන් තමන් විසින්ම හෝ කිසියම් වගකිව යුතු නියෝජිතායතනයක් හරහා අදාළ පළාත් පාලන ආයතනවල අදහස් විමසා සියලු සුන්බුන් ඉවත් කිරීම පිණිස සැලසුම් සකස් කොට ක්‍රියාත්මක කළ යුතුය.

(උ) ඉදිකිරීම් සහ බිඳ හෙළීම් අපද්‍රව්‍ය විධිමත් කාල අන්තරයක් තුළ ඉල්ලුම පරිදි එකතු කොට ඉවත් කිරීම සඳහා පළාත් පාලන ආයතන විසින් සැලසුම් සකස් කොට ක්‍රියාත්මක කළ යුතුය.

(ඌ) ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් ද්‍රව්‍ය/නිෂ්පාදන හුවමාරු ක්‍රමයන්ට පහසුකම් සලසනු පිණිස, ඉදිකිරීම් හා බිඳ හෙළීම් ද්‍රව්‍ය/නිෂ්පාදන සම්බන්ධයෙන් මාර්ගෝපදේශ, භාවිත සංග්‍රහ සහ ප්‍රමිති සකස් කළ යුතුය.

(එ) ඉදිකිරීම් සහ බිඳ හෙළීම් අපද්‍රව්‍ය පාරිසරිකව යහපත් ආකාරයකින් කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් වන මාර්ගෝපදේශ මධ්‍යම පරිසර අධිකාරිය විසින් සකස් කළ යුතුය.

5. සෞඛ්‍ය සේවා අපද්‍රව්‍ය

(අ) අපද්‍රව්‍ය කළමනාකරණ පිරිවැය අවම කිරීම සහ සම්පත් උපයෝජන කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීම පිණිස අන්තරායකාරී සහ අන්තරායකාරී නොවන අපද්‍රව්‍ය වෙන වෙනම එකතු කිරීම, පිරියම් කිරීම හා බැහැර කිරීම සිදු කළ යුතුය.

(ආ) යෝග්‍ය පරිදි රෝහල් සහ අනෙකුත් සෞඛ්‍ය සේවා පහසුකම් පොකුරු ගත කිරීම සහ විධිමත් එක්රැස් කිරීමේ ජාලයන් ස්ථාපනය කිරීම මගින් රටෙහි සියලු සෞඛ්‍ය සේවා අපද්‍රව්‍ය පිරියම් කිරීම පිණිස, දැනට පවතින අපද්‍රව්‍ය පිරියම් කිරීමේ පහසුකම්වල ඇති ධාරිතාවයන් උපරිම ආකාරයෙන් යොදා ගනු ලැබිය යුතුය.

(ඇ) ප්‍රමිතීන්ට අනුකූලව, තහවුරු කරන ලද පරීක්ෂණ මගින් විධිමත්ව පිරියම් කිරීමෙන් පසු අන්තරායකාරී නොවන බැවින්, හුමාල ජීවානුහරණ තාක්ෂණයෙන් පිරියම් කරන ලද අපද්‍රව්‍ය, පිරිවැය ඵලදායීතාව උපරිම කරනු පිණිස නාගරික අපද්‍රව්‍ය සමග අවසානයේදී බැහැර කළ යුතුය.

(ඈ) රටෙහි සියලුම රාජ්‍ය හා පුද්ගලික සෞඛ්‍ය සේවා ආයතන/පහසුකම් විසින් තම මෙහෙයුම් පරිමාණය නොසලකා, සායනික අපද්‍රව්‍ය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින්, අදාළ බලධාරීන්ට කාර්යසාධන අධීක්ෂණය සිදු කිරීමේ හැකියාව ඇති වන සේ විධිමත් ලේඛනගත කිරීම් හා වාර්තාකරණ ක්‍රම සහිතව අපද්‍රව්‍ය කළමනාකරණ සැලසුම් සකස් කළ යුතුය.

(ඉ) පිළිකා ප්‍රතිකාර කිරීම්වලදී ජනනය වන අපද්‍රව්‍ය සහ කල් ඉකුත් වූ ඖෂධ අපද්‍රව්‍ය, සුරක්ෂිතව පිරියම් කිරීම සහ බැහැර කිරීම පිණිස විශේෂ පූර්වාරක්ෂක ක්‍රියාමාර්ග ගත යුතුය.

(ඊ) ජනනය වන අපද්‍රව්‍ය ප්‍රමාණය අනුව සෞඛ්‍ය ආයතන විසින් උචිත පරිසර හිතකාමී සහ ආර්ථික වශයෙන් ශක්‍ය තාක්ෂණික ක්‍රම තෝරා ගනු ලැබිය යුතුය.

(උ) රටෙහි පවතින රාජ්‍ය සහ පුද්ගලික සෞඛ්‍ය සේවා ආයතන/පහසුකම් සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් මධ්‍යම පරිසර අධිකාරියේ රෙගුලාසිවලට අනුකූලව, ඝන, ද්‍රව සහ වායුමය සායනික අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව පැහැදිලි සහ පරිශීලනයට පහසු මාර්ගෝපදේශ සකස් කළ යුතුය.

(ඌ) අනෙකුත් අපද්‍රව්‍ය ප්‍රවාහ සමග මිශ්‍රව සායනික අපද්‍රව්‍ය අවිධිමත් අන්දමින් බැහැර කිරීම වැළැක්වීම සඳහා දීප ව්‍යාප්තව අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ ජාල සකස් කළ යුතුය.

(එ) අපද්‍රව්‍ය එක්රැස්කරන්නන් සහ බැහැර කරන්නන්, සෞඛ්‍ය අමාත්‍යාංශය සහ මධ්‍යම පරිසර අධිකාරියට අමතරව පළාත් පාලන ආයතනවල ද ලියාපදිංචි කළ යුතුය.

(ඒ) ආසාදිත සහ සෞඛ්‍ය ආශ්‍රිත අනෙකුත් ප්‍රමාණයෙන් විශාල අපද්‍රව්‍ය පරිසරයට හිතකර අන්දමින් පිරියම් කොට බැහැර කළ යුතුය.

(ඔ) මධ්‍යම පරිසර අධිකාරිය විසින් නියමකර ඇති පාරිසරික ප්‍රමිතීන්ට අනුකූල වීම සඳහා සෞඛ්‍ය ආයතන විසින් සායනික අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කළ යුතුය.

6. විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය (e - අපද්‍රව්‍ය)

(අ) **විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍යවලට** ආවේණික අන්තරායකාරී ලක්ෂණ සැලකිල්ලට ගත් කල විද්‍යුත් සහ ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය, රටෙහි ඒකාබද්ධ සන අපද්‍රව්‍ය කළමනාකරණයෙහි කොටසක් ලෙස සැලකිය යුතුය.

(ආ) **විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික** නිෂ්පාදන නොමනා කළමනාකරණයෙන් ඇති විය හැකි පාරිසරික බලපෑම් සමෝධානය කරමින් ඉලෙක්ට්‍රොනික සාක්ෂරතාව ප්‍රවර්ධනය කිරීම පිණිස ප්‍රමාණාත්මක සහ ගුණාත්මක ඉලක්ක පැනවිය යුතුය.

(ඇ) **විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික** අපද්‍රව්‍ය උත්පාදනය වැළැක්වීම සහ අවම කිරීම පිණිස, නැවත භාවිතයට ගත හැකි පාවිච්චි කරන ලද විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික උපකරණ ආනයනය නියාමනය කළ යුතුය.

(ඈ) යල් පිනූ/ පාවිච්චි කරන ලද නිෂ්පාදන ත්‍යාග, පරිත්‍යාග හෝ වෙනත් කවර හෝ ආකාරයකින් ශ්‍රී ලංකාවට රැගෙන ඒම වළක්වාලීම පිණිස යාන්ත්‍රණ සකස් කළ යුතුය.

(ඉ) අලුත්වැඩියා හා නඩත්තු අංශයෙහි නියුතු අවිධිමත් කණ්ඩායම්වල ධාරිතා වැඩිදියුණු කිරීම සහ විධිමත් කිරීම පිණිස යාන්ත්‍රණයක් ස්ථාපිත කළ යුතුය.

(ඊ) අනෙකුත් අපද්‍රව්‍ය ප්‍රවාහ සමග මිශ්‍ර ව ඇති විද්‍යුත් අපද්‍රව්‍ය අවිධිමත් ලෙස බැහැර කිරීම වළක්වාලීම පිණිස දිවයින පුරා **විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ** ජාල ස්ථාපනය කළ යුතුය.

(උ) ප්‍රතිචක්‍රීයකරණය කළ නොහැකි **විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික** අපද්‍රව්‍ය බැහැර කිරීම පිණිස යටිතල පහසුකම් ලබා දිය යුතුය.

(ඒ) ජීවන චක්‍ර කළමනාකරණය ආවරණය කරමින් පළාත් සහ පළාත් පාලන මට්ටමේදී කාර්යක්ෂම **විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික** අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධති සහතික කිරීම පිණිස සම්පත් මෙහෙයවීමේ උපායමාර්ග සකස් කළ යුතුය.

(ඔ) යල්පිනූ **විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික** අයිතම අවසන් බැහැර කිරීම සම්බන්ධයෙන් ආනයනකරු/ නිෂ්පාදක/නියෝජිත වගකීම දැරිය යුතුය.

7. විකිරණශීලී (ඝන) අපද්‍රව්‍ය

(අ) ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය සහ පරමාණු බලශක්ති නියාමන මණ්ඩලය විසින් සියලු ජනනය කරන්නන් සහ මධ්‍යම පරිසර අධිකාරිය සමග සහයෝගීතාවයෙන් ඝන විකිරණශීලී අපද්‍රව්‍ය කළමනාකරණය කළ යුතුය.

(ආ) විකිරණශීලී අපද්‍රව්‍ය ජනන ප්‍රභවය, හඳුනා ගැනීම සහ ප්‍රවාහනය කිරීම, ගබඩා කිරීම සහ බැහැර කිරීම පිණිස කාර්යසාධනය අධීක්ෂණය සඳහා සටහන් කිරීමේ සහ වාර්තා කිරීමේ පද්ධති සහිතව විධිමත් කළමනාකරණ සැලසුම් සකස් කළ යුතුය.

8. සමුද්‍රීය අපද්‍රව්‍ය

(අ) සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය, මධ්‍යම පරිසර අධිකාරිය, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය විසින් ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානයේ සහ අනෙකුත් අදාළ සම්මුතීන්ට අනුකූලව සමුද්‍රීය අපද්‍රව්‍ය, නැව් මගින් ජනනය වන අපද්‍රව්‍ය හා ධීවර වරාය අපද්‍රව්‍ය ඇතුළුව එහෙත් ඒවාට සීමා නොවී සමුද්‍රීය ආශ්‍රිත අපද්‍රව්‍ය සම්බන්ධයෙන් පරිපූර්ණ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතුය.

(ආ) අදාළ වගකිව යුතු ප්‍රමුඛ නියෝජිතායතන විසින් සමුද්‍රීය අපද්‍රව්‍ය කළමනාකරණයේ කාර්යසාධනය කලින් කලට අධීක්ෂණය කර, ලේඛනගත කර පරිසර අමාත්‍යාංශයට වාර්ෂිකව වාර්තා කළ යුතු අතර පරිසර අමාත්‍යාංශය විසින් සමස්ත කාර්යසාධනය සමාලෝචනය කර වාර්ෂිකව ප්‍රකාශයට පත් කළ යුතුය.

9. ආහාර, කෘෂිකර්ම සහ පශු සම්පත් අපද්‍රව්‍ය

(අ) අවසන් බැහැර කිරීමට නියමිත ආහාර ප්‍රමාණය අවම කිරීමටත් කෘෂිකාර්මික හා පශු සම්පත් අපද්‍රව්‍ය අවම කිරීම සඳහාත් කෘෂිකර්ම, වෙළෙඳ, සංචාරක, පළාත් පාලන, සෞඛ්‍ය, සහ අධ්‍යාපන අමාත්‍යාංශ විසින් අදාළ පාර්ශ්වකරුවන් සමග සහයෝගිත්වයෙන් විස්තීර්ණ උපායමාර්ග හා ක්‍රියාකාරී සැලසුම් සකස් කළ යුතුය.

(ආ) අදාළ වගකිව යුතු ප්‍රමුඛ ආයතන විසින් අපද්‍රව්‍ය කළමනාකරණයේ කාර්යසාධනය කලින් කලට අධීක්ෂණය කර, ලේඛනගත කර පරිසර අමාත්‍යාංශයට වාර්ෂිකව වාර්තා කළ යුතු අතර පරිසර අමාත්‍යාංශය විසින් සමස්ත කාර්යසාධනය සමාලෝචනය කර වාර්ෂිකව ප්‍රකාශයට පත් කළ යුතුය.

8.2.2 ද්‍රව අපද්‍රව්‍ය

1. පොදු (සියලු ආකාරයේ ද්‍රව අපද්‍රව්‍ය ආවරණය කෙරෙන)

අපජලය ජනනය වැළක්වීමේ උපායමාර්ග ප්‍රවර්ධනය සහ අපජලය විධිමත් සහ පරිසර හිතකාමී ලෙස පිරියම් කිරීම හා බැහැර කිරීම සහතික කිරීම සඳහා ගෘහස්ථ, වාණිජ, හෝටල්, ආපනශාලා, කර්මාන්ත, සෞඛ්‍ය, කෘෂිකර්ම හා පශු සම්පත්, වාහන සේවා ස්ථාන, වරාය හා නාවික කටයුතු, බිම් පිරවුම් භූමි සහ අනෙකුත් රාජ්‍ය හා පෞද්ගලික ආයතන යනාදී විවිධ ප්‍රවර්ගයන්ගෙන් අපජලය ජනනය වීම තක්සේරු කිරීම සඳහා ජාතික මට්ටමේ මූලික සමීක්ෂණයක් සිදු කළ යුතුය.

2. පල්දෝරු

(අ) සෞඛ්‍ය හා පාරිසරික ගැටලු වළක්වා ගැනීම සඳහා නිවාස ඇතුළු මල අපද්‍රව්‍ය ජනනය කරන්නන් සියල්ලන්ම විසින් අදාළ පළාත් පාලන ආයතන, ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී /මහජන සෞඛ්‍ය පරීක්ෂක / සෞඛ්‍ය අමාත්‍යාංශය විමසා මල අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වගකීම් දැරිය යුතුය.

(ආ) පළාත් පාලන ආයතන සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී / මහජන සෞඛ්‍ය පරීක්ෂක / සෞඛ්‍ය අමාත්‍යාංශය මහජනතාව සඳහා ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් සැපයීම සහතික කිරීම සඳහා සහ ස්ථානීය නොවන ප්‍රභව ලෙස මල අපද්‍රව්‍ය භූමියට හා ජලයට එකතුවීම වැළැක්වීම සඳහා වගකීම දැරිය යුතුය.

(ඇ) මහජන සෞඛ්‍ය සහ පරිසර ගැටලු ඇතිකරමින් ජලාශ, භූමිය සහ අනෙකුත් සංවේදී පරිසර පද්ධති දූෂණය වීම වැළැක්වීම සඳහා අපජලය බැහැර කිරීම සහ අපජලය කළමනාකරණය කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විසින් ජාතික ජල සම්පාදන සහ ජලාපවාහන මණ්ඩලය සමග සහයෝගිත්වයෙන් මල අපවාහී බැහැර කිරීම් ප්‍රමිති සහ අපජල කළමනාකරණ මාර්ගෝපදේශ සකස් කළ යුතුය.

(ඊ) පිරියම් කිරීමේ පහසුකම්වලින් උත්පාදනය වන මඩිති/රොන්බොර අවසානයේදී පරිසර හිතකාමී ලෙස බැහැර කළ යුතුය.

3. කාර්මික අපද්‍රව්‍ය, රසායනික අපද්‍රව්‍ය, ක්ෂරිත සහ සේවා මධ්‍යස්ථාන අපවාහ

(අ) සියලුම ජනනය කරන්නන් විසින් අදාළ බලධාරීන් විමසා වාර්ෂික කාර්යසාධන අධීක්ෂණ සහ වාර්තා කිරීමේ යාන්ත්‍රණ සහිතව තමන්ගේම කළමනාකරණ සැලසුම් සකස් කර, ක්‍රියාවට නැංවීම සඳහා වගකිව යුතුය.

(ආ) හැකි සෑම අවස්ථාවකදීම ස්ථානීය හෝ බාහිර පොදු අපද්‍රව්‍ය පිරියම් කිරීමේ පහසුකම් දිරිමත් කළ යුතු අතර පොදු පිරියම් කිරීම කළ නොහැකි විටදී ස්ථානීය පිරියම් කිරීම් පහසුකම් අනිවාර්ය කළ යුතුය

(ඇ) අන්තරායකාරී ද්‍රව රසායනික අපද්‍රව්‍ය සැපයුම්කරුවන් සහ සැපයුම් දාමය හරහා රසායනික ද්‍රව්‍ය ධාරිතා මට්ටම් කළමනාකරණයට උචිත යාන්ත්‍රණ හඳුන්වා දිය යුතුය.

4. පෙට්‍රෝලියම් අවශේෂ, සෞඛ්‍ය සේවා අපවාහ, කෘෂිරසායනික සහ අනෙකුත් දූෂණකාරක අපධාවය මගින් දූෂණය

(අ) සියලුම ජනනය කරන්නන් විසින් අදාළ බලධාරීන් විමසා, අපධාවය හේතුවෙන් අපවිත්‍ර වීම වැළැක්වීම සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාකරණ ක්‍රම සහිතව තමන්ගේම කළමනාකරණ සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතුය.

(ආ) රසායනික ද්‍රව්‍ය ධාරිතා මට්ටම් කළමනාකරණය සඳහා, අන්තරායකාරී රසායනික අපද්‍රව්‍ය සැපයුම්කරුවන් සහ සැපයුම් දාමය හරහා උචිත යාන්ත්‍රණ හඳුන්වා දිය යුතුය.

(ඇ) සංවේදී පාරිසරික පද්ධති සහ ස්ථානීය නොවන අපද්‍රව්‍ය සංසටක සහිත ප්‍රදේශ අපවිත්‍රණය වැළැක්වීම පිණිස, ප්‍රභව ලක්ෂ්‍යයන්හි පරිසර හිතකාමී අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් සැලසුම් සකස් කිරීම සඳහා ප්‍රමුඛ ආයතන හා නියෝජිතායතන වගකිව යුතුය.

5. ආහාර පරිහරණ ආයතන සහ මුළුතැන්ගෙයි අපද්‍රව්‍ය (ධූසර ජලය)

(අ) සියලු අපද්‍රව්‍ය ජනනය කරන්නන් විසින් සෞඛ්‍ය සහ පාරිසරික ගැටලු වැළැක්වීම පිණිස ස්වකීය කළමනාකරණ සැලසුම් සකස් කර අදාළ බලධාරීන්ගේ අදහස් විමසා ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතුය.

(ආ) සෞඛ්‍ය සහ පාරිසරික ගැටලු ඇති කරමින් ජලාශ සහ භූමි අපවිත්‍ර වීම් වැළැක්වීම පිණිස උචිත පරිදි ප්‍රමිති සහිතව, සියලු අංශ ආවරණය වන පරිදි, අපද්‍රව්‍ය අවම කිරීමට ප්‍රමුඛතාව ලබා දෙමින් ආහාර සහ කෘෂිකාර්මික අපද්‍රව්‍ය සඳහා මාර්ගෝපදේශ සකස් කළ යුතුය.

6. ද්‍රව විකිරණශීලී අපද්‍රව්‍ය

(අ) පරමාණුක බලශක්ති මණ්ඩලය සහ පරමාණු බලශක්ති නියාමන මණ්ඩලය විසින් සියලු ද්‍රව විකිරණශීලී අපද්‍රව්‍ය ජනනය කරන්නන්, මධ්‍යම පරිසර අධිකාරිය සහ ජාතික ජලසම්පාදන සහ ජලාපවහන මණ්ඩලය සමග සහයෝගිත්වයෙන් යුතුව ද්‍රව විකිරණශීලී අපද්‍රව්‍ය කළමනාකරණය කළ යුතුය.

(ආ) අපද්‍රව්‍ය කළමනාකරණ වාර්ෂික කාර්යසාධනය සඳහා ලේඛනගත කිරීමේ සහ වාර්තාකරණ ක්‍රම සහිතව ද්‍රව විකිරණශීලී අපද්‍රව්‍ය ජනන ප්‍රභවය හඳුනා ගැනීම සහ ඒවා ප්‍රවාහනය කිරීම, ගබඩා කිරීම හා බැහැර කිරීම පිණිස මාර්ගෝපදේශ සහිතව විධිමත් කළමනාකරණ සැලසුම් සකස් කළ යුතුය.

(ඇ) විවිධ ස්ථානීය ප්‍රභව මගින් භූමිය හා ජලය අපවිත්‍රණය ආශ්‍රිත අවදානම් හඳුනාගෙන එලෙස දූෂණය වීම වැළැක්වීම සඳහා එකී අවදානම් කලින් කලට තක්සේරු කළ යුතුය.

8.2.3 වායු අපද්‍රව්‍ය

(අ) වාර්ෂික කාර්යසාධන අධීක්ෂණ සහ වාර්තාකරණ ක්‍රමවේද සහිතව කාර්මික, වාහන, නැව්, සමුද්‍රීය සහ ධීවර, දාහක, කසළ රඳවන, පූනික ටැංකි සහ අනෙකුත් පල්දෝරු පිරියම් යන්ත්‍රාගාර ආවරණය කරමින්, පිරිසිදු වායු 2016 - 2025 ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව තමන්ගේම උපාය මාර්ග සහ ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම සඳහා සියලු වායු අපද්‍රව්‍ය ජනනය කරන්නන් වගකිව යුතුය.

(ආ) සෞඛය සහ පාරිසරික ගැටලු වැළැක්වීම පිණිස විවෘත දහනය සහ ගෘහස්ථ වායු දූෂණය වැළැක්වීම හෝ අවම කිරීම කළ යුතුය.

(ඇ) දේශසීමා හරහා සිදුවන වායු දූෂණයට පිළියම් යෙදීම සඳහා කලාපීය සහයෝගීතාව ලබා ගැනීම සඳහා යාන්ත්‍රණ ස්ථාපනය කළ යුතුය.

(ඈ) සැලකිය යුතු විමෝචන මූලාශ්‍ර අඛණ්ඩව පවත්නා අවදානම් ප්‍රදේශවල සහ ප්‍රධාන ස්ථානවල අවට වායු තත්ත්වය සටහන් කිරීමට සහ වාර්තා කිරීමට යාන්ත්‍රණ ස්ථාපනය කළ යුතුය.

(ඉ) පිරිසිදු වායු 2016 - 2025 ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් වී නොමැති ප්‍රභව ආවරණය කරන්නා වූ අතිරේක තොරතුරු ද සහිතව, වාර්ෂික සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ සමස්ත කාර්ය සාධනය පරිසර අමාත්‍යාංශය විසින් ලේඛනගත කිරීම සහ වාර්තා කිරීම සිදු කළ යුතුය.

(ඊ) අවට වායු තත්ත්ව මට්ටම් සැලකිල්ලට ගනිමින් ජංගම සහ ස්ථාවර ප්‍රභව ඇතුළුව කර්මාන්ත විමෝචනවල වායු අපද්‍රව්‍ය විමෝචනය සම්බන්ධයෙන් මධ්‍යම පරිසර අධිකාරිය විසින් ප්‍රමිති සකස් කොට බලාත්මක කළ යුතුය.

(උ) වායු දූෂකවල විමෝචන අඩු කරන්නා වූ තාක්ෂණික ක්‍රම යොදා ගැනීම පිණිස කර්මාන්ත උනන්දු කිරීම සඳහා මූල්‍ය යාන්ත්‍රණ ස්ථාපනය කළ යුතුය.

(ඌ) රට තුළ මනා හාත්පස වායු තත්ත්වයක් පවත්වාගනු ලබන බවට සහතික වීම පිණිස කර්මාන්ත මූලාශ්‍රවලින් විමෝචන පාලනය කිරීම සඳහා බලපත්‍ර/ කෝටා ක්‍රමයක් හඳුන්වා දීමේ ශක්‍යතාව ඇගයීම පිණිස යාන්ත්‍රණ සකස් කළ යුතුය.

(ඔ) කාර්මික වායු අපද්‍රව්‍ය සඳහා උපද්‍රව දර්ශක සහිතව අවදානම් තක්සේරු සැලසුම් සහ ආරක්ෂිත ක්‍රමවේද සකස් කළ යුතු අතර පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති ක්‍රියාත්මක කිරීම සඳහා සහ ආපදා අවම කිරීම සඳහා ඒවා කලින් කලට තහවුරු කළ යුතුය.

8.3 දැනුම කළමනාකරණය සහ ධාරිතා වර්ධනයට අදාළ ප්‍රතිපත්ති ප්‍රකාශන

8.3.1 අධ්‍යාපනය සහ දැනුවත්භාවය ඇති කිරීම

(අ) විද්‍යුත් අපද්‍රව්‍ය, ආහාර අපද්‍රව්‍ය හා ඇසුරුම්කරණයෙන් ඇතිවන අපද්‍රව්‍ය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ප්‍රායෝගික සැසි සහිතව, පෙර පාසල් මට්ටමේ සිට උසස් මට්ටම් දක්වා අධ්‍යාපන විෂයමාලා පද්ධතියට, නිෂ්පාදන හා ඒවායේ භාවිතය ආශ්‍රිත ජීවන චක්‍ර ගැටලු ඇතුළත් කළ යුතුය.

(ආ) රට පුරා ඵලදායී අපද්‍රව්‍ය කළමනාකරණයක් සඳහා ප්‍රමාණවත් දැනුවත් මානව ප්‍රාග්ධනයක් පවතින බව සහතික කිරීම පිණිස පාරිසරික, ආර්ථික, සහ සමාජයීය අංශ ආවරණය කරමින් විශ්වවිද්‍යාල සහ තාක්ෂණික අධ්‍යාපන විෂයමාලා පද්ධති තුළට නිෂ්පාදිතවල ජීවන චක්‍රය ආශ්‍රිත ගැටලු අන්තර්ගත කළ යුතුය.

(ඇ) අපද්‍රව්‍ය කළමනාකරණය ආශ්‍රිත එකිනෙක හා බැඳුණු බහුවිධ ගැටලු සහ ඒවා විසඳීමට නිසි කලට ක්‍රියාමාර්ග නොගැනීමේ සමාජ පිරිවැය පිළිබඳව සියලු පුරවැසියන් සහ ආයතනවල දැනුවත්භාවය කලින් කලට ඉහළ නැංවීම පිණිස යාන්ත්‍රණ සකස් කළ යුතුය.

(ඈ) අන්තර් සම්බන්ධතා ඇති අපද්‍රව්‍ය කළමනාකරණ ගැටලු සහ ආපදා වැළැක්වීම සඳහා නිසි කලට ක්‍රියාමාර්ග නොගැනීමෙන් ඇතිවිය හැකි අවදානම් පිළිබඳව සියලු කාණ්ඩයන්හි ප්‍රතිපත්ති සම්පාදකයන් කලින් කලට දැනුවත් කිරීම පිණිස ශක්තිමත් යාන්ත්‍රණ සකස් කළ යුතුය.

(ඉ) අපද්‍රව්‍ය කළමනාකරණයේ සියලු අංශ පිළිබඳව විවිධ ඉලක්ක කණ්ඩායම් සඳහා විටින් විට බහුවිධ අධ්‍යාපන සහ දැනුවත් කිරීමේ වැඩසටහන් ඇතුළත් කිරීම පිණිස මාධ්‍ය දිරිමත් කිරීම සහ මාධ්‍ය සඳහා මග පෙන්වීම සිදු කළ යුතුය.

8.3.2 නිපුණතා සංවර්ධනය, පුහුණුව, පර්යේෂණ සහ සංවර්ධනය

(අ) ප්‍රශස්ත මට්ටමේ වගකීමක් සහ වගවීමක් සහිතව ජාතික, පළාත් සහ පළාත් පාලන මට්ටම්වලදී කාර්යක්ෂම හා ඵලදායී අපද්‍රව්‍ය කළමනාකරණයක් මුල් අවස්ථාවේදී සහතික කිරීම පිණිස නාගරික අපද්‍රව්‍ය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් අපද්‍රව්‍ය කළමනාකරණයේ සියලු අංශ ආවරණය කරමින්, නිපුණතා සංවර්ධන, පුහුණු, පර්යේෂණ සහ සංවර්ධන විශේෂිත මධ්‍යස්ථානයක් විෂය පිළිබඳ විශේෂඥ දැනුමක් ඇති කණ්ඩායමක් යොදා ගනිමින් පිරිවැය ඵලදායී අයුරින් ස්ථාපනය කළ යුතුය. මෙම මධ්‍යස්ථානය අවශ්‍යතාවයක් පැන නගී නම් පසුව ජාතික අපද්‍රව්‍ය කළමණාකරණ අධිකාරිය ලෙස සමස්ත රටෙහිම අපද්‍රව්‍ය කළමණාකරණය සඳහා යොදා ගත හැක.

(ආ) නවෝත්පාදනයන් සහ මනා පරිචයන් ප්‍රවර්ධනය සහ පිළිගැනීමට ලක් කිරීම පිණිස, යෝජිත මධ්‍යස්ථානය විසින් සමස්ත අපද්‍රව්‍ය කළමනාකරණ චක්‍රයේ පාරිසරික, ආර්ථික සහ සමාජයීය අංශ ආශ්‍රිත පර්යේෂණ සහ සංවර්ධනය අනිවාර්ය කළ යුතුය.

(ඇ) දූෂකයා විසින් ගෙවනු ලැබීමේ මූලධර්මය මත පදනම්ව පනවනු ලබන අයබදු සහ බදුවලින් අරමුදල් සපයා ගනිමින් අපද්‍රව්‍ය, නවෝත්පාදන, නව නිපැයුම්කරුවන්, නිෂ්පාදන සහ ක්‍රියාවලි සංවර්ධනය/ වෙනස් කිරීම් පිළිබඳ පර්යේෂණ දිරිමත් කිරීම පිණිස පර්යේෂණ අරමුදලක් ස්ථාපනය කළ යුතුය.

(ඈ) අදාළ ප්‍රමුඛ ආයතන විසින් අපද්‍රව්‍ය කළමනාකරුවන් සහ ශ්‍රම බලකාය සඳහා යෝග්‍ය පරිදි ජාතික වෘත්තීය සුදුසුකම් ලබා ගැනීම අනිවාර්ය කළ යුතුය.

(ඉ) අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා බලපෑ හැකි ස්වභාවික ප්‍රාග්ධන ඌනතාවන්හි පරතර පියවමින්, නිපුණතා සංවර්ධනය සහ පුහුණුව ලබා දීම සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමවේදය ශක්තිමත් කළ යුතුය.

(ඊ) අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රතිපත්තිය පළාත් සභා සහ පළාත් පාලන මට්ටම්න් ඵලදායිව ක්‍රියාවට නැංවීම සහතික කිරීම සඳහා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් සුදුසු ක්‍රමවේදයක් ස්ථාපනය කළ යුතුය.

8.3.3. තාක්ෂණය වැඩිදියුණු කිරීම, භාවිතය සහ හුවමාරුව

(අ) ශ්‍රී ලංකාව විසින් අත්සන් තබා ඇති අදාළ බහුපාර්ශ්වීය පාරිසරික ගිවිසුම් ක්‍රියාත්මක කිරීමෙහිලා ජාතික බැඳීම් සපුරාලීම සඳහා, පාර්ශ්වකරුවන්ගේ සහයෝගිත්වය ඇතිව පරිසර අමාත්‍යාංශය සහ අනෙකුත් අදාළ ජාතික කේන්ද්‍රීය ආයතන විසින් තාක්ෂණ අවශ්‍යතා හඳුනා ගැනීමට අවශ්‍ය දැනුම බෙදා දිය යුතුය.

(ආ) පරිසර දූෂණය එක් ප්‍රභවයක සිට තවත් ප්‍රභවයකට මාරු වීම වළක්වාලීම සහ සම්පත් උපයෝජනය උපරිම කිරීම පිණිස අපද්‍රව්‍ය ආකාරයන්හි අන්තර් සබැඳියාවන් සැලකිල්ලට ගනිමින්, තාක්ෂණ සංවර්ධන භාවිතය සහ හුවමාරුවෙහිදී සාකල්‍යය සමෝධානික අපද්‍රව්‍ය කළමනාකරණය කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

(ඇ) නිෂ්පාදනවල පූර්ණ ජීවන චක්‍රය ආවරණය වන පරිදි අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය සහ සම්පත් ප්‍රතිසාධනය සඳහා තාක්ෂණික සංවර්ධනය උචිත හවුල්කාරිත්වයන් සහිතව ප්‍රවර්ධනය කළ යුතුය.

(ඈ) අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා යෝග්‍ය පිරිවැය අඩු හා දැරිය හැකි මිලකින් යුත් අපද්‍රව්‍ය කළමනාකරණ පහසුකම් දියුණු කිරීම දිරිමත් කර එම පහසුකම් අපද්‍රව්‍ය කළමනාකරුවන්ට ලබා දිය යුතුය.

(ඉ) පරිසර අමාත්‍යාංශය සහ අනෙකුත් අදාළ ජාතික කේන්ද්‍රීය ආයතන විසින් රටෙහි බැඳියාවන් සපුරාලීමෙහිලා අනෙකුත් වගකිව යුතු ප්‍රමුඛ ආයතනවල තාක්ෂණික හැකියාවන් ශක්තිමත් කිරීමට පියවර ගත යුතුය.

(ඊ) ව්‍යවසායකයන් හා නියෝජිතායතන සඳහා ඔවුන්ගේ ශක්‍යතාව හා වගවීම මත පදනම්ව තාක්ෂණික සංවර්ධනය, භාවිතය හා හුවමාරුව සම්බන්ධයෙන් සහාය ලබා දීම සඳහා තිරසර මූල්‍ය යාන්ත්‍රණයක් ස්ථාපනය කළ යුතුය.

(උ) නිරන්තර කාර්යසාධන අධීක්ෂණය, ලේඛනගත කිරීම හා වාර්තාකරණය මගින්, නවෝත්පාදනයන්හි අපේක්ෂිත සේවය/සේවා සැපයීමේ ශක්‍යතාව තහවුරු කර ගැනීම පිණිස කලින් කලට අදාළ නවෝත්පාදන පිළිගැනීමට ලක් කිරීම, ප්‍රවර්ධනය කිරීම හා පසු විපරම් කිරීම සිදු කළ යුතුය.

(ඌ) සාම්ප්‍රදායික කර්මාන්තවල තාක්ෂණය, තාක්ෂණ හැකියාව සහ යටිතල පහසුකම් සංවර්ධනය වැඩිදියුණු කරමින් සාම්ප්‍රදායික කර්මාන්තයන්ට අපද්‍රව්‍ය අවම කිරීම, හැසිරවීම, පිරියම් කිරීම හා බැහැර කිරීමෙහිලා උපකාර කළ යුතුය.

8.3.4 යටිතල පහසුකම් සංවර්ධනය

(අ) අපද්‍රව්‍ය පිරියම් කිරීම් හා බැහැර කිරීම් පහසුකම් සමස්ත දිවයිනම ආවරණය වන පරිදි ක්‍රමෝපායික ස්ථානයන්හි පරිසර හිතකාමී අන්දමින් ස්ථාපනය කළ යුතුය.

(ආ) කාර්මික හා සෞඛ්‍ය සේවා අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වන යටිතල පහසුකම් සංවර්ධනය අදාළ රේඛීය අමාත්‍යාංශවල වගකීමක් විය යුතුය; අන්තරායකාරී අපද්‍රව්‍ය සම්බන්ධයෙන් මධ්‍යම පරිසර අධිකාරිය විසින් සම්පාදිත රෙගුලාසිවලට හා මාර්ගෝපදේශයන්ට අනුකූලව විශේෂ ආරක්ෂිත පියවර ගත යුතුය.

(ඇ) මධ්‍යම පරිසර අධිකාරිය විසින් විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා "දූෂකයා විසින් ගෙවනු ලැබීමේ මූලධර්මය" හා "නිෂ්පාදකයාගේ විස්තීරණ වූ වගකීම පිළිබඳ මූලධර්මය" වැනි මෙවලම් අනුගමනය කරමින් යටිතල පහසුකම් සංවර්ධනය සඳහා මග පෙන්වීම සහ පහසුකම් සැලසීම කළ යුතුය.

(ඈ) හිමිකරුවන්ට මෙහෙයුම, නඩත්තුව හා කළමනාකරණය සඳහා ප්‍රශස්ත මට්ටමේ වගකීමක් හා වගවීමක් ස්ථිරව ලබා දෙමින් සුදුසු පරිදි පුද්ගලික හා රාජ්‍ය-පුද්ගලික හවුල්කාරිත්ව සහිතව නාගරික අපද්‍රව්‍ය කළමනාකරණ යටිතල පහසුකම් සැපයීමට විශේෂිත හා තිරසර ආයතනික යාන්ත්‍රණයක් සැකසිය යුතුය.

(ඉ) ප්‍රතිචක්‍රීයකරණ/ප්‍රතිසාධන ක්‍රමවේද ආර්ථික වශයෙන් ශක්‍ය කිරීම සඳහා දිවයින පුරා විස්තීර්ණ ගබඩා කිරීම්, එක්රැස් කිරීම් හා ප්‍රවාහන පද්ධති ස්ථාපනය කළ යුතුය.

(ඊ) නියාමන හා වාර්ෂික කාර්යසාධන වාර්තාකරණ ක්‍රම සහිතව පරිසර හිතකාමී අන්දමින් සුදුසු පරිදි ප්‍රතිචක්‍රීයකරණ, පිරියම් කිරීම් හා බැහැර කිරීම් පද්ධති ස්ථාපනය කිරීම සඳහා පුද්ගලික, රාජ්‍ය, සහ පුද්ගලික-රාජ්‍ය හවුල්කාරිත්ව දිරිමත් කළ යුතුය.

(උ) පරිසරයට හා අදාළ පරිසර පද්ධතිවලට වන ඍණාත්මක බලපෑම් වැළැක්වීම සඳහා සමස්ත දිවයිනම ආවරණය වන පරිදි, මධ්‍යම හා මහා පරිමාණයෙන් අපද්‍රව්‍ය පිරියම් කිරීම හා බැහැර කිරීම සඳහා සුදුසු ස්ථාන හඳුනාගෙන සංවර්ධනය කළ යුතු අතර නෛතිකව අවශ්‍ය කෙරෙන, අත්‍යවශ්‍ය විශේෂ අවසරයන් මූලික පාරිසරික ඇගයීම් හා පාරිසරික බලපෑම් ඇගයීම මගින් ලබා ගත යුතුය.

(ඌ) සම්පත් උපයෝජනයෙහි කාර්යක්ෂමතාව හා ඵලදායිතාව වැඩි දියුණු කිරීම, දූෂණය අවම කිරීම සහ අනුගත වීමේ පිරිවැය අඩු කිරීම පිණිස ද්‍රව හා ඝන අපද්‍රව්‍ය සඳහා වන පොදු පිරියම් කිරීමේ පහසුකම් දිරිමත් කළ යුතුය.

(එ) සියලුම පළාත් පාලන ආයතන ආවරණය වන පරිදි, පොකුරු ක්‍රමය මත පදනම්ව අපද්‍රව්‍ය බැහැරලීම් පහසුකම් සංවර්ධනය කිරීම හා පවත්වාගෙන යාම සඳහා පළාත් සභාවන් සහ ජාතික රජය විසින් පළාත් පාලන ආයතන වෙත විධිවිධාන සැලසීම, මාර්ගෝපදේශ සැපයීම හා සහාය ලබා දීම සිදු කළ යුතුය.

(ඒ) අනුකූල වීම සඳහා ප්‍රතිඵල කෙරෙහි නැඹුරුවූ ඉලක්ක සහ ප්‍රමිතීන් පවරමින්, යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ප්‍රවීණ, පළපුරුදු හා දක්ෂ වෘත්තිකයන්ගේ සේවය ලබා ගත යුතුය.

(ඔ) තැන තැන අපද්‍රව්‍ය බැහැර කිරීම සහ රටපුරා නීතිවිරෝධී ලෙස අපද්‍රව්‍ය බැහැර කිරීම වැළැක්වීම සඳහා, ඩිජිටල් තාක්ෂණය හෝ වෙනත් සුදුසු තාක්ෂණයක් යොදා ගැනෙන අපද්‍රව්‍ය සෙවුම් පද්ධතියක් ස්ථාපනය කළ යුතුය.

(ඕ) ද්‍රව්‍ය භාවිතය හා තුලනය සම්බන්ධයෙන් විධිමත් වාර්තා තබා ගැනීම සහ වාර්ෂිකව ප්‍රකාශයට පත් කිරීම යටිතල පහසුකම් හිමිකරුවන් සඳහා අනිවාර්ය කළ යුතුය.

(ක) අපද්‍රව්‍ය කළමනාකරුවන්ගේ හා සේවා සපයන්නන්ගේ ප්‍රශස්ත මට්ටමේ වගවීම සහතික කිරීම පිණිස, යටිතල පහසුකම් මෙහෙයවීමේ හා පවත්වාගෙන යෑමේ කොන්දේසි උල්ලංඝනය කිරීම්වල අවදානම වැළැක්වීම සඳහා සුදුසු දණ්ඩන වගන්ති සහිතව ආදර්ශක ගිවිසුම් සකස් කළ යුතුය.

8.3.5 අනෙකුත් සබැඳි ප්‍රතිපත්තීන් හා ජාතික ක්‍රියාකාරී සැලසුම් සමග ඒකාබද්ධ වීම

(අ) හරිත ප්‍රසම්පාදනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සහ තිරසර පරිභෝජනය හා නිෂ්පාදනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා, කාර්යසාධන අධීක්ෂණය සහ වාර්තාකරණය සහිත යාන්ත්‍රණ සකස් කළ යුතුය.

(ආ) ජාතික හරිත වාර්තාකරණ පද්ධතිය ඵලදායී කාර්යසාධන පාදක ඇගයීම් ක්‍රමවේදයක් හා ප්‍රකාශන සහිතව ක්‍රියාත්මක කිරීම ශක්තිමත් කිරීම සඳහා යාන්ත්‍රණයක් සකස් කළ යුතුය.

(ඇ) මේ වන විට සම්පාදනය කර ඇති ජාතික පිවිතුරු නිෂ්පාදන ප්‍රතිපත්තිය හා ආංශික පිවිතුරු නිෂ්පාදන ප්‍රතිපත්තිය යාවත්කාලීන කොට ක්‍රියාත්මක කළ යුතුය.

(ඈ) අපද්‍රව්‍ය ආකාරයන්හි පවතින අන්තර් බැඳියාව සැලකිල්ලට ගෙන, දූෂණය එක් ප්‍රභවයක සිට තවත් ප්‍රභවයකට මාරු වීම වළක්වාලීම සහ සම්පත් උපයෝගීතාව උපරිම කිරීම සඳහා සාකල්‍ය ඒකාබද්ධ අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධති ප්‍රවර්ධනය කළ යුතුය.

(ඉ) එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන ඉලක්ක, දේශගුණ විපර්යාස අවම කිරීම සහ අනුහුරුවීම් සඳහා ගනු ලබන පියවර සහ අපද්‍රව්‍ය කළමනාකරණය සහ රසායනික ද්‍රව්‍ය සම්බන්ධයෙන් වන අනෙකුත්

ජාත්‍යන්තර සම්මුතීන් ක්‍රියාත්මක කිරීම පිළිබඳව ජාතික මට්ටමේ බැඳීම නිසි කාර්යසාධන අධීක්ෂණය සහ වාර්තාකරණය සහිතව අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතීන්ට ඵලදායී ලෙස ඒකාබද්ධ කළ යුතුය.

8.4 ආයතනික යාන්ත්‍රණ, සම්බන්ධීකරණය සහ සන්නිවේදනය පිළිබඳ ප්‍රතිපත්ති ප්‍රකාශන

8.4.1 ජාතික, පළාත් සහ පළාත් පාලන ආයතන මට්ටම්

(අ) අපද්‍රව්‍ය හා රසායනිකයන්ට අදාළව ශ්‍රී ලංකාව අත්සන් තබා ඇති සියලුම අන්තර්ජාතික ගිවිසුම් සම්බන්ධයෙන් දැනට පවතින ජාතික මට්ටමේ සම්බන්ධීකරණ යාන්ත්‍රණ, අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් යාවත්කාලීන දැනුම හා තොරතුරු පළාත් සභාවන්ට සහ පළාත් පාලන ආයතනවලට බෙදාහැරීම සඳහා ශක්තිමත් කොට පුළුල් කළ යුතුය.

(ආ) නාගරික අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා පහත ආකාරයෙන් ජාතික මට්ටමේ සම්බන්ධීකරණ යාන්ත්‍රණ/ කමිටු දෙකක් ස්ථාපනය කළ යුතුය:
(1) පරිසර විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සහ පළාත් පාලන හා පළාත් සභා විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සම-සභාපතිත්වයෙන් යුතුව තෙමසකට වරක් සහ/හෝ සෑම මාස 06කට වරක් රැස්වෙන පරිදි (2) පළාත් පාලන හා පළාත් සභා විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සභාපතිත්වයෙන්, මසකට වරක් පළාත් සභා 9 සහ අනෙකුත් අදාළ පාර්ශ්වකරුවන් රැස්වෙන පරිදි.
එයින් දෙවැන්න මගින්, පළාත් පාලන ආයතන හා පළාත් සභාවලට ඔවුන්ගේ වාර්ෂික ක්‍රියාකාරී සැලසුම්වලට අනුකූල වන පරිදි නාගරික අපද්‍රව්‍ය කළමනාකරණයට පහසුකම් සැලසීම හා මාර්ගෝපදේශන සිදු කළ යුතු අතර, පළමුවැන්න මගින් ජාතික ප්‍රතිපත්තියට අනුකූලව නිශ්චිත ඉලක්ක සම්බන්ධයෙන් සමස්ත කාර්යසාධනය ඇගයිය යුතුය.

(ඇ) අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රතිපත්තියේ සමස්ත කාර්යසාධනය ඇගයීම සඳහා පරිසර අමාත්‍යාංශය විසින් ප්‍රමුඛ ආයතනය වශයෙන්, අනෙකුත් ප්‍රධාන වන්නාවූ ප්‍රමුඛ නියෝජිතායතන සම්බන්ධ කරගනිමින් ශක්තිමත් සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් ගොඩ නැගිය යුතුය.

(ඈ) ප්‍රශස්ත මට්ටමේ දේශපාලනික බැඳීමක් සහිතව අපද්‍රව්‍ය කළමනාකරණය තවදුරටත් වැඩි දියුණු කිරීම සඳහා, නාගරික අපද්‍රව්‍ය සම්බන්ධයෙන් ජාතික මට්ටමේ සම්බන්ධීකරණ යාන්ත්‍රණයෙහි (b) සහ ප්‍රමුඛතම ආයතනයෙහි (c) කාර්යසාධනය වාර්ෂිකව පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතුය.

(ඉ) ඉහළ දේශපාලනික බැඳීමක් සමග ගැටුම් තොර, අපද්‍රව්‍ය පිරියම් කිරීමේ හා අවසාන බැහැර කිරීමේ ස්ථාන පිහිටුවීම සුරක්ෂිත කිරීම සඳහා සහයෝගීව තීරණ ගැනීම තුළින් එකඟතා සහ ගිවිසුම් ඇති කර ගැනීම පිණිස ශක්තිමත් ආයතනික යාන්ත්‍රණයක් සකස් කළ යුතුය.

(ඊ) විනිවිදභාවයෙන් යුත් වාර්තාකරණ හා ප්‍රතිපෝෂණ ක්‍රම සහිතව, අපේක්ෂිත සේවය සියලුම මට්ටම්වලදී සැපයීමෙහිලා ප්‍රශස්ත වගවීමක් විදහාපාමින් සමස්ත රටෙහි තිරසර අපද්‍රව්‍ය කළමනාකරණය සහතික කිරීම සඳහා ප්‍රමුඛතම ආයතනය විසින් ඵලදායී හා කාර්යක්ෂම සම්පත් සවලීකරණ උපායමාර්ගය පිළිබඳ එකඟතා ගොඩනගා ගැනීම සඳහා යාන්ත්‍රණ සකස් කළ යුතුය.

(උ) පාරදෘෂ්‍ය වාර්තාකිරීමේ හා ප්‍රතිපෝෂණ යාන්ත්‍රණ සහිතව දිවයින පුරා අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ රෙගුලාසිවලට අනුකූල වීම සඳහා පළාත් සභා හා පළාත් පාලන ආයතනයන්ට පහසුකම් සැපයීම සඳහා යාන්ත්‍රණ සැකසිය යුතුය.

(ඌ) පළාත් පාලන ආයතන විසින්, ප්‍රජාවන් හා අනෙකුත් සියලුම පාර්ශ්වකරුවන් වෙත සෘජු දෛනික සන්නිවේදන පහසුකම් සහ ප්‍රතිපෝෂණ ක්‍රම සහිතව, අපද්‍රව්‍ය කළමනාකරණයෙහිලා වගකියන හා වගවන, අදාළ ක්ෂේත්‍රයෙහි තාක්ෂණික සුදුසුකම් ලත්/පුහුණුව ලත් කාර්ය මණ්ඩල සහිත අපද්‍රව්‍ය කළමනාකරණ ඒකක/දෙපාර්තමේන්තු පිහිටුවිය යුතුය.

8.4.2 රාජ්‍ය හා පෞද්ගලික අංශ

(අ) විධිමත් හැසිරවීම, ගබඩා කිරීම සහ අනෙකුත් කළමනාකරණ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් අවිධිමත් අංශයෙහි ධාරිතාව වර්ධනය කිරීම සඳහා ඔවුන්ව ඒකාබද්ධ අපද්‍රව්‍ය කළමනාකරණයෙහි ප්‍රධාන ප්‍රවාහයට සම්බන්ධ කරමින් යාන්ත්‍රණ සකස් කළ යුතුය.

(ආ) අපද්‍රව්‍ය කළමනාකරණයෙහිලා ප්‍රශස්ත වගකීමකින් හා වගවීමකින් යුතුව, රට පුරා සිරස් හා තිරස් මට්ටමේ ඒකාබද්ධතාවක් සහතික කරමින් අදාළ වගකිව යුතු ප්‍රමුඛ ආයතන හා නියෝජ්‍යායතන විසින්, රාජ්‍ය හා පුද්ගලික අංශ සහයෝගීව ක්‍රියා කිරීම සඳහා යාන්ත්‍රණ සකස් කළ යුතුය.

(ඇ) පුරවැසියන්/ප්‍රජාවන්, ඔවුන් කොතැනක සිටියද ඔවුන්ගේ දෛනික ජීවිතයෙහි එකිනෙකා සමග සහයෝගිත්වයෙන් කටයුතු කිරීමේදී **"ප්‍රීතිමත් පවුල"** යන්න කේන්ද්‍රය ලෙස සලකමින්, අපද්‍රව්‍ය කළමනාකරණයෙහිලා පුරවැසියන්ගේ/ ප්‍රජාවන්හි ඥානාන්විත ප්‍රතිචාර ප්‍රවර්ධනය කිරීම, වැඩිදියුණු කිරීම හා ශක්තිමත් කිරීම සඳහා යාන්ත්‍රණ ස්ථාපනය කළ යුතුය.

8.4.3 ප්‍රජාව සහ අනෙකුත් රාජ්‍ය නොවන සංවිධාන

(අ) මහජනතාව වෙත ප්‍රතිපෝෂණ සහිතව තොරතුරුවලට පහසු ප්‍රවේශයක් ලැබීමට පහසුකම් සැලසීම සඳහා, අදාළ වගකිව යුතු ආයතන සහ නියෝජිතායතන විසින් තොරතුරු හා සන්නිවේදන පද්ධති සකස් කළ යුතුය.

(ආ) සේවාවන්හි සහ ප්‍රතිචාරයන්හි වගවීම හා පාරදෘෂ්‍යභාවය තහවුරුවන පරිදි ප්‍රජා කණ්ඩායම් සහ රාජ්‍ය නොවන සංවිධාන සමග ඉහළ සමාබද්ධබවක් හා සහයෝගිතාවක් ඇතිකර ගැනීම සඳහා අදාළ වගකිව යුතු ප්‍රමුඛ ආයතන හා නියෝජිතායතන විසින් සුදුසු යාන්ත්‍රණයක් සකස් කළ යුතුය.

8.4.4. හවුල්කාරිත්වයන් ගොඩනඟා ගැනීම

(අ) සේවා සැපයීමේදී වගවීම සහ විනිවිදභාවය සුරකිමින්, පැහැදිලි වගකීම් හඳුනා ගනිමින් සියලු මට්ටම්වලදී ඵලදායී අපද්‍රව්‍ය කළමනාකරණයෙහිලා ඔවුන්ගේ සම්බන්ධවීම උපරිම කිරීම සඳහා සියලු අදාළ පාර්ශ්ව සමග තිරසර හවුල්කාරිත්ව ප්‍රවර්ධනය කිරීමට, ගොඩනැගීමට හා ශක්තිමත් කිරීමට යාන්ත්‍රණ සැකසිය යුතුය.

(ආ) සාර්ථක හවුල්කාරිත්වයන් හඳුනාගෙන, එවැනි යහ ක්‍රියාකාරකම් සහ උගත් පාඩම් ප්‍රකාශයට පත් කිරීමට යාන්ත්‍රණයක් සකස් කිරීම.

8.4.5 ආපදා අවස්ථාවන්හිදී පිරිසිදු කිරීම සහ අපද්‍රව්‍ය කළමනාකරණය

(අ) අවදානම් මට්ටම මත පදනම්ව යෝග්‍ය මට්ටම්වලදී ආපදා වැළැක්වීමේ සැලසුමක් සියලු ආයතන විසින් යොදාගත යුතු අතර ආපදා අවම කිරීම සඳහා අදාළ පද්ධතියේ ඵලදායීබව නිරතුරුව සත්‍යාපනය කර ලේඛනගත කළ යුතුය.

(ආ) හදිසි අවස්ථාවන් සහ ස්වභාවික ව්‍යසනයන් හේතුවෙන් ජනනය වන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම, අවදානම හා අනාරක්ෂිතත්වය තව දුරටත් වර්ධනය වීම අවම කිරීම සහ අවට ප්‍රජාවට අවම බලපෑමක් ඇතිවන පරිදි පිරිසිදු කිරීමේ කටයුතු කඩිනම් කිරීමත් සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විසින් ආපදා කළමනාකරණ අමාත්‍යාංශය හා අනෙකුත් අදාළ පාර්ශ්වකරුවන් සමග සහයෝගිත්වයෙන්, පරිශීලකමිත්‍ර මාර්ගෝපදේශ, ප්‍රමිතිගත මෙහෙයුම් පරිවයන් සකස් කළ යුතුය.

(ඇ) ආපදා අවස්ථාවන්හිදී අන්තරායකාරී අපද්‍රව්‍ය සහ සනීපාරක්ෂක අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමේදී, සෞඛ්‍ය හා පාරිසරික ගැටලු අවම වන පරිදි උපරිම ආරක්ෂාකාරී පියවර අනුගමනය කළ යුතුය.

8.5 නියාමනය, ඇඟයීම, ප්‍රතිපෝෂණය සහ වාර්තාකරණය සම්බන්ධ ප්‍රතිපත්ති ප්‍රකාශන

8.5.1 අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාවලි/ ක්‍රමවේදයන්හි කාර්යසාධනය

(අ) කාර්යක්ෂම හා ඵලදායී අපද්‍රව්‍ය කළමනාකරණයක් සහතික කිරීම සඳහා සහ දිවයින පුරා නීති විරෝධී ක්‍රියා වැළැක්වීම සඳහා අදාළ බලධාරීන් විසින් සුදුසු පරිදි GPS සහ අනෙකුත් ඩිජිටල් පද්ධති යොදා ගනිමින් තිරසාර ක්‍රමාණුකූල දත්ත රැස්කිරීම් හා අපද්‍රව්‍ය සෙවුම් ක්‍රම සකස් කළ යුතුය.

(ආ) ද්‍රව්‍ය/නිෂ්පාදන ප්‍රවාහයෙහි සම්පූර්ණ ජීවන චක්‍රය හා සබැඳිව කලින් කලට කාර්යසාධන පාදක අධීක්ෂණය සහතික කිරීම සඳහා, අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රමුඛ ආයතන හා නියෝජිතායතන විසින් ප්‍රතිපෝෂණ යාන්ත්‍රණයට ප්‍රවේශය සහිතව, තිරසාර ක්‍රමවත් දත්ත රැස්කිරීම් හා අපද්‍රව්‍ය සෙවුම් ක්‍රම සකස් කළ යුතුය.

(ඇ) අදාළ වගකිව යුතු ප්‍රමුඛ ආයතන හා අධිකාරීන් විසින් නාගරික අපද්‍රව්‍ය කළමනාකරණය, විද්‍යුත් අපද්‍රව්‍ය කළමනාකරණය, සෞඛ්‍යසේවා අපද්‍රව්‍ය කළමනාකරණය, අන්තරායකාරී අපද්‍රව්‍ය කළමනාකරණය සහ ඉදිකිරීම් හා බිඳහෙළීම් අපද්‍රව්‍ය කළමනාකරණයට අදාළව අපද්‍රව්‍ය කළමනාකරණයෙහි කාර්යසාධනය ලේඛනගතකොට වාර්ෂිකව ප්‍රකාශයට පත් කළ යුතුය.

(ඈ) රටෙහි අපද්‍රව්‍ය කළමනාකරණයෙහි සමස්ත කාර්යසාධනය ඇගයීම සඳහා පළාත් මට්ටමේ හා පළාත් පාලන ආයතන මට්ටමේ කාර්යසාධනය මත පදනම්ව නියාමන පද්ධති, ජාතික මට්ටමේ නියාමන පද්ධතිය හා සම්බන්ධ කළ යුතුය.

8.5.2 අපද්‍රව්‍ය කළමනාකරණ ආයතන සහ අනෙකුත් සේවා සපයන්නන්ගේ කාර්යසාධනය

(අ) සියලුම **අපද්‍රව්‍ය කළමනාකරණ** ආයතන සහ අනෙකුත් සේවා සපයන්නන් විසින් සේවයෙහි ඉහළ හා පහළ මට්ටමේ කාර්යක්ෂමතාව හා ඵලදායිතාව තහවුරු කිරීම සඳහා කළමනාකරණ ක්‍රමවේදයෙහි කොටසක් වශයෙන් විස්තීර්ණ සේවා ප්‍රමිතීන් සකස් කර පවත්වාගෙන යා යුතුය.

(ආ) මහජනතාවගේ දැනගැනීම සඳහා අදාළ සේවා ප්‍රමිතීන් වාර්ෂිකව ප්‍රකාශයට පත් කළ යුතුය.

(ඇ) කාර්යසාධනය පිළිබඳව මහජනතාවගෙන් සහ අනෙකුත් අදාළ ආයතනවලින් ප්‍රතිපෝෂණ ලබාගැනීම සඳහා අපද්‍රව්‍ය කළමනාකරණ ආයතන සහ අනෙකුත් සේවා සපයන්නන් විසින් පරිශීලකමිත්‍ර ප්‍රතිපෝෂණ ක්‍රමවේද සකස් කළ යුතුය.

(ඈ) අපද්‍රව්‍ය කළමනාකරණයෙහි කාර්යසාධනය, වාර්ෂික මූල්‍ය විගණන වර්තාවන්හිදී සිදු කරන්නාක් මෙන් නියාමනය කර, ලේඛනගත කර වාර්ෂිකව ප්‍රකාශයට පත් කළ යුතුය.

8.5.3 බලාත්මක කිරීමේ ආයතනයන්හි කාර්යසාධනය

(අ) සේවාවේ ඉහළ මට්ටමේ සිට පහළ මට්ටමටත් පහළ මට්ටමේ සිට ඉහළ මට්ටමටත් වගවීම තහවුරු කිරීම සඳහා බලාත්මක කිරීමේ ආයතන විසින් කළමනාකරණ ක්‍රමයෙහි කොටසක් ලෙස, සේවා ප්‍රමිතීන් සහ කාර්යසාධන දර්ශක සකස් කළ යුතුය.

(ආ) සේවාවන්හි ඉහළ හා පහළ මට්ටමේ වගවීම සහතික කිරීම සඳහා, කාර්යසාධනය සම්බන්ධයෙන් මහජනතාවගෙන් සහ අනෙකුත් කවර හෝ ආයතනයක්/ආයතන වෙතින් ප්‍රතිපෝෂණ ලබාගැනීමට සුදුසු යාන්ත්‍රණ සකස් කළ යුතුය.

ඇ) පුරවැසියන්, අපද්‍රව්‍ය කළමනාකරණ ආයතන, සේවා සපයන්නන් සහ අනෙකුත් සියලු ආයතනවලට, අනුකූලබව ඉක්මවා සිය වගකීම් ඉටු කිරීමට දිරිදීම සඳහා, බලාත්මක කිරීමේ අධිකාරි විසින් රටෙහි පිරිසිදු බව හා පාරිසරික තත්ත්වය කලින් කලට නිරීක්ෂණය කිරීම, ලේඛනගත කිරීම හා වාර්තා කිරීම සිදු කළ යුතුය.

8.5.4. පුරවැසියන්ගේ, සිවිල් සංවිධාන, ප්‍රජා සංවිධාන සහ ප්‍රජා නියෝජිතයන්ගේ දායකත්වය සහ තෘප්තිය.

(අ) ''ප්‍රීතිමත් පවුල" යන්න කේන්ද්‍ර කර ගනිමින් ගෘහස්ත මට්ටමින් අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතුවල සක්‍රීයව දායක වීම කෙරෙහි ප්‍රජා කණ්ඩායම් අභිප්‍රේරණය හා ප්‍රවර්ධනය සිදු කළ යුතුය.

(ආ) අපද්‍රව්‍ය කළමනාකරණයෙහිලා ප්‍රජා දායකත්වයන්හි ධනාත්මක ප්‍රතිඵල සහ කාලීන ක්‍රියාමාර්ග නොගැනීමේ ඍණාත්මක බලපෑම් සම්බන්ධයෙන්, ප්‍රජා කණ්ඩායම්වල නවෝත්පාදන, නිර්මාණශීලී අදහස් සහ අදහස් හුවමාරු කර ගැනීම් ඔවුනොවුන් අතර ප්‍රවර්ධනය කළ යුතුය.

(ඇ) පද්ධති වැඩිදියුණු කිරීම් තවදුරටත් දිරිමත් කිරීම සඳහා, රටෙහි අපද්‍රව්‍ය කළමනාකරණයෙහි කාර්යසාධනය සම්බන්ධව ධනාත්මක මෙන්ම ඍණාත්මක ප්‍රතිඵල හා බලපෑම්, ජාතික හා ප්‍රාදේශීය මට්ටම්වලදී ඒවායෙහි ප්‍රතිඵලීය ධනාත්මක හා ඍණාත්මක දාම ප්‍රතික්‍රියා සහිතව, පුරවැසි උපදේශන සාකච්ඡා ප්‍රවර්ධනය කිරීමට සහ වාර්ෂිකව පුරවැසි වාර්තා සැකසීමට ක්‍රියාමාර්ග ගත යුතුය.

8.5.5 සමස්ත රටෙහි පිරිසිදුබව හා සෞන්දර්යාත්මක දර්ශනය

(අ) ප්‍රාදේශීය, දිස්ත්‍රික්, පළාත්, හා ජාතික මට්ටමින් සමස්ත රටෙහිම දෘෂ්‍ය දූෂණය අවම කරමින් පිරිසිදු බව සහ සෞන්දර්යාත්මක දර්ශනය සම්බන්ධයෙන් තොරතුරු වාර්තා කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම වගකිව යුතු ප්‍රමුඛ ආයතන සඳහා අනිවාර්ය කළ යුතුය.

(ආ) ධනාත්මක ප්‍රතිඵල වැඩි දියුණු කර පවත්වා ගැනීමට පුරවැසියන්ව අභිප්‍රේරණය කරමින් අපද්‍රව්‍ය කළමනාකරණයෙහිලා ඔවුන්ගේ දායකත්වය, සමස්ත රටෙහි ප්‍රාදේශීය මට්ටම්වල පිරිසිදුබව මත පදනම්ව පිළිගැනීමට ලක් කළ යුතුය.

8.6 නෛතික බලාත්මක කිරීමේ යාන්ත්‍රණයන්ට අදාළ ප්‍රතිපත්ති ප්‍රකාශන

8.6.1 අපද්‍රව්‍ය ජනනය කරන්නන් වශයෙන් ඊට ඔවුන්ගේ ඇති සම්බන්ධයෙහි ප්‍රමාණය මත, අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරකම්වල නිරත වීම සඳහා සියලුම පුරවැසියන් හා ආයතන නෛතිකව වගකිව යුතු බවට පත් කළ යුතුය.

8.6.2 නිෂ්පාදනයන්හි ජීවන චක්‍රය, නිෂ්පාදන ක්‍රියාවලිය හා අදාළ සේවා සැපයීම් කර්තව්‍ය පුරා ප්‍රජාව, ආයතන, අපද්‍රව්‍ය කළමනාකරුවන් සහ සේවා සපයන්නන් සතු ඉහළ මට්ටමේ සිට පහළ මට්ටම දක්වා වූ වගවීම වර්ධනය කිරීමේ ක්‍රමයක් ලෙස නීතිය බලාත්මක වීම තහවුරු කළ යුතුය.

8.6.3 අනුකූල නොවීමට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීම සඳහා වගකියනු ලබන රේඛීය අධිකාරය නිර්දිෂ්ට කරමින් මහජනතාව වෙත මාර්ගෝපදේශ ලබා දිය යුතුය.

8.6.4 රේඛීය අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රවේශයන්ගෙන් (එනම් නිෂ්පාදනය කිරීම, භාවිතයට ගැනීම හා බැහැර කිරීම) බැහැරට ගොස් "වක්‍රීය ක්‍රම" (එනම් හැකිතාක් දුරට සම්පත් භාවිතයෙහි තබා ගැනීම, භාවිතය අතරතුරදී ඒවායෙහි උපරිම වටිනාකම උකහා ගැනීම, අනතුරුව ඒවායෙහි සේවා කාලය අවසන් වූ විට නිෂ්පාදන හා ද්‍රව්‍ය ප්‍රතිසාධනය හා ප්‍රතිනිෂ්පාදනය කිරීම - (මෙය චක්‍රීය ආර්ථිකය ලෙස හැඳින්වේ.) වෙත නැඹුරු වෙමින් අවැසි පරිවර්තනය ළඟා කර ගැනීමෙහිලා ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු ලැබීමට සහාය ලබාදීම සඳහා පරිසර අමාත්‍යාංශය විසින් දැනට පවතින නීති හා රෙගුලාසිවල අදාළත්වය, ප්‍රමාණවත්බව, ක්ෂමතාව හා ඵලදායීබව සම්බන්ධයෙන් විස්තීර්ණ ප්‍රතිශෝධනයක් සිදු කළ යුතුය.

8.6.5 මධ්‍යම පරිසර අධිකාරිය විසින් මෙම ප්‍රතිපත්තියේ විධිවිධාන නියාමනය, ඇගයීම සහ ඵලදායී ලෙස බලාත්මක කිරීම සඳහා විශේෂිත යාන්ත්‍රණයක් ස්ථාපනය කළ යුතුය.

8.6.6 වර්තමාන තත්ත්වය සහ අනාගත ප්‍රවණතා සැලකිල්ලට ගෙන සියලුම මට්ටම්වලට අදාළව, දැනට පවත්නා නීති පද්ධතිවල ඇති විධිවිධාන යාවත්කාලීන කරමින් හා වැඩිදියුණු කරමින් පරිපූර්ණ නීති පද්ධතියක් සකස් කළ යුතුය.

8.6.7 දීර්ඝ කාලීන විසඳුම් වශයෙන් සුදුසු පරිදි පනත් හා අඥාපනත් සංශෝධනය කිරීමට පියවර ගන්නා අතර කෙටි කාලීන හා මධ්‍ය කාලීන විසඳුම් වශයෙන්, දැනට පවත්නා රෙගුලාසි හා අතුරු ව්‍යවස්ථා වැඩිදියුණු කිරීමට, ශක්තිමත් කිරීමට සහ නැවත විධිමත්ව සකස් කිරීමට සෑම ප්‍රයත්නයක්ම ගත යුතුය.

8.6.8 පළාත් පාලන, පළාත් සභා හා ජාතික මට්ටමින් වාර්ෂික කාර්යසාධන අධීක්ෂණ, ලේඛනගතකරණ හා වාර්තාකරණ ක්‍රම සහිතව පරිසර පොලිස් ජාලය ශක්තිමත් කරමින්, සමස්ත දිවයින ආවරණය වන පරිදි, දැනට පවත්නා බලාත්මක කිරීමේ යාන්ත්‍රණ තවදුරටත් ශක්තිමත් හා විස්තීර්ණ කළ යුතුය.

8.6.9 පාරිසරික සුරක්ෂිතතාව සහතික කිරීම පිණිස, (1) අපද්‍රව්‍ය ආශ්‍රිත දේශීය මට්ටමේ ගැටුම් සහ (2) අන්තර්ජාතික දේශ සීමා අතර අපද්‍රව්‍ය ප්‍රවාහනය ආශ්‍රිතව මෙරට ඇතිවන ගැටලුවලට පිළියම් යෙදීම සඳහා ශක්තිමත් ගැටුම් නිරාකරණ යාන්ත්‍රණ සකස් කළ යුතුය.

8.7 මූල්‍ය යාන්ත්‍රණ සහ මූල්‍යමය නොවන දිරිගැන්වීම් සඳහා වන ප්‍රතිපත්ති ප්‍රකාශන

8.7.1 සුදුසු රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්ව මගින් අපද්‍රව්‍ය කළමනාකරණයෙහි පිරිවැය ඵලදායීතාව වැඩිදියුණු කිරීම සඳහා, උචිත වෙළඳපොළ යාන්ත්‍රණ හා මෙවලම් සකස් කළ යුතුය.

8.7.2 ආදායම් උත්පාදනය සඳහා සහ නිෂ්පාදන කාර්යක්ෂමව හා ඵලදායීව කළමනාකරණය කිරීම සඳහා සුදුසු පරිදි, ''දූෂකයා විසින් ගෙවනු ලැබීම'' හා ''නිෂ්පාදකයාගේ විස්තීරණ වූ වගකීම'' යන මූලධර්ම අදාළ කර ගත යුතුය.

8.7.3 දූෂකයා විසින් ගෙවනු ලැබීම හා නිෂ්පාදකයාගේ විස්තීරණ වූ වගකීම වැනි මූලධර්ම ක්‍රියාත්මක කිරීම හරහා උත්පාදනය වන ආදායම් සමස්ත අපද්‍රව්‍ය කළමනාකරණ චක්‍රයෙහි පද්ධති කාර්යක්ෂමතා වැඩිදියුණු කරගැනීම සඳහා භාවිත කළ යුතුය.

8.7.4 පරිසර හිතකාමී තිරසාර අපද්‍රව්‍ය කළමනාකරණයක් සඳහා සුදුසු පරිදි යන්ත්‍රෝපකරණ සහ තාක්ෂණය ආනයනය කිරීමට, උචිත බදු සහන ලබාදීම සඳහා යාන්ත්‍රණයක් සකස් කළ යුතුය.

8.7.5 පරිසර හිතකාමී තිරසර අපද්‍රව්‍ය කළමනාකරණයෙහිලා ඔවුන්ගේ කැපවීම හා වගවීම මත පදනම්ව, ආපදා කළමනාකරණ දේශීය කර්මාන්ත දිරිගැන්වීම සඳහා සුදුසු මූල්‍ය යාන්ත්‍රණ සකස් කළ යුතුය.

8.7.6 අපද්‍රව්‍ය අවම කිරීමේ තාක්ෂණික සංවර්ධනය හා භාවිතය වෙනුවෙන් අඩු පොලී ණය සහ ප්‍රදාන ලබා දිය යුතුය.

8.7.7 අදාළ පාර්ශ්වකාර අමාත්‍යාංශ සහ ආයතන විසින් මුදල් අමාත්‍යාංශය විමසා, අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා තිරසාර මූල්‍ය යාන්ත්‍රණ සකස් කළ යුතුය.

8.7.8 සේවා සැපයීමෙහි හිමිකාරිත්වය හා වගවීම සනාථ කරමින් සියලු මට්ටම්වලදී ඵලදායී අපද්‍රව්‍ය කළමනාකරණයට පහසුකම් සැපයීම සඳහා, මුදල් අමාත්‍යාංශය විසින් ඒකාබද්ධ මූල්‍ය යාන්ත්‍රණයක් සැකසිය යුතුය.

8.7.9 රජයේ දිරිදීමනා ක්‍රමය සඳහා පාරිසරික අනුකූලතාවය සලකා බැලීම අත්‍යවශ්‍ය සාධකයක් බවට පත් කළ යුතුය.

8.7.10 අපද්‍රව්‍ය කළමනාකරණයෙහිලා මනා පරිචයන් හා පද්ධති වැඩිදියුණු කිරීම් මත පදනම්ව මූල්‍ය දිරිදීමනා වැඩි කළ යුතුය.

8.8 ජාත්‍යන්තර සම්මුතීන් හා ගිවිසුම් හා අනුකූලභාවය සඳහා වන ප්‍රතිපත්ති ප්‍රකාශන

8 .8.1 ශ්‍රී ලංකාව විසින් අපරානුමත කර ඇති ජාත්‍යන්තර ගිවිසුම්වලට සහ සම්මුතීන්ට ඇති බැඳියාවන්ට, ජාත්‍යන්තර ප්‍රජාවගේද සහයෝගීත්වය ඇතිව අනුකූලතාව අභිබවා යමින් සාක්ෂාත් කර ගැනීමේ ඉලක්ක සහිතව, ගරු කළ යුතුය.

8.8.2 අනුකූලතාව සහතික කිරීම පිණිස, පවත්නා නෛතික යාන්ත්‍රණ අවශ්‍ය අවස්ථාවන්හිදී තවදුරටත් ශක්තිමත් කළ යුතුය.

8.8.3 ශ්‍රී ලංකාව විසින් අපරානුමත කර ඇති ජාත්‍යන්තර ගිවිසුම් සඳහා දේශීය බැඳීම් සහ අනුකූලව කටයුතු කිරීමෙහිලා පුරවැසියාගේ භූමිකාව පිළිබඳව මහජනතාව හා අනෙකුත් ආයතන දැනුවත් කිරීම සඳහා අදාළ බලධාරීන් විසින් තොරතුරු බෙදා හැරීමේ පද්ධති සකස් කළ යුතුය.

8.8.4 ශ්‍රී ලංකාවේ මනා පරිචයන්, ළඟාකර ගත් ජයග්‍රහණ සහ උගත් පාඩම් පිළිබඳව ජාත්‍යන්තරය දැනුවත් කිරීම සඳහා තොරතුරු බෙදාහැරීමේ පද්ධති සකස් කළ යුතුය.

8.9 ඉදිරි ක්‍රියාමාර්ග සඳහා ප්‍රතිපත්ති ප්‍රකාශන

8.9.1 ප්‍රමුඛ නියෝජිතායතන/ආයතන විසින් කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දිගු කාලීන ක්‍රියාමාර්ග ඇතුළත් විශේෂිත ඉලක්ක අරමුණු කරන්නාවූ ක්‍රියාකාරී සැලසුම් සහිතව සියලුම අපද්‍රව්‍ය අංශ හා ප්‍රවාහ ආවරණය වන පරිදි, ප්‍රතිපත්ති ඵලදායීව හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සලසනු පිණිස මෙම ප්‍රතිපත්තිය අනුමතවීමෙන් වසරක් ඇතුළත උපායමාර්ග සකස් කළ යුතුය.

8.9.2 මහජනතාව වෙත වාර්ෂික කාර්යසාධනය වාර්තාකරණය සහිතව කලින් කලට පද්ධති සහ කාර්යසාධන තහවුරු කරන ශක්තිමත් යාන්ත්‍රණ සහිතව

නාගරික අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ප්‍රමුඛ කාර්යයක් වශයෙන් තෙමසක් ඇතුළත තිරසාර සම්බන්ධීකරණ, සන්නිවේදන හා වාර්තාකරණ ක්‍රම ස්ථාපනය කළ යුතුය.

8.9.3 සියලුම වගකිව යුතු ප්‍රමුඛ ආයතන විසින්, පරිසර අමාත්‍යාංශය හා සහයෝගිත්වයෙන් යුතුව මාස 3ක් ඇතුළතදී කාර්යසාධන වාර්තාකරණ ආකෘති සකස් කළ යුතුය.

8.9.4 වහා පිළියම් යෙදිය යුතු වර්තමාන ගැටලුවලට පිළියම් යෙදීම සඳහා නිශ්චිත කාල ඉලක්ක සහිතව, නාගරික අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා උපායමාර්ගයක් සහ කෙටි කාලීන ක්‍රියාකාරී සැලසුමක් සකස් කළ යුතුය.

8.9.5 පළාත් සභා විසින් පළාත් පාලන ආයතන හා සහයෝගිත්වයෙන් යුතුව, නාගරික අපද්‍රව්‍ය පිරියම් කිරීම හා බැහැර කිරීම සඳහා වසරක් තුළ සුදුසු භූමි හඳුනාගෙන ඒවා නෛතිකව නම් කළ යුතුය.

8.9.6 යෝග්‍ය තාක්ෂණය යොදාගෙන පරිසර හිතකාමී අයුරින් යටිතල පහසුකම් සංවර්ධනය සම්බන්ධයෙන් අපද්‍රව්‍ය කළමනාකරුවන්ට මග පෙන්වීම කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින්, මෙම ප්‍රතිපත්තිය අනුමත වීමෙන් මාස 6ක් ඇතුළත, කේන්ද්‍රීය හා විශේෂිත "නිපුණතා සංවර්ධන, පුහුණු, පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයෙහි" ආකෘතිය හා ව්‍යුහය සකස් කළ යුතුය.

ඇමුණුම I

අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

අපද්‍රව්‍ය කළමනාකරණය කෙරෙහි පාර්ශ්වකාර ආයතනවල වගකීම් සහ සම්බන්ධතා

පූර්විකාව

ඉතා අවැසි සමාජ පරිවර්තනය ඔස්සේ සමස්ත රටෙහි තිරසර අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ප්‍රශස්ත මට්ටමේ සහයෝගිතාවය හා වගවීම සහතික කරනු පිණිස පොදු නමුදු වෙන්කොට හඳුනා ගනු ලබන වගකීම යන මූලධර්මයට අනුගතවීම මෙම ප්‍රතිපත්ති ලේඛනයෙහි දැඩිව අවධාරණය කර ඇත.

ඇමුණුම 1හි දැක්වෙනුයේ මෙම ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙහිලා වගකීම් දැරීම හා එම වගකීම් සඳහා වගවීම පවරන ලද පාර්ශ්වකරුවන්ට අදාළ තොරතුරු වේ. අනෙකුත් සියලුම ආයතනවලට (රාජ්‍ය, පුද්ගලික, රාජ්‍ය නොවන සහ අනෙක්) සහ පොදුවේ ප්‍රජාවට මෙම ප්‍රතිපත්තියෙහි අරමුණු, ඉලක්ක හා මෙහෙවර සාක්ෂාත් කිරීමෙහිලා තනිතනි හා සාමූහික වගකීම් ඇත්තේය.

(අ) අපද්‍රව්‍ය කළමනාකරණය කෙරෙහි පාර්ශ්වකාර වගකීම්:

(a) අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වගකිවයුතු අමාත්‍යාංශ

(1) පරිසරය විෂය භාර අමාත්‍යාංශය

ජාතික ප්‍රතිපත්ති සම්පාදනය හා ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා සම්බන්ධීකරණය සහ පහසුකම් සැලසීම; ශ්‍රී ලංකාව විසින් කේන්ද්‍රීය මධ්‍යස්ථානය ලෙස අත්සන් තබා ඇති ජාත්‍යන්තර සම්මුතීන්ට (අන්තරායකාරී අපද්‍රව්‍ය දේශසීමා හරහා ප්‍රවාහනය හා බැහැර කිරීම පාලනය සඳහා වූ බාසල් සම්මුතිය, දිගුකල් පවත්නා කාබනික දූෂක පිළිබඳ ස්ටොක්හෝම් සම්මුතිය, මිනමාටා සම්මුතිය, මොන්ට්‍රියල් සන්ධානය, දේශගුණ විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතිය සහ රජය විසින් අනාගතයේ තීරණය කරන පරිදි වෙනත් කවර හෝ නව ජාත්‍යන්තර සම්මුතීන්) අදාළව රටෙහි බැඳීම් ඉටු කිරීම සඳහා සම්බන්ධීකරණය, ජාත්‍යන්තර සහයෝගිතාව සහ තොරතුරු සම්ප්‍රේෂණය ප්‍රමුඛ කාර්යසාධක දර්ශක සහිත කාල නිශ්චිත ප්‍රතිඵල, දිශානත ප්‍රධාන සැලසුම් සකස් කිරීම. සමස්ත කාර්යසාධනය

අධීක්ෂණය, අනෙකුත් ප්‍රමුඛ ආයතන සමග සහයෝගීතාවයෙන් පාරිසරික ගුණාත්මකතාව ඇතුළුව කාර්යසාධනය වාරිකව ඇගයීම සහ ප්‍රකාශයට පත් කිරීම.

(2) පළාත් සභා සහ පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශය / අමාත්‍යාංශ

ජාතික ප්‍රතිපත්තියට අනුකූලව, ආංශික හා උප ආංශික ප්‍රතිපත්ති සකස් කිරීම. ජාතික, පළාත් සහ පළාත් පාලන මට්ටම්වලදී ජාතික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැපයීම. ද්විකරණය වළක්වාලමින් සියලු පළාත් සභා සහ පළාත් පාලන ආයතන ආවරණය කරමින් මානව, මූල්‍ය සහ තාක්ෂණික සම්පත් සවලීකරණය. නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණයේදී මානව සම්පත් සහ මූල්‍ය සම්පත් කළමනාකරණය සහ යහපාලන පරිවයන් පිළිබඳව වාරිකව පර්යේෂණ පැවැත්වීම, නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා කාල නිශ්චිත ප්‍රධාන සැලසුම් සකස් කිරීම. කාර්යසාධනය අධීක්ෂණය, ඇගයීම සහ වාර්තා කිරීම, ප්‍රතිපෝෂණ යාන්ත්‍රණ සහිතව නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ කාර්යසාධනය සම්බන්ධයෙන් තොරතුරු සම්ප්‍රේෂණය.

(3) මුදල් සහ සැලසුම් විෂය භාර අමාත්‍යාංශය /අමාත්‍යාංශ

තිරසර මූල්‍ය යාන්ත්‍රණ සකස් කිරීම; ද්විකරණය අවම කරමින් ජාතික, පළාත් සහ පළාත් පාලන මට්ටම් සඳහා මූල්‍ය සම්පත් සවලීකරණය; දූෂකයා විසින් ගෙවනු ලැබීමේ මූලධර්මය සම්බන්ධ කරමින් ආදායම් උත්පාදනය සඳහා වෙළෙඳපොළ පාදක මෙවලම් සකස් කිරීම සහ රට තුළ තිරසර අපද්‍රව්‍ය කළමනාකරණයක් ක්‍රියාත්මක කිරීමට සහයෝගය දැක්වීම; අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන් සඳහා අරමුදල් සැපයීමේදී පාරිසරිය කෙරෙහි සැලකිල්ලට අභ්‍යර්ථ (considerations) කොන්දේසියක් බවට පත් කිරීම.

(4) නීතිය හා සාමය විෂය භාර අමාත්‍යාංශය

අනනුකූලත්වයට එරෙහිව කාලෝචිත හා වගකිවයුතු ක්‍රියාමාර්ග ගැනීම ප්‍රවර්ධනය කිරීම මගින් පොදුවේ මහජනතාව ඇතුළු සියලු අංශ විසින් අපද්‍රව්‍ය කළමනාකරණ රෙගුලාසීන්ට අනුකූලව ක්‍රියා කිරීම සඳහා අවශ්‍ය විනය, වැඩිදියුණු කිරීම සහ අවශ්‍ය විටෙක ප්‍රගුණ කරවීම.

(5) විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ විෂය භාර අමාත්‍යාංශය /අමාත්‍යාංශ

අඩු පිරිවැය සහිත අපද්‍රව්‍ය පිරියම් කිරීමේ සුදුසු තාක්ෂණ ක්‍රමවේද හඳුන්වා දෙමින් සුදුසු තාක්ෂණ සංවර්ධනය හා පවරාදීම ; පර්යේෂණ හා සංවර්ධනය; අපද්‍රව්‍ය ආශ්‍රිත දත්ත එක්රැස් කිරීම; ප්‍රවණතා විශ්ලේෂණය, කාර්යසාධන අධීක්ෂණය සහ

ඇගයීම, ප්‍රතිපෝෂණ යාන්ත්‍රණ සහිතව කාර්යසාධන වාර්තාකරණය; මනා පරිවයන් පිළිගැනීමට ලක් කිරීම හා ප්‍රකාශනය, මනා පරිවයන් සඳහා ප්‍රතිලාභ ලබාදීම.

(6) නාගරික සැලසුම්කරණය සහ සංවර්ධනය පිළිබඳ විෂය භාර අමාත්‍යාංශය / අමාත්‍යාංශ

නාගරික සැලසුම්කරණයේදී යටිතල පහසුකම් සැපයීම; අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැපයීම, අන්තරායකාරී අපද්‍රව්‍ය අපහරණය කිරීමේ භාවිතයන් ආශ්‍රිත අභියෝග වාරිකව ඇගයීම සහ ප්‍රතිපෝෂී යාන්ත්‍රණ සහිතව අදාළ පාර්ශ්වකරුවන් සමග සහයෝගිතාවයෙන් එවැනි සිදුවීම් වැළැක්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම, පවිත්‍රතාවය සහ සෞන්දර්යාත්මක දර්ශනපථය පිළිබඳ ප්‍රකාශනය.

(7) නිවාස හා ඉදිකිරීම විෂය භාර අමාත්‍යාංශය/ අමාත්‍යාංශ

එහි විෂයපථයට ගැනෙන නිවාස හා ඉදිකිරීම්වලදී ජනනය වන අපද්‍රව්‍යය කළමනාකරණයට අවශ්‍ය ප්‍රමාණවත් යටිතල පහසුකම් පවතින බව සහතික කිරීම සඳහා ප්‍රතිපත්ති සැකසීම, කාර්යසාධන අධීක්ෂණය, ප්‍රතිපෝෂණ යාන්ත්‍රණ සහිත ඇගයීම, ඉදිකිරීම් හා බිඳ හෙළීම් අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ජාතික ප්‍රතිපත්තියට අනුකූලව ආංශික සහ උප ආංශික ප්‍රතිපත්ති සකස් කිරීම.

(8) ජල සම්පාදන හා ජලාපවාහන විෂය භාර අමාත්‍යාංශය/ අමාත්‍යාංශ

අපජලය සහ පල්දෝරු පිරියම් කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම සඳහා අදාළ ප්‍රතිපත්ති සහ උපායමාර්ග සකස් කිරීම. ජල ප්‍රභව අපවිත්‍ර වීම වැළැක්වීමට අපජලය සහ පල්දෝරු පිරියම් කිරීමේ පහසුකම් සංවර්ධනය සහ ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් පාලන ආයතනවලට සහාය වීම. කාර්යසාධන අධීක්ෂණය, ප්‍රතිපෝෂණ යාන්ත්‍රණ සහිතව ඇගයීම.

(9) ජනමාධ්‍ය විෂය භාර අමාත්‍යාංශය/ අමාත්‍යාංශ

අවශ්‍ය සමාජ පරිවර්තනයට සහාය වීම පිණිස දීප ව්‍යාප්තව අපද්‍රව්‍ය කළමනාකරණ අංශය පිළිබඳ දැනුම සහ තොරතුරු ප්‍රචාරණය සඳහා අඛණ්ඩව පොදු දැනුවත්භාවය ඇති කිරීම.

(10) සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය විෂය භාර අමාත්‍යාංශය/ අමාත්‍යාංශ

සෞඛ්‍ය

ජාතික ප්‍රතිපත්තිය, උපායමාර්ග සහ ක්‍රියාකාරී සැලසුම් අනුව ආංශික/ උප ආංශික ප්‍රතිපත්ති සකස් කිරීම; ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීම; උචිත අපද්‍රව්‍ය පිරියම් කිරීම් තාක්ෂණික ක්‍රම සංවර්ධනය සඳහා පහසුකම් සැලසීම; ජාතික, පළාත් සහ පළාත් පාලන මට්ටම්වල් අපද්‍රව්‍ය කළමනාකරණය ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීම; මානව සම්පත් සංවර්ධනය සහ ධාරිතා වර්ධනය; මාර්ගෝපදේශ සකස් කිරීම සහ වාරිකව යාවත්කාලීන කිරීම; වාරිකව දත්ත එක්රැස් කිරීම, කාර්යසාධනය අධීක්ෂණය සහ ඇගයීම, ප්‍රතිපෝෂණ යාන්ත්‍රණය සහිතව ප්‍රගතිය ඇතුළුව තොරතුරු වාර්තා කිරීම සහ සම්ප්‍රේෂණය.

දේශීය වෛද්‍ය විෂය භාර අමාත්‍යාංශය

ජාතික ප්‍රතිපත්තිය, උපායමාර්ග සහ ක්‍රියාකාරී සැලසුම්වලට අනුකූලව ආංශික/ උප ආංශික ප්‍රතිපත්ති සකස් කිරීම; ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීම; යෝග්‍ය අපද්‍රව්‍ය පිරියම් කිරීමේ තාක්ෂණික ක්‍රම සංවර්ධනය සඳහා පහසුකම් සැලසීම; කාර්යසාධනය අධීක්ෂණය සහ ඇගයීම, ප්‍රතිපෝෂණ යාන්ත්‍රණ සහිතව ප්‍රගතිය ඇතුළුව තොරතුරු වාර්තා කිරීම සහ සම්ප්‍රේෂණය.

(11) **කර්මාන්ත සංවර්ධනය සහ වාණිජ විෂය භාර අමාත්‍යාංශය**

ජාතික ප්‍රතිපත්තිය, උපායමාර්ග සහ ක්‍රියාකාරී සැලසුම් අනුව ආංශික/ උප ආංශික ප්‍රතිපත්ති සකස් කිරීම; ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීම; අපද්‍රව්‍ය හුවමාරු වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම; පොදු පිරියම් කිරීමේ පහසුකම් භාවිතය පිණිස කර්මාන්ත පොකුරුගත කිරීම ප්‍රවර්ධනය; ධාරිතා වර්ධනය; තාක්ෂණික සංවර්ධනය හා පැවරුම්; පර්යේෂණ හා සංවර්ධනය; අපද්‍රව්‍ය ආශ්‍රිත දත්ත එක්රැස් කිරීම; ප්‍රතිපෝෂණ යාන්ත්‍රණය සහිතව කාර්යසාධනය ඇගයීම සහ වාර්තා කිරීම; මනා පරිවයන් පිළිගැනීමට ලක් කිරීම හා ප්‍රකාශයට පත් කිරීම සහ මනා පරිවයන් සඳහා ප්‍රතිලාභ ලබා දීම.

(12) **කෘෂිකර්ම විෂය භාර අමාත්‍යාංශය**

ජාතික ප්‍රතිපත්තිය, උපායමාර්ග සහ ක්‍රියාකාරී සැලසුම්වලට අනුකූලව ආංශික/ උප ආංශික ප්‍රතිපත්ති සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීම; දත්ත එක්රැස් කිරීම, කාර්යසාධන අධීක්ෂණය හා ඇගයීම, ප්‍රතිපෝෂී යාන්ත්‍රණ සහිතව ප්‍රගතිය ඇතුළුව තොරතුරු වාර්තා කිරීම හා සම්ප්‍රේෂණය.

(13) **ව්‍යවසාය සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන විෂය භාර අමාත්‍යාංශය**

පරිසර හිතකාමී ව්‍යවසාය සංවර්ධනය ස්ථාපිත වීම ප්‍රවර්ධනය කිරීම මගින් ආංශික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, ආර්ථික ස්වශක්ත හා තිරසර ආකාරයෙන් හරිත රැකියා නිර්මාණය කරමින් අපද්‍රව්‍ය අංශයෙහි ව්‍යවසායන් ස්ථාපිත කිරීම.

(14) **විදුලිබල හා බලශක්ති විෂය භාර අමාත්‍යාංශය**

විදුලිබල හා බලශක්ති අංශයට අදාළව අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් අදාළ ආංශික ප්‍රතිපත්ති සැකසීම හා ඒවා ක්‍රියාත්මක වීම සහතික කිරීම, අපද්‍රව්‍ය කළමනාකරණයට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය, කාර්ය මණ්ඩලයෙහි ධාරිතා වර්ධනය, දත්ත එක්රැස් කිරීම, සමස්ත නියාමනය, සහ වාරිකව ඇගයීම හා වාර්තා කිරීම.

(15) **ප්‍රවාහන විෂය භාර අමාත්‍යාංශය**

ජාතික ප්‍රතිපත්තිය, උපායමාර්ග සහ ක්‍රියාකාරී සැලසුම්වලට අනුකූලව අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික/ උප ආංශික ප්‍රතිපත්ති සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීම, වාරික දත්ත එක්රැස් කිරීම, පර්යේෂණ හා සංවර්ධනය, කාර්යසාධන අධීක්ෂණය, ප්‍රතිපෝෂණ ප්‍රවේශය සහිතව ඇගයීම හා වාර්තා කිරීම, ප්‍රතිපෝෂණ යාන්ත්‍රණය සහිතව ප්‍රගතිය වාර්තාකිරීම ඇතුළුව තොරතුරු සම්ප්‍රේෂණය.

(16) **වරාය හා නාවික කටයුතු විෂය භාර අමාත්‍යාංශය**

සමුද්‍රීය හා වෙරළාසන්න පරිසර දූෂණය වැළැක්වීම සඳහා ජාතික ප්‍රතිපත්තියට අනුකූලව අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික ප්‍රතිපත්ති, උපායමාර්ග සහ ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීම, වාරික දත්ත එක්රැස් කිරීම, පර්යේෂණ හා සංවර්ධනය, කාර්යසාධන අධීක්ෂණය, ප්‍රතිපෝෂණ ප්‍රවේශය සහිතව ඇගයීම හා වාර්තා කිරීම, ප්‍රතිපෝෂණ යාන්ත්‍රණය සහිතව ප්‍රගතිය ඇතුළුව තොරතුරු සම්ප්‍රේෂණය.

(17) **විදුලි සංදේශ විෂය භාර අමාත්‍යාංශය**

ආයු කාලය අවසන් වූ විදුලි සන්දේශ උපකරණ කළමනාකරණය ඇතුළත්ව ආංශික/ උප ආංශික ප්‍රතිපත්ති ජාතික ප්‍රතිපත්තියට අනුකූලව සකස් කිරීම.

අනාගත තාක්ෂණ දියුණුව හා ප්‍රවණතා මත අවධානය යොමු කරමින් අපද්‍රව්‍ය ජනනය වීම වැළැක්වීම හෝ අවම කිරීම සඳහා ප්‍රතිපත්ති සකස් කිරීම. ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීම, වාරික දත්ත එක්රැස් කිරීම, පර්යේෂණ හා සංවර්ධනය, කාර්යසාධන අධීක්ෂණය, ප්‍රතිපෝෂණ ප්‍රවේශය සහිතව ඇගයීම හා වාර්තා කිරීම, ප්‍රතිපෝෂණ යාන්ත්‍රණය සහිතව ප්‍රගතිය වාර්තා කිරීම ඇතුළුව තොරතුරු සම්ප්‍රේෂණය.

(18) **ආපදා කළමනාකරණය විෂය භාර අමාත්‍යාංශය**

ආපදා තත්ත්වයන්හි අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අදාළ පාර්ශ්ව සමග සහයෝගිත්වයෙන් ජාතික ප්‍රතිපත්තිය, උපායමාර්ග සහ ක්‍රියාකාරී සැලසුම්වලට අනුකූලව අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික/ උප ආංශික ප්‍රතිපත්ති සකස් කිරීම. හදිසි සුදානම් කිරීමේ සැලසුම් සකස් කිරීම සහ ඒවායේ ඵලදායිතාව කලානුරූපීව නියාමනය ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීම, අවදානම් අඩු කිරීම සඳහා අදාළ දත්ත එක්රැස් කිරීම සහ පර්යේෂණ හා සංවර්ධනය, කාර්යසාධන අධීක්ෂණය, ප්‍රතිපෝෂණ ප්‍රවේශය සහිතව ඇගයීම හා වාර්තා කිරීම, ප්‍රතිපෝෂී යාන්ත්‍රණ සහිතව ප්‍රගතිය වාර්තා කිරීම ඇතුළුව තොරතුරු සම්ප්‍රේෂණය.

(19) **ඛනිජ තෙල් විෂය භාර අමාත්‍යාංශය**

පෙට්‍රෝලියම් අවශේෂ මගින් ඇතිවිය හැකි ජල හා භූමි දූෂණය වැළැක්වීම සඳහා ජාතික ප්‍රතිපත්තියට අනුකූලව ආංශික/ උප ආංශික ප්‍රතිපත්ති සකස් කිරීම; ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීම, වාරිකව දත්ත එක්රැස් කිරීම; පර්යේෂණ හා සංවර්ධනය; කාර්යසාධන අධීක්ෂණය, ප්‍රතිපෝෂණ ප්‍රවේශය සහිතව ඇගයීම හා වාර්තා කිරීම, ප්‍රතිපෝෂී යාන්ත්‍රණ සහිතව ප්‍රගතිය වාර්තා කිරීම ඇතුළුව තොරතුරු සම්ප්‍රේෂණය.

(20) **සංචාරක විෂය භාර අමාත්‍යාංශය**

සංචාරක කර්මාන්තය ආශ්‍රිත ජනනය වන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ජාතික ප්‍රතිපත්තිය, උපායමාර්ග සහ ක්‍රියාකාරී සැලසුම්වලට අනුකූලව අදාළ පාර්ශ්වකරුවන් හා සහයෝගිත්වයෙන් ආංශික/ උප ආංශික ප්‍රතිපත්ති සකස් කිරීම සහ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ වගකීමෙන් කටයුතු කරන සමාජයක් ලෙස ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය නංවාලීම සඳහා ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීම, වාරික දත්ත එක් රැස් කිරීම, පර්යේෂණ හා සංවර්ධනය, කාර්යසාධනය අධීක්ෂණය, ප්‍රතිපෝෂණ ප්‍රවේශය සහිතව ඇගයීම හා වාර්තා කිරීම, ප්‍රතිපෝෂී යාන්ත්‍රණය සහිතව ප්‍රගතිය වාර්තා කිරීම ඇතුළුව තොරතුරු සම්ප්‍රේෂණය.

(21) **අධ්‍යාපන හා උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශය/ අමාත්‍යාංශ**

වගකීමකින් යුතු අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ පණිවුඩය පුළුල් ලෙස සමාජය වෙත ගෙනයාමට පාසල් ළමුන් හා උසස් අධ්‍යාපන ආයතනයන්හි ශිෂ්‍ය ශිෂ්‍යාවන් දැනුවත් කිරීම සඳහා ජාතික ප්‍රතිපත්තියට, උපායමාර්ගයන්ට හා ක්‍රියාකාරී සැලසුම්වලට අනුකූලව ආංශික/ උප ආංශික ප්‍රතිපත්ති සකස් කිරීම. අපද්‍රව්‍ය කළමනාකරණ අංශයෙහි වෘත්තිකයන් වීම සඳහා පාසල් ළමුන්ගේ හා සිසුන්ගේ ධාරිතා වර්ධනය වන සේ අදාළ විෂයමාලා සකස් කිරීම, වාරික දත්ත එක්රැස් කිරීම, පර්යේෂණ හා සංවර්ධනය, කාර්යසාධන අධීක්ෂණය, ප්‍රතිපෝෂණ ප්‍රවේශය සහිතව ඇගයීම හා වාර්තා කිරීම, ප්‍රතිපෝෂී යාන්ත්‍රණය සහිතව ප්‍රගතිය වාර්තා කිරීම ඇතුළුව තොරතුරු සම්ප්‍රේෂණය.

(22) **ධීවර හා ජලජ සම්පත් විෂය භාර අමාත්‍යාංශය**

ධීවර කටයුතු නිසා සමුද්‍රීය හා වෙරළාසන්න පරිසරයෙහි සහ කලපුවල සිදුවන දූෂණය වැළැක්වීම සඳහා ජාතික ප්‍රතිපත්තිය, උපායමාර්ග සහ ක්‍රියාකාරී සැලසුම්වලට අනුකූලව ආංශික/ උප ආංශික ප්‍රතිපත්ති සකස් කිරීම හා ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීම. වාරික දත්ත එක්රැස් කිරීම, පර්යේෂණ හා සංවර්ධනය, කාර්යසාධන අධීක්ෂණය, ප්‍රතිපෝෂණ ප්‍රවේශය සහිතව ඇගයීම හා වාර්තා කිරීම, ප්‍රතිපෝෂණ යාන්ත්‍රණය සහිතව ප්‍රගතිය ඇතුළුව තොරතුරු සම්ප්‍රේෂණය.

(23) **වෙළෙඳ විෂය භාර අමාත්‍යාංශය**

වෙළෙඳ චක්‍රයේ සහ ක්‍රියාවලියෙහි කොටසක් ලෙස අපද්‍රව්‍ය කළමනාකරණය ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික ප්‍රතිපත්තිය, උපායමාර්ග සහ ක්‍රියාකාරී සැලසුම් හා අනුකූලව අදාළ පාර්ශ්වකාර ආයතන සමග අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික/ උප ආංශික ප්‍රතිපත්ති සකස් කිරීම. නිෂ්පාදකයාගේ විස්තීරණය වූ වගකීම ප්‍රවර්ධනය කිරීම. ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම, වාරික දත්ත එක්රැස් කිරීම, පර්යේෂණ හා සංවර්ධනය, කාර්ය සාධනය අධීක්ෂණය, ප්‍රතිපෝෂණ ප්‍රවේශය සහිතව ඇගයීම හා වාර්තා කිරීම, ප්‍රතිපෝෂණ යාන්ත්‍රණය සහිතව ප්‍රගතිය ඇතුළුව තොරතුරු සම්ප්‍රේෂණය.

(24) **ගුවන් තොටුපොළ හා ගුවන් සේවා පිළිබඳ විෂය භාර අමාත්‍යාංශය**

ගුවන් තොටුපොළ හා ගුවන් සේවාවලදී ජනනය වන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ජාතික ප්‍රතිපත්තියට අනුකූලව උප ආංශික ප්‍රතිපත්ති, උපායමාර්ග සහ

ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම. දත්ත එක්රැස් කිරීම, කාර්යසාධන අධීක්ෂණය හා ඇගයීම, ප්‍රතිපෝෂණ යාන්ත්‍රණය සහිතව ප්‍රගතිය ඇතුළුව තොරතුරු සම්ප්‍රේෂණය.

(ආ) **පළාත් සභා හා පළාත් පාලන ආයතන**

පළාත් සභා

යෝග්‍ය පරිදි ඝන, ද්‍රව සහ වායු අපද්‍රව්‍ය ආවරණය කරමින් ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැපයීම පිණිස පළාත් සභා රේඛීය අමාත්‍යාංශ සමග උපායමාර්ග සහ ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම; කාර්යසාධනය අධීක්ෂණය, වාර්තා කිරීම, ඇගයීම සහ පසුවිපරම් යාන්ත්‍රණ සහිතව වාර්ෂික වාර්තාකරණය; අවශ්‍ය සේවක සංඛ්‍යාව, වාහන, යන්ත්‍රෝපකරණ සහ උපකරණ යනාදී ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අත්‍යාවශ්‍ය සම්පත් පළාත් පාලන ආයතන වෙත සැපයීම පිණිස උපායමාර්ග සහ ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම සහ පළාත් පාලන ආයතනවල ධාරිතාව මත පදනම්ව පරිපාලන, කළමනාකරණ කුසලතා සංවර්ධනය ඇතුළුව වාරිකව කාර්ය මණ්ඩලයේ ධාරිතා වර්ධනය කිරීම; අපද්‍රව්‍ය ගබඩා කිරීම, පිරියම් කිරීම සහ බැහැර කිරීම සඳහා ඉඩම් වැනි යටිතල පහසුකම් සැපයීම; අඛණ්ඩ පදනමකින් පොදු අධ්‍යාපනය සහ දැනුවත්බව ඇති කිරීම; පළාත් පාලන ආයතනවල කාර්යසාධනය අධීක්ෂණය හා ඇගයීම සහ මහජනතාවගේ දැනගැනීම පිණිස වාර්ෂිකව කාර්යසාධනය වාර්තා කිරීම; මනා පරිවයන් පිළිගැනීමට ලක් කිරීම සහ ප්‍රචාරණය පිණිස කාර්යසාධන ඇගයීම් ක්‍රම හඳුන්වාදීම; සුපිරිසිදුම ප්‍රදේශ සහ ඒවායේ තිරසරබව පිළිගැනීමට ලක් කිරීම පිණිස පළාතේ ඇති සුපිරිසිදුම ස්ථාන නම් කිරීම; සේවා සැපයීමේදී වගවීමේ කාර්යසාධානය දැඩිව අධීක්ෂණය සහ ඇගයීම ද සහසම්බන්ධ කරමින් පළාත් පාලන ආයතන සඳහා වාර්ෂිකව ප්‍රමාණවත් අයවැය ප්‍රතිපාදන සහතික කිරීම.

පළාත් පාලන ආයතන

ජාතික ප්‍රතිපත්තියට අනුකූලව මල අපද්‍රව්‍ය ඇතුළුව නාගරික අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා උපායමාර්ග හා ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම සහ ප්‍රාදේශීය, පළාත් සහ ජාතික මට්ටමේදී ඒ ඒ ආයතන සමග සහයෝගිතාවයෙන් යුතුව ජාතික ප්‍රතිපත්තියේ අරමුණු සාක්ෂාත් කරගැනීම පිණිස ප්‍රාදේශීය මට්ටමේදී අපද්‍රව්‍ය කළමනාකරණ අනෙකුත් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැපයීම; අපද්‍රව්‍ය ගබඩා කිරීම, පිරියම් කිරීම සහ බැහැර කිරීම සඳහා ඉඩම් වැනි යටිතල පහසුකම් සැපයීම; මහජනතාවගේ සහයෝගයෙන් ප්‍රදේශයේ පවිත්‍රතාව පවත්වා ගැනීම; පාරිසරික සහ සෞඛ්‍ය ගැටලු සහ මහජන පීඩාවන් ඇති වන පරිදි කිසිදු අපද්‍රව්‍යයක් අවිධිමත්ව බැහැර නොකරන බවට සහතික වීම; තම තමන්ගේ

ප්‍රදේශවල පුරවැසි සහභාගිත්වය උපරිම කිරීම සහ කසල ජනනය අවම කිරීම පිණිස දිරිගැන්වීම් ක්‍රම හඳුන්වා දීම; කාර්යසාධනය අධීක්ෂණය සහ ඇගයීම, ප්‍රතිපෝෂණය වෙත ප්‍රවේශය සහිතව ජාතික බලධාරීන්ට හා මහජනතාවට වාරිකව ප්‍රගතිය වාර්තා කිරීම.

(ඇ) **රාජ්‍ය දෙපාර්තමේන්තු**

1. **වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව**

ජනනය වන ස්ථානයේදී අපද්‍රව්‍ය වැළැක්වීම සහ කළමනාකරණය පිළිබඳ විශේෂ අවධානය සහිතව (උදා: හෝටල්, අනෙකුත් වාණිජ ක්‍රියාකාරකම් ආදිය ඇතුළුව වෙරළ වෙත පැමිණෙන සංචාරකයන්) වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ විෂයපථය තුළ ද්‍රව, ඝන සහ වායු අපද්‍රව්‍ය ඇතුළත්ව සියලු ආකාරයේ අපද්‍රව්‍ය ආවරණය කරමින් කළමනාකරණය/නියාමනය/සම්බන්ධීකරණය සඳහා ජාතික ප්‍රතිපත්තියට අනුකූලව උපායමාර්ග සහ ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම. කාර්යසාධන අධීක්ෂණය, ඇගයීම සහ වාර්තා කිරීම, කාර්යසාධනය පිළිබඳ තොරතුරු සම්ප්‍රේෂණය.

2. **කෘෂිකර්ම/ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

ජාතික සහ ආංශික/උප ආංශික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම; තාක්ෂණික සංවර්ධනය හා පැවැරුම; දත්ත එක්රැස් කිරීම; කාර්යසාධන අධීක්ෂණය හා ඇගයීම, ප්‍රතිපෝෂී යාන්ත්‍රණ සහිතව ප්‍රගතිය ඇතුළුව තොරතුරු වාර්තා කිරීම හා සම්ප්‍රේෂණය,පර්යේෂණ හා සංවර්ධනය.

3. **මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**

ආයු කාලය අවසන් වූ වාහන අපහරණය, වාහන වායු විමෝචන පරීක්ෂා කිරීම් වැඩසටහන ක්‍රියාවට නැංවීම; තාක්ෂණ සංවර්ධනය; පර්යේෂණ හා සංවර්ධනය; කාර්යසාධනය ඇගයීම; ප්‍රතිපෝෂණය වෙත ප්‍රවේශය සහිතව ඇගයීම සහ වාර්තා කිරීම; ප්‍රතිපෝෂී යාන්ත්‍රණ සහිතව ප්‍රගතිය ඇතුළුව තොරතුරු සම්ප්‍රේෂණය.

4. **ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව**

දේශසීමා අතර අපද්‍රව්‍ය ගමනාගමනය පාලනය කිරීම සඳහා සහ, නිෂ්පාදන හා සම්පත් ලෙසට අහවමින් අපද්‍රව්‍ය රට තුළට පැමිණීම සහ වෙනත් නීති විරෝධී ප්‍රවාහන වැළැක්වීම සඳහා උපායමාර්ග, විශේෂිත රෙගුලාසි සැකසීම හා ක්‍රියාත්මක කිරීම.

5. **ශ්‍රී ලංකා රේගුව**

දේශසීමා අතර අපද්‍රව්‍ය ප්‍රවාහනය පාලනය කිරීම සඳහා සහ, නිෂ්පාදන හා සම්පත් ලෙසට අහවමින් අපද්‍රව්‍ය රට තුළට පැමිණීම සහ වෙනත් නීති විරෝධී ප්‍රවාහන වැළැක්වීම සඳහා උපායමාර්ග සැකසීම හා ක්‍රියාත්මක කිරීම.

6. **වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව**

'දූෂකයා විසින් ගෙවනු ලැබීම' හා නිෂ්පාදකයාගේ විස්තීරණ වූ වගකීම යන මූලධර්ම පදනම් කර ගනිමින් අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ජාතික ප්‍රතිපත්තියට අනුකූලව ආංශික/ උප ආංශික ප්‍රතිපත්තීන්, උපායමාර්ග සහ ක්‍රියාකාරී සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැපයීම. ජාත්‍යන්තර වෙළඳාම හරහා ආයු කාලය අවසන් වූ හෝ අවසන් වීමට ආසන්න නිෂ්පාදන රටට ඇතුළුවීම වැළැක්වීම. තාක්ෂණික වැඩිදියුණු කිරීම් හා අනාගත ප්‍රවණතා පිළිබඳ අවධානය යොමු කිරීමෙන් අපද්‍රව්‍ය ජනනය වැළැක්වීම හෝ අවම කිරීම සඳහා උපායමාර්ග සකස් කිරීම. ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීම, වාරික දත්ත එක්රැස් කිරීම, පර්යේෂණ හා සංවර්ධනය, කාර්යසාධන අධීක්ෂණය, ප්‍රතිපෝෂණ ප්‍රවේශය සහිතව ඇගයීම හා වාර්තා කිරීම, ප්‍රතිපෝෂී යාන්ත්‍රණය සහිතව ප්‍රගතිය ඇතුළුව තොරතුරු සම්ප්‍රේෂණය.

7. **පොලිස් දෙපාර්තමේන්තුව (පරිසර පොලිසිය)**

අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් නීති සහ රෙගුලාසි ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැපයීම සහ නීති විරෝධී අපද්‍රව්‍ය බැහැර කිරීම වැළැක්වීම. කාර්යසාධන අධීක්ෂණය හා ඇගයීම, ප්‍රතිපෝෂී යාන්ත්‍රණය සහිතව ප්‍රගතිය ඇතුළුව තොරතුරු සම්ප්‍රේෂණය හා වාර්තා කිරීම.

8. **ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව**

ධීවර කටයුතු නිසා සාගර හා වෙරළ පරිසරයන්හි සහ කලපුවල දූෂණය වැළැක්වීම සඳහා ජාතික ප්‍රතිපත්තියට, උපායමාර්ගයන්ට හා ක්‍රියාකාරී සැලසුම්වලට අනුකූලව ආංශික/ උප ආංශික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැපයීම. වාරික දත්ත එක්රැස් කිරීම, පර්යේෂණ හා සංවර්ධනය, කාර්යසාධන අධීක්ෂණය, ප්‍රතිපෝෂණ ප්‍රවේශය සහිතව ඇගයීම හා වාර්තා කිරීම, ප්‍රතිපෝෂී යාන්ත්‍රණය සහිතව ප්‍රගතිය ඇතුළුව තොරතුරු සම්ප්‍රේෂණය.

(ඇ) ආයතන/ ව්‍යවස්ථාපිත මණ්ඩල

1. **මධ්‍යම පරිසර අධිකාරිය**

සියලු ආකාරයේ අපද්‍රව්‍ය ආවරණය කරමින් ජාතික මට්ටමේදී නීතිය සමස්ත වශයෙන් බලාත්මක කිරීම.

අනෙකුත් නිශ්චිත බැඳීම්

- අන්තරායකාරී අපද්‍රව්‍ය කළමනාකරණය (රෙගුලාසි: සායනික, ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය, කාර්මික රසායන ද්‍රව්‍ය සහ අනෙකුත් කාර්මික අපද්‍රව්‍ය ආවරණය කරමින්)
- බාසල් සම්මුතිය, පූර්ව දැනුම්දීම මගින් එකඟතාවය ලබාගැනීමේ ක්‍රියාවලිය (PIC) පිළිබඳ රොටර්ඩෑම් සම්මුතිය, ජාත්‍යන්තර රසායනික ද්‍රව්‍ය කළමනාකරණය සඳහා වූ උපාය මාර්ගික ප්‍රවේශය (SAICM) සහ අනාගතයේ රජය විසින් තීරණය කරනු ලබන වෙනත් ඕනෑම ජාත්‍යන්තර සම්මුතීන්ට අදාළව ජාතික නිසි බලධාරියා ලෙස සිය බැඳීම් ඉටු කිරීම.

2. බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය

බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරි පනත සහ ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව බස්නාහිර පළාත තුළ අපද්‍රව්‍ය කළමනාකරණය.

3. පාරිභෝගික කටයුතු අධිකාරිය

වෙළඳ චක්‍රය තුළ අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රතිපත්ති, උපායමාර්ග, ක්‍රියාකාරී සැලසුම් සහ නීති ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැපයීම. වාරික දත්ත එක්රැස් කිරීම, පර්යේෂණ හා සංවර්ධනය, කාර්යසාධන අධීක්ෂණය, ප්‍රතිපෝෂණ ප්‍රවේශය සහිතව ඇගයීම හා වාර්තා කිරීම, ප්‍රතිපෝෂී යාන්ත්‍රණය සහිතව ප්‍රගතිය ඇතුළුව තොරතුරු සම්ප්‍රේෂණය.

4. සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය

ජාතික ප්‍රතිපත්තිය, උපායමාර්ග සහ ක්‍රියාකාරී සැලසුම්වලට අනුකූලව ආංශික/ උප ආංශික ප්‍රතිපත්ති සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීම, දත්ත එක්රැස් කිරීම, කාර්යසාධන අධීක්ෂණය හා ඇගයීම, ප්‍රතිපෝෂණ යාන්ත්‍රණය සහිතව ප්‍රගතිය ඇතුළුව තොරතුරු වාර්තා කිරීම සහ සම්ප්‍රේෂණය.

MARPOL සම්මුතිය ක්‍රියාත්මක කිරීම

5. **සුනිත්‍ය බලශක්ති අධිකාරිය**

ආයු කාලය අවසන් වූ සූර්ය පැනල කළමනාකරණය සඳහා ජාතික ප්‍රතිපත්තිය, උපායමාර්ග සහ ක්‍රියාකාරී සැලසුම්වලට අනුකූලව ආංශික/ උප ආංශික ප්‍රතිපත්ති සකස් කිරීම. තාක්ෂණික වැඩිදියුණු කිරීම් හා අනාගත ප්‍රවණතා පිළිබඳ අවධානය යොමු කරමින් අපද්‍රව්‍ය ජනනය වැළැක්වීම හෝ අවම කිරීම සඳහා ප්‍රතිපත්ති සකස් කිරීම. ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීම, වාරික දත්ත එක්රැස් කිරීම, පර්යේෂණ හා සංවර්ධනය, කාර්යසාධන අධීක්ෂණය, ප්‍රතිපෝෂණ ප්‍රවේශය සහිතව ඇගයීම හා වාර්තා කිරීම, ප්‍රතිපෝෂණ යාන්ත්‍රණය සහිතව ප්‍රගතිය ඇතුළුව තොරතුරු සම්ප්‍රේෂණය.

6. **නාගරික සංවර්ධන අධිකාරිය**

නාගරික සැලසුම්කරණයේදී අපද්‍රව්‍ය කළමනාකරණයට යටිතල පහසුකම් සැපයීම; ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැපයීම; දත්ත එක්රැස් කිරීම, කාර්යසාධනය ඇගයීම හා අධීක්ෂණය; ප්‍රතිපෝෂී යාන්ත්‍රණය සහිතව ප්‍රගතිය ඇතුළුව තොරතුරු වාර්තා කිරීම හා සම්ප්‍රේෂණය, පවිත්‍රතාවය සහ සෞන්දර්යාත්මක දර්ශන පථය පිළිබඳ ප්‍රකාශනය.

7. **පොහොර ලේකම් කාර්යාලය**

අන්තරායකාරී අපද්‍රව්‍ය අවම කිරීම පිණිස පොහොර භාවිතය නියාමනය කිරීම (විෂ අපද්‍රව්‍ය පොහොර සමග මිශ්‍ර කොට ඇත)

8. **පළිබෝධ නාශක ලියාපදිංචි කිරීමේ කාර්යාලය**

ජාතික ප්‍රතිපත්තිය, උපායමාර්ග සහ ක්‍රියාකාරී සැලසුම් හා අනුකූලව අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික/ උප ආංශික ප්‍රතිපත්ති සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැපයීම, දත්ත එක් රැස් කිරීම, කාර්යසාධන අධීක්ෂණය හා ඇගයීම, ප්‍රතිපෝෂණ යාන්ත්‍රණ සහිතව ප්‍රගතිය ඇතුළුව තොරතුරු වාර්තා කිරීම හා සම්ප්‍රේෂණය.

පූර්ව දැනුම්දීම මගින් එකඟතාවය ලබාගැනීමේ ක්‍රියාවලිය (PIC) පිළිබඳ රොටර්ඩෑම් සම්මුතිය ක්‍රියාත්මක කිරීම.

9. **ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති අධිකාරිය/ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව**

පරමාණුක අපද්‍රව්‍ය පිරියම් කිරීමේ පහසුකම් ස්ථාපිත කිරීමේදී මාර්ගෝපදේශ සැපයීම, කාර්යසාධනය ඇගයීම සහ වාර්තා කිරීම, පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති සහිතව මාර්ගෝපදේශ සැපයීම

10. **ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය**

පල්දෝරු හා අපජලය පිරියම් කිරීම සඳහා යටිතල පහසුකම් සංවර්ධනය, කාර්යසාධන අධීක්ෂණය, ප්‍රතිපෝෂණ යාන්ත්‍රණය සහිතව කාර්යසාධනය ඇගයීම හා අධීක්ෂණය.

11. **රාජ්‍ය ඖෂධ සංස්ථාව**

කල් ඉකුත් වූ ඖෂධ නිෂ්පාදන අපද්‍රව්‍ය ආරක්ෂිත කළමනාකරණය, පිරියම් කිරීම හා අවසන් බැහැර කිරීම සඳහා අවශ්‍ය උපායමාර්ග සකස් කිරීම. ඖෂධ නිෂ්පාදනයේදී පාරිසරික ආරක්ෂණ තහවුරු කිරීම (අපජලය පිරියම් කිරීම වැනි).

12. **ලංකා විදුලිබල මණ්ඩලය**

අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අදාළ ආංශික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය හා නඩත්තුව, කාර්ය මණ්ඩලයේ ධාරිතා වර්ධනය, දත්ත එක්රැස් කිරීම, අධීක්ෂණය සහ ඇගයීම හා වාරිකව වාර්තා කිරීම.

13. **කාර්මික සංවර්ධන මණ්ඩලය**

ජාතික ප්‍රතිපත්තිය හා අනුකූලව අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ සියලු පවත්නා සහ ඉදිරියට ක්‍රියාත්මක කිරීම නියමිත ව්‍යාපෘතින්ට අපද්‍රව්‍ය කළමනාකරණය ඇතුළුව මනා පාරිසරික පරිවයන් ඒකාබද්ධ කිරීම සඳහා පහසුකම් සැපයීම; අපද්‍රව්‍ය හුවමාරු වැඩසටහන්; කර්මාන්ත සඳහා ධාරිතා, තාක්ෂණික ක්‍රම හා පර්යේෂණ සංවර්ධනය, දත්ත එක්රැස් කිරීම, නිරසාර කාර්මික සංවර්ධනය සඳහා නියාමනය හා ඇගයීම වැඩිදියුණු කිරීම.

14. **ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය**

අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීම; යටිතල පහසුකම් සංවර්ධනය; අපද්‍රව්‍ය හුවමාරු වැඩඩසටහන් ප්‍රවර්ධනය කිරීම; ව්‍යාපෘති සැලසුම්කරණයේදී සහ සකස් කිරීමේදී මූලික පූර්ව අවශ්‍යතාවයක් ලෙස කසළ කළමනාකරණය ඒකාබද්ධ කිරීම; කර්මාන්ත පොකුරුගත කිරීම සහ පොදු පිරියම් පහසුකම් සංවර්ධනය සඳහා සහාය ලබා දීම; ධාරිතා වර්ධනය; තාක්ෂණික සංවර්ධනය සහ පැවැරුම්; පර්යේෂණ හා සංවර්ධනය; අපද්‍රව්‍ය ආශ්‍රිත දත්ත එක්රැස් කිරීම; කාර්යසාධන අධීක්ෂණය සහ ඇගයීම, ප්‍රතිපෝෂී යාන්ත්‍රණය සහිතව කාර්යසාධනය වාර්තා කිරීම; මනා පරිවයන් පිළිගැනීම සහ ප්‍රකාශයට පත් කිරීම, මනා පරිවයන් සඳහා ප්‍රතිලාභ ලබා දීම.

15. **වරාය අධිකාරිය**

සමුද්‍ර හා වෙරළ පරිසර පද්ධති දූෂණය වීම වැළැක්වීම සඳහා ජාතික ප්‍රතිපත්තිය, උපායමාර්ග සහ ක්‍රියාකාරී සැලසුම්වලට අනුකූලව අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික/ උප ආංශික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම. වාරික දත්ත එක්රැස් කිරීම, පර්යේෂණ හා සංවර්ධනය, කාර්යසාධන අධීක්ෂණය, ප්‍රතිපෝෂණ ප්‍රවේශය සහිතව ඇගයීම හා වාර්තා කිරීම, ප්‍රතිපෝෂණ යාන්ත්‍රණ සහිතව ප්‍රගතිය ඇතුළුව තොරතුරු සම්ප්‍රේෂණය.

16. **වයඹ පළාත් පරිසර අධිකාරිය**

ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව වයඹ පළාත තුළ නීතිය බලාත්මක කිරීම.

17. **ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය**

අපද්‍රව්‍ය ආශ්‍රිත නිෂ්පාදන ඇතුළත්ව ප්‍රතිචක්‍රීකරණය කළ හා නැවත භාවිත කරන නිෂ්පාදනවල හා ඇසුරුම්වල තත්ත්ව සහතික කිරීම සඳහා අවශ්‍ය ප්‍රමිතීන් සකස් කිරීම. පරිසර හිතකාමී නිෂ්පාදන සඳහා ප්‍රමිතීන් සකස් කිරීම.

18. **කාර්මික තාක්ෂණ ආයතනය**

ප්‍රතිචක්‍රීකරණය කළ නිෂ්පාදන හා ඇසුරුම්වල තත්ත්ව සහතික කිරීම සඳහා අවශ්‍ය පරීක්ෂණ පහසුකම් සැපයීම. අපද්‍රව්‍ය මගින් ජල ප්‍රභව හා භූමිය දූෂණය වීම පරීක්ෂා කිරීම සඳහා පරීක්ෂණ පහසුකම් සැපයීම.

19. **ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය**

ජාතික ප්‍රතිපත්තියට අනුකූලව ඉදිකිරීම් හා බිඳ හෙළීම් අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම. ධාරිතා වර්ධනය, තාක්ෂණික සංවර්ධනය, පර්යේෂණ හා සංවර්ධනය, අපද්‍රව්‍ය පිළිබඳ දත්ත එක්රැස් කිරීම, කාර්යසාධන අධීක්ෂණය, ප්‍රතිපෝෂී යාන්ත්‍රණ සහිතව කාර්යසාධනය වාර්තා කිරීම, මනා පරිවයන් පිළිගැනීමට ලක් කිරීම හා ප්‍රකාශනය, මනා පරිවයන් සඳහා ප්‍රතිලාභ ලබාදීම.

20. **විශ්වවිද්‍යාල සහ පර්යේෂණ ආයතන**

ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීම. අපද්‍රව්‍ය කළමනාකරණයට අවශ්‍ය මානව සම්පත් සංවර්ධනය, අපද්‍රව්‍ය ආශ්‍රිත දත්ත එක්රැස්

කිරීම, කාර්යසාධන අධීක්ෂණය හා ඇගයීම, ප්‍රතිපෝෂණ යාන්ත්‍රණ සහිතව කාර්යසාධනය වාර්තා කිරීම. මනා පරිවයන් සඳහා ප්‍රතිලාභ ලබා දීම, දැනුම බෙදා හැරීම හා පර්යේෂණ පැවැත්වීම සඳහා අපද්‍රව්‍ය කළමනාකරණ මනා පරිවයන් පිළිබඳ මොඩලයන්/ආකෘති විශ්වවිද්‍යාල තුළ ගොඩනැගීම.

21. මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය

ඉදිකිරීම් ක්ෂේත්‍රයේ අපජලය, පල්දෝරු සහ අනෙකුත් ද්‍රව අපද්‍රව්‍ය ඇතුළුව අපද්‍රව්‍ය කළමනාකරණයෙහිලා ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම. කාර්යසාධන අධීක්ෂණය හා ඇගයීම, ප්‍රතිපෝෂණ යාන්ත්‍රණ සහිතව කාර්යසාධනය වාර්තා කිරීම. මනා පරිවයන් පිළිගැනීමට ලක් කිරීම හා ප්‍රකාශනය, මනා පරිවයන් සඳහා ප්‍රතිලාභ ලබාදීම.

22. විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

ආයු කාලය අවසන් වූ සන්නිවේදන උපකරණ කළමනාකරණය සඳහා ජාතික ප්‍රතිපත්තිය, උපාය මාර්ග සහ ක්‍රියාකාරී සැලසුම්වලට අනුකූලව ආංශික/ උප ආංශික ප්‍රතිපත්ති සකස් කිරීම. තාක්ෂණික වැඩිදියුණු කිරීම් හා අනාගත ප්‍රවණතා පිළිබඳ අවධානය යොමු කිරීමෙන් අපද්‍රව්‍ය ජනනය වැළැක්වීම හෝ අවම කිරීම සඳහා ප්‍රතිපත්ති සකස් කිරීම. පර්යේෂණ හා සංවර්ධනය.

23. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

ආපදා තත්ත්වයන්වලදී ජනනය වන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම පිණිස ජාතික ප්‍රතිපත්තිය, උපායමාර්ග සහ ක්‍රියාකාරී සැලසුම්වලට අනුකූලව අදාළ පාර්ශ්වකාර ආයතනයන්හි සහයෝගිත්වය ඇතිව අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික/ උප ආංශික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැපයීම. හදිසි පෙර සුදානම් කිරීමේ සැලසුම් සකස් කිරීම සහ ඒවායේ ඵලදායිතාව කලානුරූපීව නියාමනය හා පරීක්ෂා කිරීම. අවදානම අඩු කිරීම සඳහා අදාළ දත්ත එක්රැස් කිරීම, පර්යේෂණ හා සංවර්ධනය, කාර්යසාධන අධීක්ෂණය, ප්‍රතිපෝෂණ ප්‍රවේශය සහිතව ඇගයීම හා වාර්තා කිරීම, ප්‍රතිපෝෂණ යාන්ත්‍රණය සහිතව ප්‍රගතිය ඇතුළුව තොරතුරු සම්ප්‍රේෂණය.

24. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

සංචාරක කර්මාන්තය ආශ්‍රිතව ජනනය වන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ජාතික ප්‍රතිපත්තිය, උපාය මාර්ග සහ ක්‍රියාකාරී සැලසුම්වලට අනුකූලව අදාළ

පාර්ශ්වකරුවන් සමග සහයෝගිත්වයෙන් ආංශික/ උප ආංශික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැපයීම, අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ වගකීම් දරන ජනතාවක් සිටින රටක් ලෙස ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය නංවාලීම සඳහා කටයුතු කිරීම. වාරික දත්ත එක් රැස් කිරීම, පර්යේෂණ හා සංවර්ධනය, කාර්යසාධන අධීක්ෂණය, ප්‍රතිපෝෂණ ප්‍රවේශය සහිතව ඇගයීම හා වාර්තා කිරීම, ප්‍රතිපෝෂී යාන්ත්‍රණය සහිතව ප්‍රගතිය ඇතුළුව තොරතුරු සම්ප්‍රේෂණය.

25. **ඛනිජ තෙල් සංස්ථාව**

පෙට්‍රෝලියම් අවශේෂ මගින් ඇතිවිය හැකි ජල ප්‍රභව හා භූමි අපවිත්‍රවීම වැළැක්වීම සඳහා ජාතික ප්‍රතිපත්තියට අනුකූලව ආංශික/ උප ආංශික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැපයීම. කාර්යසාධන අධීක්ෂණය හා ඇගයීම, ප්‍රතිපෝෂණ යාන්ත්‍රණ සහිතව කාර්යසාධනය වාර්තා කිරීම. මනා පරිවයන් පිළිගැනීමට ලක් කිරීම හා ප්‍රකාශනය, මනා පරිවයන් සඳහා ප්‍රතිලාභ ලබාදීම.

වෙනත්

(අ) රාජ්‍ය නොවන සංවිධාන, ප්‍රජා මූල සංවිධාන, පුරවැසි කණ්ඩායම් සහ පොදුවේ මහජනතාව

සුදුසු මට්ටම්වලදී ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම; ස්වායීන අධීක්ෂණය, ඇගයීම, වාර්තා කිරීම හා ප්‍රතිපෝෂණය; අනුකූලතාවයට සහයෝගය දැක්වීම; අනනුකූලත්වය වැළැක්වීම මෙන්ම උචිත පරිදි ගැටුම් සහ බාධාකිරීම් වැළැක්වීම පිණිස මැදිහත්කරුවන් ලෙස කටයුතු කිරීම.

(ආ) **පුද්ගලික අංශය**

සියලු මට්ටම්වලදී අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා විධිවිධාන එක් කිරීම, තාක්ෂණ සංවර්ධනය සහ පැවැරුම් ප්‍රවර්ධනය කිරීම; අනුකූලතාවයෙන් ඔබ්බට ගමන් කරමින් ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය - පුද්ගලික ආංශික ආදාන පිළිබඳ කාර්යසාධන අධීක්ෂණය හා ඇගයීම; මනා පරිවයන් ප්‍රකාශයට පත්කිරීම, අපද්‍රව්‍ය කළමනාකරණයෙහිලා රාජ්‍ය-පුද්ගලික සහයෝගිත්වයන්ට සහාය දැක්වීම.

අපද්‍රව්‍ය ධාරාවන් හා සම්බන්ධ පාර්ශවකාර සබඳතා

පොදු සහ විශේෂිත ප්‍රතිපත්ති	**වගකීම**
සමස්ත පාරිසරික කරුණු	පරිසර අමාත්‍යාංශය / මධ්‍යම පරිසර අධිකාරිය
ඝන, ද්‍රව සහ වායු අපද්‍රව්‍ය ආවරණය කරන්නාවූ ප්‍රතිපත්ති	
ඝන අපද්‍රව්‍ය	
නාගරික අපද්‍රව්‍ය	**පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, සියලුම පළාත් සභා සහ පළාත් පාලන ආයතන, බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය,** වයඹ පළාත් පරිසර අධිකාරිය, මධ්‍යම පරිසර අධිකාරිය, සෞඛ්‍ය අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය, දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය, පරිසර අමාත්‍යාංශය, නගර සැලසුම් හා සංවර්ධන අමාත්‍යාංශය, නාගරික සංවර්ධන අධිකාරිය, පරිසර පොලීසිය
ඇසුරුම් අපද්‍රව්‍ය	**පරිසර අමාත්‍යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය, ශ්‍රී ලංකා ඇසුරුම් ආයතනය, පාරිභෝගික කටයුතු අධිකාරිය,** පාරිභෝගික ආරක්ෂණ අධිකාරිය, සෞඛ්‍ය **අමාත්‍යාංශය,** ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, කාර්මික නාක්ෂණ ආයතනය, සියලුම පළාත් සභා සහ පළාත් පාලන ආයතන, පරිසර අමාත්‍යාංශය, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
කාර්මික අපද්‍රව්‍ය	**කර්මාන්ත සහ වාණිජ කටයුතු අමාත්‍යාංශය, ව්‍යවසාය සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය, වෙළඳ අමාත්‍යාංශය, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය,** මධ්‍යම පරිසර අධිකාරිය, පරිසර අමාත්‍යාංශය, කර්මාන්ත සංවර්ධන මණ්ඩලය, ලංකා විදුලිබල මණ්ඩලය, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය, ශ්‍රී ලංකා රේගුව, ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව
ඉදිකිරීම් සහ බිඳ හෙළීම් අපද්‍රව්‍ය	**මධ්‍යම පරිසර අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය, සියලුම පළාත් පාලන ආයතන,** ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ආයතන, මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය, පරිසර අමාත්‍යාංශය

ඝන අපද්‍රව්‍ය	
සෞඛ්‍ය සේවා අපද්‍රව්‍ය	**සෞඛ්‍ය/දේශීය වෛද්‍ය අමාත්‍යාංශය , ආයුර්වේද දෙපාර්තමේන්තුව,** මධ්‍යම පරිසර අධිකාරිය, බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය, සියලුම පළාත් සභා සහ පළාත් පාලන ආයතන, වෛද්‍ය හා ඒ ආශ්‍රිත පීඨ, පශු වෛද්‍ය ආයතන/ සායන, රාජ්‍ය ඖෂධ සංස්ථාව, සෞඛ්‍ය මධ්‍යස්ථාන, අනෙකුත් සෞඛ්‍ය සේවා ආයතන, පරිසර අමාත්‍යාංශය
විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය	**පරිසර අමාත්‍යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය, විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව,** ශ්‍රී ලංකා අයෝජන මණ්ඩලය, කර්මාන්ත සහ වාණිජ කටයුතු අමාත්‍යාංශය, විදුලි සංදේශ විෂය භාර අමාත්‍යාංශය, ශ්‍රී ලංකා රේගුව, ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව, අධ්‍යාපන/ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, සියලුම විශ්වවිද්‍යාල සහ අධ්‍යාපන ආයතන, සියලුම පළාත් සභා සහ පළාත් පාලන ආයතන
විකිරණශීලී අපද්‍රව්‍ය (ඝන ආකාරයේ)	**ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය, ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව,** මධ්‍යම පරිසර අධිකාරිය, පරිසර අමාත්‍යාංශය, ශ්‍රී ලංකා රේගුව, ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය/දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
සමුද්‍රීය අපද්‍රව්‍ය	**සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය,** මධ්‍යම පරිසර අධිකාරිය, වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, වරාය අධිකාරිය
ආහාර, කෘෂිකර්ම සහ පශු සම්පත් අපද්‍රව්‍ය	**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පළිබෝධ නාශක ලියාපදිංචි කිරීමේ කාර්යාලය,** කෘෂිකර්ම අමාත්‍යාංශය, පළාත් පාලන ආයතන, පාරිභෝගික කටයුතු අධිකාරිය, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, සෞඛ්‍ය/ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, පරිසර අමාත්‍යාංශය, සංචාරක අමාත්‍යාංශය, ලංකා හෝටල් සංස්ථාව, සංචාරක මණ්ඩලය, පොහොර ලේකම් කාර්යාලය

ද්‍රව අපද්‍රව්‍ය	
පල්දෝරු හා අපජලය	**ජලසම්පාදන හා ජලාපවාහන විෂය භාර අමාත්‍යාංශය, ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය, පළාත් පාලන ආයතන**, මධ්‍යම පරිසර අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය, මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය, වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය, දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, පරිසර අමාත්‍යාංශය, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය, පළාත් සභා
කාර්මික අපද්‍රව්‍ය/ රසායනික අපද්‍රව්‍ය/ ක්ෂරීත සහ වාහන සේවා මධ්‍යස්ථාන අපවාහ	මධ්‍යම පරිසර අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, කර්මාන්ත සහ වාණිජ කටයුතු අමාත්‍යාංශය, වෙළඳ අමාත්‍යාංශය, ව්‍යවසාය සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, කර්මාන්ත සංවර්ධන මණ්ඩලය, විද්‍යා,තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය, වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, පර්යේෂණ ආයතන, විද්‍යාගාර , කෘෂිකර්ම අමාත්‍යාංශය , සියලු වාහන සේවා මධ්‍යස්ථාන, පරිසර අමාත්‍යාංශය
පෙට්‍රෝලියම් අවශේෂ, සෞඛ්‍ය සේවා අපද්‍රව්‍ය අපවහන, කෘෂිරසායනික සහ අනෙකුත් පැන නැගිය හැකි දූෂක මගින් ගලා යන ජලය අපිරිසිදු වීම	කෘෂිකර්ම අමාත්‍යාංශය, පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය, ලංකා ඛනිජ නීතිගත තෙල් සංස්ථාව, මධ්‍යම පරිසර අධිකාරිය, සෞඛ්‍ය/ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, පළාත් පාලන ආයතන, පරිසර අමාත්‍යාංශය, පොහොර ලේකම් කාර්යාලය
ආහාර සැකසුම් ආයතන, සහ මුළුතැන් ගේ අපද්‍රව්‍ය (ධූසර ජලය)	**මධ්‍යම පරිසර අධිකාරිය,** ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය, **පළාත් පාලන ආයතන,** නාගරික සංවර්ධන අධිකාරිය, සෞඛ්‍ය/ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, පළාත් සභා, සංචාරක අමාත්‍යාංශය, හෝටල් කර්මාන්ත ක්ෂේත්‍රය, ලංකා හෝටල් සංස්ථාව, පරිසර අමාත්‍යාංශය
විකිරණශීලී අපද්‍රව්‍ය (ද්‍රව ආකාර)	ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය, ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව, මධ්‍යම පරිසර අධිකාරිය, පරිසර අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය

වායු අපද්‍රව්‍ය	
කාර්මික	පරිසර අමාත්‍යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය, කර්මාන්ත සහ වාණිජ කටයුතු අමාත්‍යාංශය, ව්‍යවසාය සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය, වෙළඳ අමාත්‍යාංශය, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, කර්මාන්ත සංවර්ධන මණ්ඩලය, පළාත් පාලන ආයතන, පළාත් සභා, ලංකා විදුලිබල මණ්ඩලය, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය
වාහන	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ප්‍රවාහන අමාත්‍යාංශය, ගුවන්තොටුපල හා ගුවන්සේවා අමාත්‍යාංශය, පරිසර අමාත්‍යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය
දාහක (Incinerators)	මධ්‍යම පරිසර අධිකාරිය, කර්මාන්ත සහ වාණිජ කටයුතු අමාත්‍යාංශය, සෞඛ්‍ය/ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, පළාත් පාලන ආයතන, පෞද්ගලික අංශය සහ වෙනත් සේවා සැපයුම් ආයතන, පරිසර අමාත්‍යාංශය
බිම් පිරවුම්	**මධ්‍යම පරිසර අධිකාරිය, පළාත් පාලන ආයතන, නාගරික සංවර්ධන අධිකාරිය,** පළාත් සභා, පරිසර අමාත්‍යාංශය, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
පූනික ටැංකි/ පල්දෝරු පිරියම් කිරීමේ යන්ත්‍රාගාර	**ජානික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය, පළාත් පාලන ආයතන, මධ්‍යම පරිසර අධිකාරිය,** පුද්ගලික අංශය සහ එම සේවා සපයන වෙනත් ආයතන, මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය, මහජන සෞඛ්‍ය පරීක්ෂක, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී, පරිසර අමාත්‍යාංශය
විවෘත දහනය	**මධ්‍යම පරිසර අධිකාරිය, පළාත් පාලන ආයතන,** මහජන සෞඛ්‍ය පරීක්ෂක, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී, පරිසර අමාත්‍යාංශය, පරිසර පොලිසිය
නැව් හා සමුද්‍රීය / ධීවර අපද්‍රව්‍ය	**සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය,** ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය, වරාය අධිකාරිය

කුඩා පරිමාණ අන්තරායකාරී කර්මාන්ත	**මධ්‍යම පරිසර අධිකාරිය, පරිසර අමාත්‍යාංශය, කර්මාන්ත සහ වාණිජ කටයුතු අමාත්‍යාංශය,** පළාත් පාලන ආයතන
අනෙකුත් ආයතනික, පරිපාලන සහ කළමනාකරණ අංශ යටතේ වන පොදු ප්‍රතිපත්ති	
දැනුම කළමනාකරණය හා ධාරිතාව ගොඩනැංවීම	
අධ්‍යාපනය සහ දැනුවත්බව ඇති කිරීම	**පරිසර අමාත්‍යාංශය, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, අධ්‍යාපන/ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය,** ජනමාධ්‍ය අමාත්‍යාංශය
නිපුණතා සංවර්ධනය, පුහුණුව, පර්යේෂණ සහ සංවර්ධනය	**පරිසර අමාත්‍යාංශය, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, ජනමාධ්‍ය අමාත්‍යාංශය, පුහුණු පිළිබඳ යෝජිත ආයතනය,** තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිසම
තාක්ෂණ සංවර්ධනය, භාවිතය සහ හුවමාරුව	පරිසර අමාත්‍යාංශය, **විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය, මුදල් අමාත්‍යාංශය,** කර්මාන්ත සංවර්ධන හා වාණිජ කටයුතු අමාත්‍යාංශය, ව්‍යවසාය සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය, වෙළඳ අමාත්‍යාංශය, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය, කෘෂිකර්ම අමාත්‍යාංශය, ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය, විදේශ කටයුතු අමාත්‍යාංශය, ජාතික සුපිරිසිදු නිෂ්පාදන මධ්‍යස්ථානය, මධ්‍යම පරිසර අධිකාරිය
යටිතල පහසුකම් සංවර්ධනය	**පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, නාගරික සංවර්ධන අධිකාරිය, නාගරික සැලසුම් හා සංවර්ධන අමාත්‍යාංශය, ජල සම්පාදන හා ජලාපවාහන අමාත්‍යාංශය, පරිසර අමාත්‍යාංශය, කර්මාන්ත සංවර්ධන හා වාණිජ කටයුතු අමාත්‍යාංශය, වෙළඳ අමාත්‍යාංශය, ව්‍යවසාය සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය, සෞඛ්‍ය/දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,** ජල සම්පාදන හා ජලාපවාහන අමාත්‍යාංශය, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය, පළාත් සභා, පළාත් පාලන ආයතන

අනෙකුත් සහායක ප්‍රතිපත්ති සහ ජාතික ක්‍රියාකාරී සැලසුම් හා ඒකාබද්ධ කිරීම	**පරිසර අමාත්‍යාංශය, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය,** සෞඛ්‍ය/ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය, ධීවර අමාත්‍යාංශය, සංචාරක අමාත්‍යාංශය
ආයතනික යාන්ත්‍රණ, සම්බන්ධීකරණය හා සන්නිවේදනය	
ජාතික, පළාත් සහ පළාත් පාලන මට්ටම්	**පරිසර අමාත්‍යාංශය, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය,** පළාත් සභා, පළාත් පාලන ආයතන, විදේශ කටයුතු අමාත්‍යාංශය, බහු පාර්ශවික පාරිසරික ගිවිසුම් වල කේන්ද්‍රීය ස්ථාන, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය, ජනමාධ්‍ය අමාත්‍යාංශය සහ අනෙකුත් වගකිව යුතු ප්‍රමුඛ ආයතන
රාජ්‍ය හා පුද්ගලික අංශය	**පරිසර අමාත්‍යාංශය, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය සෞඛ්‍ය අමාත්‍යාංශය, කර්මාන්ත සංවර්ධන හා වාණිජ කටයුතු අමාත්‍යාංශය, ව්‍යවසාය සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය, වෙළඳ අමාත්‍යාංශය, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය, ජනමාධ්‍ය අමාත්‍යාංශය** සහ අනෙකුත් වගකිව යුතු ප්‍රමුඛ ආයතන
රාජ්‍ය නොවන සංවිධාන සහ ප්‍රජා සංවිධාන	**පරිසර අමාත්‍යාංශය, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය,** සහ අනෙකුත් වගකිව යුතු ප්‍රමුඛ ආයතන
හවුල්කාරිත්ව ගොඩනැගීම	**පරිසර අමාත්‍යාංශය, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය,** සහ අනෙකුත් වගකිව යුතු ප්‍රමුඛ ආයතන
ආපදා අවස්ථාවන්හිදී පිරිසිදු කිරීම් සහ කසල කළමනාකරණය	**පරිසර අමාත්‍යාංශය, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය,** සෞඛ්‍ය/ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, ආරක්ෂක අමාත්‍යාංශය

පසුවිපරම්, ඇගයීම, ප්‍රතිපෝෂණය සහ වාර්තාකරණ	
අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාවලි/පද්ධති කාර්යසාධනය	**පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, පරිසර අමාත්‍යාංශය, සෞඛ්‍ය/ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, කර්මාන්ත සංවර්ධන හා වාණිජ කටයුතු අමාත්‍යාංශය, ව්‍යවසාය සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය, වෙළඳ අමාත්‍යාංශය,** මධ්‍යම පරිසර අධිකාරිය, පළාත් සභා, පළාත් පාලන ආයතන, අනෙකුත් වගකිව යුතු ප්‍රමුඛ ආයතන
අපද්‍රව්‍ය කළමනාකරණ ආයතනයන්හි සහ සේවා සපයන්නන්ගේ කාර්ය සාධනය	**පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, පරිසර අමාත්‍යාංශය, සෞඛ්‍ය/ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, කර්මාන්ත සංවර්ධන හා වාණිජ කටයුතු අමාත්‍යාංශය, ව්‍යවසාය සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය, වෙළඳ අමාත්‍යාංශය,** මධ්‍යම පරිසර අධිකාරිය, පළාත් සභා, පළාත් පාලන ආයතන, අනෙකුත් වගකිව යුතු ප්‍රමුඛ ආයතන
බලාත්මක කිරීමේ ආයතනවල කාර්යසාධනය	**පරිසර අමාත්‍යාංශය, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය, පරිසර පොලීසිය,** පළාත් සභා, පළාත් පාලන ආයතන
මහජනතාව , සිවිල් සංවිධාන, ප්‍රජා සංවිධාන, ප්‍රජා නියෝජිතයින්ගේ දායකත්වය සහ කෘත්තිමත්බව	**පරිසර අමාත්‍යාංශය, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, ජනමාධ්‍ය අමාත්‍යාංශය,** පළාත් සභා, පළාත් පාලන ආයතන, සිවිල් සංවිධාන සහ අනෙකුත් වගකිව යුතු ප්‍රමුඛ ආයතන
රටෙහි පිරිසිදුකම සහ සෞන්දර්ය	**නාගරික සංවර්ධන අධිකාරිය, පළාත් පාලන ආයතන, පරිසර අමාත්‍යාංශය, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය, ජනමාධ්‍ය අමාත්‍යාංශය සහ අනෙකුත් වගකිව යුතු ප්‍රමුඛ ආයතන**

පසුවිපරම්, ඇගයීම, ප්‍රතිපෝෂණය සහ වාර්තාකරණ	
නීති සහ බලාත්මක කිරීමේ යාන්ත්‍රණය	**පරිසර අමාත්‍යාංශය, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය, පරිසර පොලීසිය, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය**
මූල්‍ය යාන්ත්‍රණය සහ මූල්‍යමය නොවන දිරිගැන්වීම්	**මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය, පරිසර අමාත්‍යාංශය, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව සහ අනෙකුත් වගකිව යුතු ප්‍රමුඛ ආයතන**
අන්තර්ජාතික ගිවිසුම් සහ සම්මුති වලට අනුකූල වීම	**පරිසර අමාත්‍යාංශය, සහ බහු පාර්ශවීය පාරිසරික ගිවිසුම් සඳහා වන කේන්ද්‍රීය මධ්‍යස්ථාන**
ඉදිරි ක්‍රියාමාර්ග	**පරිසර අමාත්‍යාංශය, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, අනෙකුත් වගකිව යුතු ප්‍රමුඛ ආයතන**

සටහන 1 : වගකිව යුතු ප්‍රමුඛ ආයතන තදකුරු කර දක්වා ඇත. ලැයිස්තුගත කර නොමැති එහෙත් අදාළ ආයතන ඉහත සඳහන් අදාළ ප්‍රමුඛ ආයතන මගින් සම්බන්ධීකරණය කෙරෙනු ඇත.

සටහන 2 : අපද්‍රව්‍ය කළමනාකරණයෙහිලා පරිසර පොලීසිය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. වගකිව යුතු ප්‍රමුඛ ආයතන මගින් අදාළ පනත් හරහා එහි විභවය පුළුල් කළ යුතුය.

සටහන 3 : ආරක්ෂක අමාත්‍යාංශය ආපදා තත්ත්වයන් කළමනාකරණයෙහිලා ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. ආපදා අවස්ථාවන්හි දී ප්‍රමුඛ ආයතන මගින් අදාළ පනත් හරහා සුදුසු පරිදි එහි විභවය පුළුල් කළ යුතුය.

ඇමුණුම 2

නිර්වචන

මෙම ප්‍රතිපත්තියෙහි **අපද්‍රව්‍ය** යනුවෙන් හඳුන්වන්නේ තව දුරටත් අවශ්‍ය නොවේයැයි සලකමින් යම්කිසි වේලාවකදී හෝ යම්කිසි ස්ථානයකින් ඉවත්කරනා හෝ ඉවතලන, එහෙයින් සම්පතක් ලෙස භාවිත කළ හැකි නැතහොත් උපයෝජ්‍යතා වටිනාකමක් නොමැත්තේ නම් පිරියම් කිරීමෙන් පරිසර හිතකාමී ලෙස බැහැර කළ හැකි කිසියම් ද්‍රව්‍යයක් හෝ අතුරුඵලයක් වේ.

ජාතික පාරිසරික පනතෙහි අර්ථ දැක්වීම

පරිසර හිතකාමී ලෙස අපද්‍රව්‍ය කළමනාකරණය යනු අපද්‍රව්‍ය නිසා මිනිස් සෞඛ්‍යයට හා පරිසරයට සිදුවිය හැකි අහිතකර බලපෑම්වලින් ආරක්ෂා වන අයුරින් අපද්‍රව්‍ය කළමනාකරණය කෙරෙන බවට සහතික කිරීම සඳහා සියලු ප්‍රායෝගික පියවරයන් ගනු ලැබීමය.

ජීවන චක්‍ර කළමනාකරණය මඟින් ජීවන චක්‍රය සහ අගය දාමය පුරා නිෂ්පාදනය හෝ නිෂ්පාදන කාර්යය ආශ්‍රිතව ඇති වන පාරිසරික හා සමාජ-ආර්ථික ආතතීන් අවම කිරීම අරමුණු කෙරේ.

නිෂ්පාදන හෝ නිෂ්පාදන ක්‍රියාවලිය ආශ්‍රිත ඇතිවන පාරිසරික හා සමාජ - ආර්ථික ආතතීන් අවම කිරීමේ අරමුණින් නිෂ්පාදන ක්‍රියාවලිය කළමනාකරණය කිරීම.

සුදුසු තාක්ෂණය යනු අවශ්‍යතාව සපුරාලීම සඳහා සේවය සැපයෙන පිරිසට හොඳින්ම ගැලපෙන තාක්ෂණය වේ.

"දූෂකයා විසින් ගෙවනු ලැබීම" යනු පරිසර දූෂණය කරන පුද්ගලයන් එමගින් මානව සෞඛ්‍යයට හෝ පරිසරයට සිදුවන හානිය වැළැක්වීම සඳහා එය කළමනාකරණ කිරීමේ පිරිවැය දැරිය යුතු බවට වන පොදුවේ පිළිගැනෙන පරිවයයි.

නිෂ්පාදකයාගේ විස්තීර්ණ වූ වගකීම යනු යම් නිෂ්පාදනයක් එම නිෂ්පාදනයේ ජීවන චක්‍රයේ පශ්චාත් පාරිභෝගික අවධිය දක්වා නිෂ්පාදකයාගේ වගකීම විස්තීර්ණ වන්නා වූ පාරිසරික ප්‍රතිපත්ති ප්‍රවේශයයි.

සාකල්‍ය සමෝධානිත අපද්‍රව්‍ය කළමනාකරණය යනු අපද්‍රව්‍ය කළමනාකරණයේදී විවිධ අපද්‍රව්‍ය ආකාර සමග අන්තර් සම්බන්ධතා ඇතුළත් වන්නා වූ සමෝධානිතව සිදුකරන අපද්‍රව්‍ය කළමනාකරණය වේ.

ප්‍රීතිමත් පවුලක් යනු විශ්වසනීය තෘප්තිය සහිත පවුලෙහි සතුට වේ. (දූෂණය අවම පරිසරයක ජීවත් වන පවුලක්)

ජී. පී. එස්. පද්ධති යනු ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධති හෙවත් යම් කිසි ස්ථානයක පිහිටීම නිශ්චිත ලෙස දක්වන තොරතුරු පද්ධති වේ.